# දෙසතිය

පුවත් සඟරාව

2024 සැප්තැම්බර්

# 2024 PRESIDENTIAL ELECTION



## කතිරයේ බලය

# ඊශ්‍රායලයේ විරෝධතා



ගාසා තීරයේදී මිය ගිය ඊශ්‍රායල ප්‍රාණ ඇපකරුවන් 06 දෙනකුගේ සිරුරු සැප්තැම්බර් 01 දින ඊශ්‍රායල හමුදා සොයා ගැනීමත් සමග එරට ජනතාව ඉමහත් කෝපයට පත් වී සිටිති. මහජන විරෝධතා උත්සන්න වීමත් සමග ඊශ්‍රායලයේ විශාලතම වෘත්තීය සමිති සම්මේලනය වන Histadrut සටන් විරාම ගිවිසුමක් ඉල්ලා මහා වැඩවර්ජනයක් ද කැඳවා තිබේ.

විරෝධතාකරුවන් එරට අගනුවර වන ටෙල්අවිව් (Telaviv) මාර්ග අවහිර කර ඇති අතර බටහිර ජෙරුසලමේ ඊශ්‍රායල අගමැති බෙන්ජමින් නෙතන්යාහුගේ කාර්යාලය ඉදිරිපිට ද විරෝධතා ආරම්භ කර ඇත. මෙම විරෝධතා සඳහා එරට ව්‍යාපාරිකයන්ගේ මෙන් ම නිෂ්පාදකයන්ගේ ද සහය ලැබී තිබේ.

විරෝධතාකරුවන් ඊශ්‍රායල අගමැතිවරයාගෙන් ඉල්ලා සිටින්නේ ඉතිරි ප්‍රාණඇපකරුවන් බේරාගැනීම සඳහා පලස්තීන හමාස් සංවිධානය සමග වහා ම සටන් විරාම ගිවිසුමකට එළඹෙන ලෙසයි. නෙතන්යාහුට සටන් විරාම ගිවිසුමකට එළඹීමට නොහැකිවීම ඔහුගේ දුර්වලතාවක් මෙන් ම ඒකාධිපතිත්වය පෙන්වීමක් ලෙස විරෝධාකරුවෝ චෝදනා කරති.

**ඩබ්ලිව්. එම්. ශාන්තප්‍රිය**

# දෙසතිය
පුවත් සඟරාව


වෙළුම 46, කලාපය 09,
2024 සැප්තැම්බර්

**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව,**
163, කිරුළපන ඇවනිව්,
පොල්හේන්ගොඩ, කොළඹ 05.

**සංස්කාරක මණ්ඩලය**
දු. අ. 011 - 2513757 / 0112 - 513153
Email - desathiya@gmail.com
බෙදහැරීමේ අංශය
දු. අ. 011 - 2514150



උපදේශක සංස්කාරක
**දිනිත් චින්තක කරුණාරත්න**
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්

අංශ ප්‍රධානී - දෙසතිය
**ඩබ්. එම්. ශාන්තප්‍රිය**

සංස්කාරක
**මාලා මල්කාන්ති පරණගමගේ**

රූ රටා සංස්කාරක
**සංජීව පෙත්තාවඩු**

විශේෂාංග ලේඛක
**රංගිකා අබේසේකර**

ඡායාරූප
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ඡායාරූප අංශය**

බෙදාහැරීම් සම්බන්ධීකරණය
**ඉරේෂා අබේනායක**

මුද්‍රණය
**රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව**

ප්‍රකාශනය හා බෙදහැරීම
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව**



**හිතවත් පාඨකයිනි,**

46 වසරක් ඔබ වෙත දැනුම ලබාදුන් 'දෙසතිය' පුවත් සඟරාව වෙත පාඨක ඔබගේ අදහස් කෙටියෙන් ලියා තැපැල් ලිපිනයට හෝ විද්‍යුත් තැපැල් ලිපිනයට හෝ යොමු කරන්න

**සංස්කාරක**


මෙහි පළ වන ඇතැම් ඡායාරූප අන්තර්ජාලයෙන් ලබාගත් ඒවා වන අතර ඒවායේ අයිතිය මුල් හිමිකරු සතු යි.


## කවරයේ කතාව





18 කතිරයේ බලය



14 අඟහරු මත ජලාශයක්



03 සුහුරු ප්‍රවේශපතට ප්‍රවේශයක්



35 යා දෙක නොරත රත




05 ළමා වින්දිතයන් කබළෙන් ළිපට හෙළීම



40 අමරණීය පැරිස් මතක

# කතිරය

ජනාධිපතිවරණ ඉතිහාසයට එක් වන මෙරට නව වැනි ජනාධිපතිවරණය එළඹෙන සැප්තැම්බර් මස 21 දින පැවැත්වෙනු ඇත්තේ ශ්‍රී ලංකාවේ නව වැනි විධායක ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීමට ය. ඒ සඳහා මෙවර දේශපාලන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම් නියෝජනය කරමින් ඡන්ද අපේක්ෂකයෝ 39 දෙනෙක් ඉදිරිපත් ව සිටියත් ඒ සඳහා නාම යෝජනා බාර දුන් මොහොඞ් ඉල්ලියාස් හදිසි හෘදයාබාධයකින් මිය ගිය නිසා ජනාධිපතිවරණයට තරග කරන ඡන්ද අපේක්ෂක සංඛ්‍යාව 38කි. දේශපාලන පරිචය සහිත අපේක්ෂකයන් රැසක් තරග වදින මෙවර ජනාධිපතිවරණයට ඡන්දදායකයෝ 17,140,354ක් ඡන්දය පාවිච්චි කිරීමට සුදුසුකම් සපුරා සිටිති.

ඍජු මහජන ඡන්දයෙන් තේරී පත් වන නව ජනාධිපතිවරයා 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වැනි සංශෝධනය අනුව වසර 5කට බලයට පත් වන බැවින් 2029 දක්වා එම ධුරය හෙබවීමට සුදුසුකම් සපුරනු ඇත. ව්‍යවස්ථානුකූල ව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පරමාධිපත්‍ය බලය ජනතාව සතු වන බැවින් ජනාධිපතිවරණයේ තීරණාත්මක සාධකය වන්නේ ජනතා ඡන්දයයි.

රටේ පාලනය පිළිබඳ නිවැරදි තීන්දු ගැනීමට පාලකයා තෝරා ගැනීම පුරවැසි අයිතියකි. ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක අත්‍යවශ්‍ය අංගයක් වන ඡන්දය ලබා දීමෙන් සිය අයිතිවාසිකම භුක්ති විඳීමට පුරවැසියාට දූන් අවස්ථාව එළඹ තිබේ. එහිදී ඡන්දදායක වගකීම වන්නේ රාජ්‍ය නායකයාගෙන් අපේක්ෂා කරන භූමිකාව නිවැරදි අවබෝධයෙන් ඉටු කළ හැකි අපේක්ෂකයකු ජනාධිපතිවරයා ලෙස තෝරා පත් කර ගැනීම ය.

පොදුවේ ඡන්දදායකයාට ඡන්ද අපේක්ෂකයන් පිළිබඳ මතයක් ඇත. එය ඇතැම් විට දීර්ඝකාලීන ව ගොඩනැගී ඇති අතර තවමත් ඔවුන් පිළිබඳ නිශ්චිත තීරණවලට එළඹ නැති ඡන්දදායකයන් ද වේ. ඕනෑ ම මැතිවරණයකදී මෙන් ම මෙවර ජනාධිපතිවරණයේදී ද එම පිරිසගේ ඡන්දය තීරණාත්මක සාධකය විය හැකි ය. එසේ ම ඇතැම් ඡන්දදායකයෝ ඡන්දය පාවිච්චි කිරීමෙන් වැළකී සිටිති. ක්‍රමය ප්‍රශ්න කිරීමේ සහ තමන් එයට විරෝධය පෑමේ ක්‍රමවේදයක් ලෙස යොදා ගත්තත් එය යහපත් ප්‍රවණතාවක් නොවේ. බොහෝ විට ඡන්ද අපේක්ෂකයන් පිළිබඳ මතවාද නිර්මාණය කරන, ජනමතය හැඩගස්වන මාධ්‍ය හැසිරීම මැතිවරණ සමයේදී කැපී පෙනේ. මාධ්‍ය හිමිකාරිත්වය මත මෙන් ම සමාජ මාධ්‍ය ඔස්සේ සිදු වන ප්‍රතිරූප ගොඩනැගීම සහ විනාශ කිරීම එහිදී බහුල ව සිදු වේ.

මේ නිසා ඡන්දදායකයන්ගේ වගකීම විය යුත්තේ රටේ කෙටිකාලීන හා දිගුකාලීන පැවැත්මේ අවශ්‍යතාව මත ක්‍රියාකිරීමට හැකියාව ඇති ජනාධිපතිවරයකු තෝරා පත් කර ගැනීමට බුද්ධිමත් තීරණයක් ගැනීම ය. ඒ සඳහා විවිධ වේදිකා ඔස්සේ අපේක්ෂකයන් දක්වන අදහස් ද විමසුම් ව බලමින්, රටේ පවතින සමාජ, ආර්ථික හා දේශපාලන වාතාවරණය ද සැලකිල්ලට ගනිමින් විශ්ලේෂණාත්මක ව සිතාතීන්දුවක් ගැනීමට ඔවුන්ට අයිතිය තිබේ. එවිට ජනතා පරමාධිපත්‍යයට සාධාරණත්වය ඉටු කළ හැකි ජනාධිපතිවරයකු පත් කර ගත හැකි වනු ඇත.

- සංස්කාරක -


**දෙසතිය**
පුවත් සඟරාව

**ඔබ ළඟට ම ගෙන්වා ගන්න. පහත කූපනය පුරවා අප වෙත එවන්න.**

**දෙසතිය** සඟරා දායකත්වය

දෙසතිය සඟරා දායකත්වය වාර්ෂික / අර්ධ වාර්ෂික ලාබා ගැනීමට කැමැත්තෙමි. ඒ සඳහා රු. 3,000.00/ රු. 1,500.00 වටිනාකමකින් යුත් අංකය........................................ හා ..................................... දින දරන චෙක්පත / මුදල් ඇණවුම එවමි.

චෙක්පත්/ මුදල් ඇණවුම් ''ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්'' නමට ලියා, තැපැල් කාර්යාලය, කම්කරු මහ ලේකම් කාර්යාලය, නාරාහේන්පිට ලෙස සඳහන් කර කූපනයද පුරවා මෙම ලිපිනයට එවන්න.

දෙසතිය, බෙදාහැරීම් කළමනාකරු, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, 163, පොල්හේන්ගොඩ, කොළඹ 05

**දෙසතිය**

සඟරා ලැබිය යුතු නම හා ලිපිනය (ඉංග්‍රීසි භාෂාවෙන්)

Name .....................................................................................................
Address .....................................................................................................
.....................................................................................................
.....................................................................................................
.....................................................................................................
ID Number ............................................Tel / Mobile .........................................
Signature ............................................ Date...................................................




# සුහුරු ප්‍රවේශපත්‍රම ප්‍රවේශයක්

**රංගිකා අබේසේකර**

18 වැනි ශතවර්ෂය තෙක් දීර්ඝ ඉතිහාසයකට හිමිකම් කියන ශ්‍රී ලංකා දුම්රිය සේවය, ඉතිහාසගත කාලෝචිත වෙනසකට මුලපුරා තිබේ. ඒ, ශ්‍රී ලංකාවේ ඕනෑ ම ස්ථානයක සිට පහසුවෙන් ඩිජිටල් මාධ්‍යයෙන් දුම්රිය ප්‍රවේශපත් මිලදී ගැනීමට www.pravesha.lk වෙබ් අඩවිය හඳුන්වා දීමත් සමගිනි.

දුම්රිය මගීන්ට පහසුවෙන් හා කාර්යක්ෂම ව ප්‍රවේශපතක් මිල දී ගැනීමට හා දුම්රිය කාර්යමණ්ඩලයේ කාර්ය පහසු කරමින් මෙලෙස ඩිජිටල් දුම්රිය ප්‍රවේශපත්‍ර ක්‍රමවේදයක් හඳුන්වාදීම සිදු කෙරුණේ ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ මගපෙන්වීමෙන් හා ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ මෙහෙයවීමෙනි. ආසියානු සංවර්ධන බැංකු ණය ආධාර යටතේ ක්‍රියාත්මක දුම්රිය කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ එක් උප ව්‍යාපෘතියක් වන මෙම සුහුරු ප්‍රවේශපත්‍ර (Smart Tickets) නිකුත් කිරීමේ ව්‍යාපෘතිය සඳහා ඩොලර් මිලියන 19.2ක් ආයෝජනය කර ඇත.

මහජන චීන සමූහාණ්ඩුවේ Whale Cloud Technology Company Ltd හා Beijing Jingwei Information Technologies Company යන ආයතන සහ Softlogic Information Systems (Pvt) Ltd යන දේශීය ආයතනය එක් ව ශ්‍රී ලංකා දුම්රිය සේවයේ අවශ්‍යතාවලට ගැළපෙන පරිදි මෙම මෘදුකාංගය නිර්මාණය කර ඇත. එහි ප්‍රථම අදියරේ එළිදැක්වීම ලෙස මෙම වෙබ් අඩවිය මගී ජනතාව වෙත විවෘත කළ බව මෙම ව්‍යාපෘතියේ අධ්‍යක්ෂ උපාලි මල්ලවාරච්චි ප්‍රකාශ කරයි.

ඩිජිටල් ක්‍රමවේදය හඳුන්වාදීමෙන් ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය අපේක්ෂා කරන්නේ ශ්‍රී ලංකා දුම්රිය සේවයට සහ එම දුම්රිය සේවාව භාවිතයට ගන්නා සංචාරක මගීන් සඳහා ප්‍රතිලාභ රැසක් අත්කර දීමට ය. එමගින් දේශීය සහ විදේශීය සංචාරකයන්ට මෙන් ම සාමාන්‍ය මගී ජනතාවට වඩාත් කාර්යක්ෂම දුම්රිය සේවාවක් සැපයීමට යහපත් ආරම්භයක් සපයා ගත හැකි අතර එය රටේ ආර්ථිකයට ශක්තියක් කර දීම දුම්රිය දෙපාර්තමේන්තුවේ අභිප්‍රාය වේ. ඒ ඔස්සේ දුම්රිය මගීන්ට තවදුරටත් දිගු පෝලිම්වල රැඳී සිටීමට අවශ්‍ය නොවන අතර ගමන් කිරීමට අපේක්ෂිත දිනයට පෙර නිවසේ සිට හෝ කාර්යාලයේ සිට හෝ ප්‍රවේශපත්‍රය මිල දී ගැනීමට හැකියාව ලැබේ.

ව්‍යාපෘතිය පිළිබඳ අදහස් දක්වන ව්‍යාපෘති අධ්‍යක්ෂ උපාලි මල්ලිකාරච්චි; "මේ ඩිජිටල් ව්‍යාපෘතිය සඳහා අවතීර්ණ වීමට ප්‍රධාන හේතුව වන්නේ දුම්රිය භාවිත කරන මගී ජනතාව විශාල කාලයක් පෝලිම්වල රැඳී සිටිමින් ප්‍රවේශපත් මිල දී ගැනීම වැළැක්වීමටත් දුම්රිය භාවිතයට ජනතාව නැඹුරු කිරීමෙන් කොළඹ නගරය ආශ්‍රිත ව පවතින අධික තදබදය වැළැක්වීමටත් විසඳුමක් වශයෙන්. එහි එක් අංශයක් ලෙසයි සුහුරු ප්‍රවේශපත්‍ර ලබාදීම ආරම්භ කළේ. දුම්රිය මුද්‍රිත ප්‍රවේශපත්‍ර සඳහා කාඩ්බෝඩ් ආනයනය කළේ නෙදර්ලන්තයේ Wensin Bv. Holland සමාගමෙන්. ඒ සඳහා වාර්ෂික ව වැයවන මුදල දළ වශයෙන් මිලියන 120ක්. 2018 වසරේදී එම සමාගම දැනුවත් කළේ කාඩ්බෝඩ් නිෂ්පාදනය නවතන බව. ඩිජිටල් ප්‍රවේශපත්‍රය හඳුන්වාදීමට එය ද තවත් හේතුවක්."

මෙම ව්‍යාපෘතියේ පළමු අදියරේදී ප්‍රධාන ලෙස අවධානය යොමු කරන්නේ දෛනික ව දුම්රියේ ගමන් කිරීමට ප්‍රවේශපත්‍ර මිල දී ගන්නා මගීන් කෙරෙහි ය. මෙහිදී දුම්රිය ධාවනය වන ඕනෑ ම දුම්රිය ස්ථාන දෙකක් අතර දෙවැනි සහ තුන් වැනි පන්තියේ ප්‍රවේශපත්‍ර පමණක් නිකුත් කෙරේ. ඒ අනුව www.pravesha.lk වෙබ් අඩවියට පිවිස දුරකතන අංකය හෝ විද්‍යුත් තැපැල් ලිපිනය, ගමනාරම්භය, ගමනාන්තය, දුම්රිය පන්තිය, ගමනාරම්භක දිනය මෙන් ම අවශ්‍ය ප්‍රවේශපත්‍ර ගණන නිවැරදි ලෙස ඇතුළත් කිරීමෙන් ඩිජිටල් දුම්රිය ප්‍රවේශපත්‍ර ලබා ගැනීමට ඕනෑ ම අයකුට අවස්ථාව හිමි වේ. එහිදී එක් අයකුට වරකට ලබාගත හැකි උපරිම ප්‍රවේශපත්‍ර ගණන 5කි.

ඩිජිටල් දුම්රිය ප්‍රවේශපත්‍ර ගාස්තු ගෙවීම බැංකු කාඩ්පත්වලින් (Debit සහ Credit Card) සිදු කළ හැකි අතර නුදුරේදී ම තවත් මාර්ගගත ගෙවීම් මාධ්‍ය (Online Payments) හඳුන්වා දීමට නියමිත ව ඇත. ඒ සඳහා ප්‍රවේශපත්‍ර ගාස්තුව හැර වෙනත් කිසිදු අමතර සේවා ගාස්තුවක් අය නොකෙරේ. ඉල්ලුම්කරු ලබාදුන් නිශ්චිත දුරකතන අංකයට හෝ විද්‍යුත් තැපැල් ලිපිනයට ලැබෙන සබැඳිය (link) ඔස්සේ ඩිජිටල් ප්‍රවේශපත්‍රයේ QR කේතය දුම්රිය ස්ථානයේ නිලධාරීන්ට ඉදිරිපත් කළ යුතු ය. එවිට දුම්රිය නිලධාරීහු විශේෂ උපකරණයක ආධාරයෙන් QR කේතය පරිලෝකනය (Scan) කිරීමෙන් ප්‍රවේශපත්‍රයේ වලංගුභාවය තහවුරු කරති. මෙම ක්‍රමවේදයේදී ගමන් කිරීමට අපේක්ෂා කරන දිනට, දින 7කට පෙර සිට ම ප්‍රවේශපත්‍ර ඉල්ලුම් කළ හැකි ය. එහෙත් වෙන් කළ ආසන ප්‍රවේශපත්‍ර (Reservation Tickets) ලබා ගත නොහැකි ය. මෙම ප්‍රවේශපත්‍රය වලංගු වන්නේ ගමන් කරන දිනයට පමණි. එමෙන් ම කලින් මිල දී ගන්නා ටිකට්පතක් ගමන් කරන දිනයට පෙර අවශ්‍ය නම් අවලංගු කර එහි වටිනාකමින් 70%ක් ආපසු ලබා ගත හැකි ය.



මුද්‍රිත ප්‍රවේශපත්‍ර සඳහා වන විශේෂිත කඩදාසි මිල දී ගැනීම, ගබඩා කිරීම, මුද්‍රණය හා බෙදා හැරීම වැනි පරිපාලන ක්‍රියාවලියෙන් බොහෝ රටවල් මේ වන විටත් ඉවත් වී ඇත. ඒ වෙනුවට තාක්ෂණික ක්‍රමවේද සහ යටිතල පහසුකම් සහිත දුම්රිය සේවා බොහෝ රටවල ක්‍රියාත්මක කරයි. එයට ප්‍රවේශයක් වශයෙන් ශ්‍රී ලංකාව ද ප්‍රමාද වී හෝ QR කේතය මත පදනම් වූ සුහුරු ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම ඔස්සේ දුම්රිය සේවයේ නව හැරවුමක් සනිටුහන් කර ඇත.

ඉදිරියේදී මෙම ව්‍යාපෘතිය තවත් මාධ්‍ය කිහිපයක් ඔස්සේ ප්‍රවේශපත් මිල දී ගත හැකි පරිදි ආසන වෙන් කර ගැනීමට පහසුකම් සැලසෙන බවත් ස්වයංක්‍රීය ගේට්ටුවලින් වලංගුභාවය පරීක්ෂා කිරීම ඇතුළු ව අන්තර්ජාතික ප්‍රමිතියකින් යුක්ත ව්‍යාපෘතියක් ලෙසත් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත බව ව්‍යාපෘති අධ්‍යක්ෂ උපාලි මල්ලවාරච්චි ප්‍රකාශ කරයි.

මෙම නව ක්‍රමවේදය පිළිබඳ අදහස් දක්වන දුම්රිය සාමාන්‍යාධිකාරී එස්. එස් මුදලිගේ; “වසර 160ක දුම්රිය සේවා ඉතිහාසයේ පැවතියේ මුද්‍රිත ප්‍රවේශපත්‍ර ක්‍රමයක්. නගර අතර දුම්රිය ගමන්වාරවල සහ සාමාන්‍ය දුම්රිය ගමන්වාරවල ප්‍රවේශපත්‍ර ලබාගැනීමේ ක්‍රමවේදයේ කාර්යක්ෂමතාව සහ සාමාන්‍ය ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් ගැටලු ගණනාවක් දක්නට ලැබුණා. දෛනික ව නිකුත් කරන ටිකට්පත් සංඛ්‍යාව දළ වශයෙන් 250,000ක්. ඒ අනුව පළමු අදියර ලෙස දීප ව්‍යාප්ත ව ඩිජිටල් ප්‍රවේශපත්‍ර ලබාදීමේ ක්‍රමවේදය ස්ථාපිත කළා. මෙය සැලසුම් කළේ වසර 10ක සිට. මේ ක්‍රමවේදය නිසා මුද්‍රිත ප්‍රවේශපත්‍ර සඳහා වාර්ෂික ව වැය වන මුදල අඩු කර ගැනීමට හැකියාව තිබෙනවා. මෙහි දෙවැනි අදියර දෙසැම්බර් මාසය වන විට අවසන් කිරීමටයි නියමිත.”

ව්‍යාපෘති අධ්‍යක්ෂ උපාලි මල්ලිකාරච්චි පවසන්නේ ඩිජිටල් ප්‍රවේශපත්‍ර ලබාදීමේ ක්‍රියාවලිය මෙරටට නව අත්දැකීමක් නිසා ක්‍රියාත්මක කර පවත්වාගෙන යාමේ අභියෝග ද පවතින බවයි. ඔහු; “මෙය නව ව්‍යාපෘතියක් නිසා එයට සේවකයන් අභිප්‍රේරණය කරගැනීමත් ඔවුන්ගෙන් උපරිම සේවය ලබාගැනීමත් අභියෝගයක්. මේ නිසා දුම්රිය සේවකයන්ට ව්‍යාපෘතිය සම්බන්ධයෙන් නිරතුරු ව මනා පුහුණුවක් සහ සහයෝගයක් ලබා දෙනවා. නියමිත කාලයේ ව්‍යාපෘතිය අවසන් කිරීමත් විශාල අභියෝගයක්. මෙහි ඇති තාක්ෂණික කාරණා සපුරා ගැනීම ශ්‍රී ලංකාවට නව අත්දැකීමක් වීමයි එයට හේතුව. මෙය ක්‍රියාත්මක කිරීමේදී මුල් කාලයේ යම් යම් අඩුපාඩු සිදු වන්නට පුළුවන්‘.”

මේ වන විට ප්‍රවේශපත්‍රය නිකුත් කරන්නේ වෙබ් අඩවියෙන් පමණක් වුවත් ඉදිරියේදී ජංගම යෙදවුමක් (App) මේ සඳහා හඳුන්වා දීමට පියවර ගැනේ. එමෙන් ම ඉදිරියේදී දුම්රිය ස්ථාන කවුළුවලින් ද සුහුරු ප්‍රවේශපත්‍ර නිකුත් කෙරේ. එයට අමතර ව ප්‍රවේශපත්‍ර ලබා ගත හැකි ස්වයංක්‍රීය යන්ත්‍ර සවිකිරීමත් ප්‍රවාහන කාඩ්පතක් (Transport Card) නිකුත් කිරීමත් සුපිරි වෙළෙඳසැල්වලින් ප්‍රවේශපත්‍ර නිකුත් කළ හැකි පරිදි සම්බන්ධතාව ගොඩනැගීමත් ව්‍යාපෘතියේ ඉදිරි යෝජනා වේ.

දුම්රිය ප්‍රවේශපත්‍ර නිකුත් කළ සංඛ්‍යාව, ගමනාරම්භක ස්ථානය, ගමනාන්තය සහ දෛනික ආදායම එසැණින් බලාගැනීමේ හැකියාව මෙම නවතම ක්‍රමවේදයෙන් ලැබේ. එමගින් මගී ජනතාවගේ අවශ්‍යතාව මත පදනම් ව දුම්රිය සේවාව කාර්යක්ෂම ව සම්ප්‍රේෂණය කිරීමේ හැකියාව ලැබීම, ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම් සංඛ්‍යාව ස්වයංක්‍රීය ව ගණනය කළ හැකි වීම, වාර්තා සැකසීමට අමතර කාලයක් සහ ශ්‍රමයක් වැය නොවීම සහ ලිපිද්‍රව්‍ය, ලෙජර් පොත් සටහන් සඳහා වන වැයවීම් අවම කර ගැනීමට හැකි වීම නිසා මෙම නව ඩිජිටල් පියවර දුම්රිය සේවාව නව මගකට යොමු කරනු ඇත.

# ළමා වින්දිතයන් කබලෙන් ළිපට හෙළීම




**නුවන් කුමාර කටුගම්පල**

ළමා අපයෝජනය සහ ළමා හිංසනය (Child Abuse and Child Harassment) යනු නිතර පුවත් මවන මාතෘකා ය. මෙම සෑම මාතෘකාවක ම ප්‍රධාන පාත්‍රවර්ගයා වන්නේ ළමයෙකි. මෙවැනි සිද්ධි පිළිබඳ වාර්තාකරණයේදී මාධ්‍ය ආයතන සහ මාධ්‍යවේදීන් පූර්ණ නිදහස භාවිත කිරීමෙන් එම ළමයා යළි යළිත් අපයෝජනයට සහ හිංසනයට නතු වන බව අවබෝධාත්මක ව සිය මාධ්‍ය මෙහෙවරේ නියැළෙන්නේ අල්ප පිරිසකි. සාම්ප්‍රදායික මාධ්‍යවල (Traditional Media) සිට නව සමාජ මාධ්‍ය (New Social Media) දක්වා වෙනස් වූ සහ පුළුල් වූ නූතන මාධ්‍ය භාවිතාව සිදු විය යුත්තේ හිංසනයට ගොදුරු වූ ළමයා තවදුරටත් පීඩාවට ලක් නොවන ආකාරයට ය.

'ළමා අපයෝජනය' යනු යම් පුද්ගලයකුගේ හෝ පිරිසකගේ නොසලකාහැරීමක් නිසා කායික හෝ මානසික වශයෙන් ළමයින්ට එරෙහි යමකට අයුතු ආකාරයෙන් ළමයා යොදවා ගැනීමකි. 'ළමා අපචාර' යනු ළමයා විසින් කරන සදාචාර විරෝධී සහ නීති විරෝධී වැරදි ක්‍රියා ය. ඒ අනුව ළමයාට එරෙහි වැරදි ළමා අපයෝජන වන අතර ළමයා විසින් කරන වැරදි ළමා අපචාර වේ. මෙබඳු වාච්‍යාර්ථ තේරුම් නොගෙන මාධ්‍ය වාර්තා පළ කිරීම නිසා ද වැරදි කරුණු සමාජගත වී ළමා වින්දිතයා තවදුරටත් අපහසුතාවට පත් වේ.

'ළමයා' යනු වැඩිහිටියන්ගේ හෝ භාරකරුවන්ගේ මගපෙන්වීම සහ ආරක්ෂාව යටතේ සිටිය යුතු කායික සහ මානසික වශයෙන් නොමේරූ අය වේ. ඒ අනුව ළමා වින්දිතයන් මෙන් ම

**'ළමයා' යනු වැඩිහිටියන්ගේ හෝ භාරකරුවන්ගේ මගපෙන්වීම සහ ආරක්ෂාව යටතේ සිටිය යුතු කායික සහ මානසික වශයෙන් නොමේරූ අය වේ.**

ළමා සැකකරුවන් පිළිබඳ මාධ්‍ය වාර්තාකරණයේදී සහකම්පනයෙන් (Empathy) යුතු ව සිදු කිරීම සියලු ජනමාධ්‍යවේදීන්ගේ වගකීමකි.

මානසික, කායික, සහ ලිංගික හිංසනය වශයෙන් ළමයින් අපයෝජනයට ලක්වන ආකාර කිහිපයකි. බරපතල ලිංගික අපයෝජනය සහ සුළු ලිංගික අපයෝජනය යනුවෙන් ලිංගික අපයෝජනය ප්‍රභේද වේ. බරපතල ලිංගික අපයෝජනය යන්නට වයස අවුරුදු 16ට වඩා අඩු ළමයින්ගේ කැමැත්ත ඇති ව හෝ නැති ව වුව ද ඔවුන්ගේ ශරීරයේ කොටසක් භාවිත කොට ලිංගික තෘප්තිය ලබා ගැනීම හෝ දූෂණයක් සිදු කිරීම අදහස් වන අතර දණ්ඩනීති සංග්‍රහයේ 365 (අ) වගන්තිය අනුව එවැනි අපයෝජන සඳහා අවුරුදු 15ක් දක්වා සිර දඬුවම් නියම කළ හැකි ය. ළමයින්ගේ ශරීරය අනවශ්‍ය ලෙස ස්පර්ශ කිරීම, සිපවැළඳ ගැනීම, ඔවුන් විෂයෙහි ලිංගික වක්‍රෝත්ති භාවිත කිරීම, ඔවුන්ට අසභ්‍ය වීඩියෝ දර්ශන ආදිය පෙන්වීම දණ්ඩනීති සංග්‍රහයේ 345 වැනි වගන්තිය යටතේ අවුරුදු 05ක් දක්වා සිර දඬුවම් ලබා දිය හැකි වැරදි වේ. වයස අවුරුදු 18ට වඩා අඩු ළමයින්ගේ නිරුවත් පිංතූර හෝ වීඩියෝ දර්ශන ළඟ තබා ගැනීම පවා අපරාධ වරදක් වන අතර ඒවා බෙදා හැරීම, හුවමාරු කිරීම, ඒවාට පෙනී සිටින ලෙස බලකිරීම හෝ පොළඹවා ගැනිම දණ්ඩනීති සංග්‍රහයේ 286 වැනි වගන්තිය අනුව අවුරුදු 10ක් දක්වා සිර දඬුවම් ලබා දිය හැකි අපරාධ වැරදි වේ. වින්දිතයාගේ අනන්‍යතාව හෙළිදරව් වන යම් පළකිරීමක් මුද්‍රිත ව හෝ විද්‍යුත් ව ප්‍රධාන මාධ්‍යයේ හෝ සමාජ මාධ්‍යයේ පළකරන කවර හෝ තැනැත්තකුට දණ්ඩනීති සංග්‍රහයේ 365

(ඇ) වගන්තිය අනුව නීතිය ක්‍රියාත්මක කොට වසර දෙකක් දක්වා සිර දඬුවම් ලබා දිය හැකි ය.

ජාතික ළමාරක්ෂණ අධිකාරිය වෙත මසකට පැමිණිලි 600-1000ත් අතර සංඛ්‍යාවක් ලැබේ. ඒ අතරින් වැඩි සංඛ්‍යාවක් ළමයින්ගේ භාරය සහ ආරක්ෂාව දරන අය වෙතින් ශාරීරික ව සහ මානසික ව හිංසනයට ලක් කිරීම සහ දෙමාපිය ආරාවුල් හේතුවෙන් ළමයින්ගේ භාරය සහ ආරක්ෂාව පිළිබඳ පැන නැගෙන ගැටලු පිළිබඳ පැමිණිලි ය. 2024 ජුනි මස 30 දින වන විට භාරය සහ ආරක්ෂාව පිළිබඳ ගැටලු 1187ක් ද ශාරීරික වධහිංසනවලට ලක්කිරීම් පිළිබඳ ගැටලු 907ක් ද සුළු ලිංගික හිරිහැර 261ක් ද බරපතල ලිංගික අපයෝජන 146ක් ද ළමයින් පාසල් නොයැවීම් සම්බන්ධ ගැටලු 704ක් ද වාර්තා වී ඇත.

එසේ වාර්තා නොවන ළමා අපයෝජන සංඛ්‍යාවක් ද සමාජයේ තිබිය හැකි ය. එසේ වන්නේ පැමිණිලි කිරීම සඳහා නීති බලාත්මක කිරීමේ ආයතන වෙත යාමට ඇති නොකැමැත්ත, පවුල හෝ පාසල අපකීර්තියට පත් වේ යැයි සිතා සඟවාගෙන සිටීම, ලැජ්ජාව, නොදැනුවත්කම සහ වෙනත් සංස්කෘතිකමය හේතු නිසා කරබාගෙන සිටීම යනාදියයි. සමාජයේ බලවත් හෝ පිළිගත් පුද්ගලයන් වෙතින් ළමා අපයෝජන හෝ හිංසන සිදු වූ විට අපරාධයේ සැකකරුට පක්ෂ ව සමාජ රැල්ලක් ඇතිවී වින්දිතයාට ම වරද පටවන (Victim Blaming) අවස්ථා ද බොහෝ ය. එවිට ළමයා සමාජ කණ්ඩායම් අතර දැඩි අසරණභාවයකට පත් වේ. මේ නිසා ළමා අපයෝජන සම්බන්ධයෙන් නීති ක්‍රියාත්මක කිරීමේ දී පවතින සමාජමය සහ සංස්කෘතිකමය බාධා පිළිබඳ කතිකාවක් ඇති කිරීම ජනමාධ්‍යයේ වගකීමකි.

“ළමා අපයෝජන යටපත්වීම වළක්වාලීමේ අරමුණින් ළමාරක්ෂණ අධිකාරිය නිර්නාමික පැමිණිලි පවා භාර ගන්නවා. පැය 24 ම ක්‍රියාත්මක කෙරෙන අධිකාරියේ ළමා උපකාරක සේවයේ දුරකතන අංකය (Hot Line) වන 1929 වෙත බොරු පැමිණිලි සිදු කරන අවස්ථා ද තිබෙනවා. ළමයින් වෙනුවෙන් පවතින මෙවැනි සේවා අවභාවිත නොකරන ලෙස මහජනතාවගෙන් ඉල්ලා සිටිනවා.’ මෙසේ පවසන්නේ ජාතික ළමාරක්ෂණ අධිකාරියේ අධ්‍යක්ෂ (නීති බලාත්මක කිරීම්) සජීවනී අබේකෝන් ය.

තමාට සිදු වූ අපයෝජනය සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනීමට ඉදිරිපත් වීමේදී ප්‍රශ්න කිරීම් ඉදිරියේ සිද්ධි විස්තර කිරීම, වෛද්‍ය පරීක්ෂණ සඳහා ලිංගික ප්‍රදේශ ප්‍රදර්ශනය කිරීම, විත්තියේ හරස් ප්‍රශ්න ඉදිරියේ සිද්ධිය සිදු වූ ආකාරය ප්‍රකාශ කිරීම වැනි දුෂ්කර අවස්ථාවලට මුහුණදීමට ළමයාට සිදු වේ. එහි දී ළමයා ඇතැම් සාක්ෂි වසන් කිරීම සහ පරස්පරතා සහ ඌනතා සහිත සාක්ෂි ලබා දීම නිසා සැකකරුට වාසිසහගත තත්ත්ව උදා වේ. ළමයාගේ සමීපතම වැඩිහිටියන් සිය බලය පෙන්වමින් ශාරීරික සහ මානසික දඬුවම්වලට ලක්කර ළමයා හික්මවීමට යාමෙන් අහිතකර, වේදනාකාරී අත්දැකීම්වලට මුහුණපෑමට ළමයින්ට සිදු වේ. එවැනි අත්දැකීම් නිසා ළමයා අනාගතයේ තමාගේ බලය පෙන්වීමට හැකි හොඳම ක්‍රමය පහරදීම වශයෙන් මනසේ තැන්පත් කර ගනී. එවැනි ළමයින් පාසලේදී සහ ගමේදී කොන් වීම නිසා සමාජයෙන් හුදෙකලා වීමට වෛර දරන, සමාජයට වෛර කරන, දුර්වල පෞරුෂයක් ඇති ආවේගශීලී සහ ප්‍රචණ්ඩකාරී ළමයකු බවට පත් වීමේ අවදානමක් ඇත. බියට සහ ලජ්ජාවට පත් කර බලහත්කාරයෙන් ලිංගික ක්‍රියා සඳහා යොදවා ගැනීම වැනි හිංසනවලට ගොදුරුවීමට ද මෙවැනි ළමයින්ට සිදුවේ.

වාර්තාකරණයේදී ඒකපාර්ශ්වීය තොරතුරු, පෞද්ගලික රුචි අරුචිකම්, බාහිර පාර්ශ්වවල බලපෑම් යනාදිය මත පිහිටා සිටීම, කරුණු ප්‍රකාශනයේදී විද්‍යාත්මක පදනමක නොපිහිටීම, අත්දැකීමෙන් ප්‍රත්‍යක්ෂ කර නොගෙන, එනම් ගවේෂණාත්මක නොවන ලෙස ආවේග, හැඟීම්, හිතලු සහ පූර්ව නිගමන මත පිහිටා සිටීම නිසා ළමා වින්දිතයාට සිදුවන අසාධාරණය සුළු පටු නොවේ. එවැනි වාර්තා කිරීම් නිසා ඇතැම් විට පීඩනය ඉවසා ගැනීම අසීරු ව සියදිවි නසා ගැනීම තෙක් දරුණු පියවර අනුගමනය කරන්නට ළමයා පෙළඹුණු අවස්ථා තිබේ. එය ළමයා කලින් මුහුණ පෑ සිද්ධියට වඩා බරපතල තත්ත්වයකි. ඒ නිසා ළමයින් පිළිබඳ වාර්තාකරණය විනිශ්චය කටයුත්තකට සමාන කොට ඉතා සූක්ෂ්ම ව සහ නිවැරදි තොරතුරු මත පිහිටා රහස්‍ය කරුණු රහස්‍ය සේ තබා ‘සදාචාරමය වාර්තාකරණය (Ethical Reporting/ Ethical Journalism)’ භාවිත කිරීමට මාධ්‍යවේදියා වග බලා ගත යුතු ය.

2007 අංක 56 දරන සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ පනතේ (ICCPR Act) 5-2 වගන්තිය අනුව ඕනෑ ම රාජ්‍ය හෝ පෞද්ගලික ආයතනයක් ළමයාගේ උපරිම යහපතට (Best Interest of Child) ප්‍රමුඛත්වය දී ක්‍රියා කළ යුතු අතර එය නීතිමය වගකීමක් වන බව නීතිඥ සජීවනී අබේකෝන් අවධාරණය කළා ය.

මාධ්‍ය ආයතන හිමිකරුවන්, ප්‍රවෘත්ති මැදිරි මාධ්‍යවේදීන් සහ ප්‍රාදේශීය වාර්තාකරුවන් මේ පිළිබඳ දැනුවත් කර එකඟතා ගිවිසගෙන තිබන බව ජනමාධ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (සංවර්ධන සහ සැලසුම්) කැලුම් විජේනායක පැවසුවේ ය. විශේෂයෙන් ළමයින් සම්බන්ධ සියදිවි නසාගැනීම්, මරණ සහ හදිසි අනතුරු විමර්ශනයට යොදා ගන්නා CCTV දර්ශන, ඡායාරූප සහ වීඩියෝ ප්‍රචාරයේදී වින්දිතයාගේ පෞද්ගලික අනන්‍යතා එළිදරව් නොවන, ඔවුන්ගේ මානසික ව්‍යාකූලත්වයට බල නොපාන, තෝරා ගත් කොටස් පමණක්



ප්‍රචාරය කිරීමට ඔවුන් එකඟ වූ බවත් පැවසූ ඔහු ආගමික සහ වාර්ගික අනන්‍යතාව, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, බාලවයස්කාර බව සහ ආබාධිත තත්ත්ව වැනි විශේෂතා නොසලකා හැර ආචාරධර්මානුකූල නොවන ආකාරයෙන් වාර්තා කිරීමත් ප්‍රජාතාන්ත්‍රවාදය සහ මාධ්‍ය නිදහස යන්නට මුවා වී ළමයාගේ සුභසිද්ධිය නොසැලසෙන සහ ළමයාට අගතිගාමී වන ආකාරයෙන් තොරතුරු පළ කිරීමත් දඬුවම් ලැබිය හැකි වැරදි වන බව ද අවධාරණය කළේ ය.

තමන්ට අපයෝජනයක් හෝ හිංසනයක් සිදු වූ විට නීති අංශවලට පැමිණිලි කිරීම

**වාර්තා නොවන ළමා අපයෝජන සංඛ්‍යාවක් ද සමාජයේ තිබිය හැකි ය. එසේ වන්නේ පැමිණිලි කිරීම සඳහා නීති බලාත්මක කිරීමේ ආයතන වෙත යාමට ඇති නොකැමැත්ත, පවුල හෝ පාසල අපකීර්තියට පත් වේ යැයි සිතා සඟවාගෙන සිටීම, ලැජ්ජාව, නොදැනුවත්කම සහ වෙනත් සංස්කෘතිකමය හේතු නිසා කරබාගෙන සිටීම යනාදියයි.**

පිළිබඳ දරුවන්ට මෙන් ම වැඩිහිටියන් බහුතරයකට ද කිසිදු දැනුවත්භාවයක් නැත. බොහෝ සංවර්ධිත රටවල තත්ත්වය එසේ නොවේ. ළමා උද්‍යාන, පාසල්, පුස්තකාල වැනි පොදු ස්ථානවල ළමා අපයෝජන, ළමා අපචාර, ළමයාට එරෙහි කෘෘරත්වය වැනි සිද්ධිවලදී නීතිය සහ ආරක්ෂක අංශ දැනුවත් කිරීමට අදාළ දැන්වීම් ප්‍රදර්ශනය කරයි. එයින් දරුවාට තමාගේ අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීම පිළිබඳ කුඩා කල සිට ම අවබෝධයක් ලැබේ. ශ්‍රී ලංකාවේ තව ම එවැනි දේ ක්‍රියාත්මක නැත. ඒ සම්බන්ධ ව ද මාධ්‍යයට කාර්යභාරයක් තිබේ.

මීට වසර 25කට පෙර නිකුත් කළ 'ළමයින් පිළිබඳ සදාචාරමය වාර්තාකරණය අරභයා වන යුනිසෙෆ් ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ සංග්‍රහය' අධ්‍යයනය කිරීම මාධ්‍යවේදියකුට ඉතා වැදගත් ය. වාර්තාකරණයට අදාළ නීති බලවත් කරනවාට වඩා සදාචාරමය එකඟත්වයෙන් වාර්තා කිරීම මෙහිදී තමා අදහස් කරන බව ජාතික ළමාරක්ෂණ අධිකාරියේ සභාපති ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය උදය කුමාර අමරසිංහ ප්‍රකාශ කළේ ය. ළමයින් සම්බන්ධ වාර්තාකරණයේදී ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම කෙරෙහි ජනමාධ්‍යවේදීන්ගේ සැලකිල්ල යොමු කරවීම සඳහා මාර්ගෝපදේශ සංග්‍රහයක් කෙටුම්පත් කර ඇති බවත් විද්වතුන්ගේ සහ මහජනයාගේ අදහස් විමසා ඊට සංශෝධන සහ යාවත්කාලීන කිරීම් ඇතුළත් කොට නව පනතක් සකස් කිරීමට පියවර ගන්නා බවත් ඔහු පැවසී ය.

අදහස් දක්වන සභාපතිවරයා: ''1998 අංක 50 දරන පාර්ලිමේන්තු පනතින් ස්ථාපිත ජාතික ළමාරක්ෂණ අධිකාරිය, එම පනතේ 14 වැනි වගන්තියෙන් පෙන්වා දී ඇති ආකාරයට කරුණු 19ක් යටතේ ක්‍රියාකාරී වනවා. එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තියට (CRC) ශ්‍රී ලංකාව 1991 ජූලි මස 12 දින අත්සන් කළ පසු අප රට එම ජාත්‍යන්තර නීතියට අනුගත වී එය ක්‍රියාත්මක කිරීමට බැඳී සිටිනවා. ළමයින්ට අදාළ සියලු කාරණාවලදී ළමයාගේ උපරිම යහපත සැලසෙන ආකාරයෙන් ක්‍රියා කළ යුතුයි. මෙය ලෝකය පිළිගත් මූලධර්මයක්. වාර්තාකරණයටත් එය අදාළයි. ප්‍රඥප්තියේ ඇති වගන්ති 54න් ළමා අයිතිවාසිකම් සමග ඍජු ව ම සම්බන්ධ වගන්ති 40ක් පමණ තිබෙනවා. එහි ප්‍රධානතම මූලධර්ම 4 වන්නේ ළමයාගේ දිවිපැවැත්ම, සංවර්ධනය, ආරක්ෂාව සහ සහභාගිත්වය තහවුරු කිරීමයි. එයිනුත් ළමයාගේ ආරක්ෂාව තහවුරු කිරීම අපට පැවරෙන ප්‍රධානතම කාර්යය. ඒ යටතේ ළමා අපයෝජන වැළැක්වීම, අපයෝජනයට ගොදුරු වූ ළමයි ආරක්ෂා කිරීම, ඔවුන්ට ප්‍රතිකාර කිරීම යන කරුණු 3ට අදාළවයි නව ජාතික ප්‍රතිපත්තියක් සකස් කෙරෙන්නේ. මේ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට මාධ්‍යයේ සහාය අත්‍යාවශ්‍යයි.'

මෙරට සම්මත ප්‍රධාන අණ පනත්වලින් ආවරණය වන, ළමයින්ට එරෙහි ව සිදුවන වැරදි ද ළමා අපයෝජන ලෙස සැලකීමට අධිකාරියට හැකියාව ඇත. ළමා අපයෝජනයට එරෙහි සියලු ම ක්‍රියාමාර්ග ගැනීම, සම්බන්ධීකරණය සහ නියාමනය ද අධිකාරියේ කාර්යයකි. ළමයාගේ ආරක්ෂාව හා පරෙස්සම සම්බන්ධයෙන් රජයට උපදෙස් ලබා දීමේ බලතල ද අධිකාරියට ඇත.

වර්තමානයේ පළකරන ඇතැම් සමාජ මාධ්‍ය වාර්තා නිසා නීතිය සහ සමාජය ඉදිරියේ ළමාරක්ෂණ අධිකාරිය විවිධ අපහසුතාවලට මුහුණදෙන අවස්ථා තිබේ. ව්‍යාජ අන්තර්ජාල ගිණුම් ඔස්සේ පළ කරන වාර්තා සහ ග්‍රාහක ප්‍රතිචාර වැනි දේ නිසා උද්ගත වන තත්ත්ව ඊට නිදසුන් ය. 2024 අංක 09 දරන මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතතාව පිළිබඳ පනත (Online Safety Bill) වැනි පනත් හඳුන්වා දී ඇත්තේ ද එවැනි ගැටලු නිසා ය. එහි 308 වැනි වගන්තිය යටතේ ළමයින් කෲරත්වයට භාජනය වීමේ සහ එහි 28 වැනි වගන්තිය යටතේ ළමයින් ලිංගික අපයෝජනයට ලක් වීමේ සිද්ධිවලදී එහි වින්දිතයා සහ පළමු සාක්ෂිකරු වශයෙනුත් අපචාරයකදී සැකකරුවකු වශයෙනුත් නීතිය සමග ගැටීමට ළමයාට සිදු වේ. එබැවින් එවැනි අවස්ථා වාර්තා කිරීමේදී සැලකිල්ලට ගත යුතු ප්‍රතිපත්ති මාලාවක් ද හඳුන්වා දී තිබේ. සදාචාරය පිළිබඳ මෙන් ම එම නීති ප්‍රතිපාදන පිළිබඳ අවබෝධය, වගකීම සහ වගවීම සහිත මාධ්‍ය භාවිතාවක් කාලීන අවශ්‍යතාව බවට පත් ව ඇත.

('ළමා හිතකාමී, ළමා ආරක්ෂාව තහවුරු වන මාධ්‍ය වාර්තාකරණයක් වෙත මාධ්‍යවේදියා සංවේදී කිරීම' යන මැයෙන් ජනමාධ්‍ය අමාත්‍යාංශයේ පැවති වැඩමුළුවක් ඇසුරෙනි)



# පාසල් ගිය කෘත්‍රිම බුද්ධිය

**නිරෝෂි දොඹගහගේ**

කෘත්‍රිම බුද්ධිය පිළිබඳ සාක්ෂරතාව ඉහළ නැංවීම සඳහා වන AI Strategy 2024-2028 වැඩසටහනෙහි එක් අදියරක් ලෙස පාසල්වල කෘත්‍රිම බුද්ධිය ආශ්‍රිත ශිෂ්‍ය සමාජ (Artificial Intelligence & Clubs) ක්‍රියාත්මක කිරීමට රජය තීරණය කර ඇත. මේ සඳහා තාක්ෂණ අමාත්‍යාංශය හා අධ්‍යාපන අමාත්‍යාංශය ඉදිරිපත් කළ ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා පසුගියදා අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි විය. තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) චානකී මල්ලිකාරච්චි පවසන්නේ AI Strategy 2024-2028 යනු AI භාවිතයේ අභියෝගවලට මුහුණදීමට සහ එම දැනුම බිම් මට්ටමට ගෙනයාම සඳහා නිර්මාණය කර ඇති පස් අවුරුදු මාර්ග සිතියමක් බව ය.

ඒ අනුව පාසල්වල කෘත්‍රිම බුද්ධිය ආශ්‍රිත ශිෂ්‍ය සමාජ ක්‍රියාත්මක කිරීමේ ආරම්භක පියවරක් ලෙස සියලු පළාත් නියෝජනය වන අයුරින් තෝරාගත් පාසල් 100ක 6 ශ්‍රේණියේ සිට 9 ශ්‍රේණිය දක්වා ඉගෙනුම ලබන සිසුන්ගේ සහභාගිත්වයෙන් නියමු ව්‍යාපෘතියක් ඇරඹීමට නියමිත ය. ඊට අවශ්‍ය ප්‍රතිපාදන සහ තාක්ෂණික සහය තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය සපයයි. එහිදී කෘත්‍රිම බුද්ධිය ආශ්‍රිත උපායමාර්ගික සැලැස්මට වෙන් වී ඇති ප්‍රතිපාදනවලින් රුපියල් මිලියන 18ක් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත තාක්ෂණ අමාත්‍යංශය පවරා තිබේ.

> රටක් සංවර්ධන මාවතෙහි ඉදිරියට යන විට විවිධ ක්ෂේත්‍රවල නව දැනුම පිළිබඳ යාවත්කාලීන වීම අත්‍යවශ්‍ය කරුණකි. එම දැනුම සොයා යාම සඳහා කෘත්‍රිම බුද්ධි තාක්ෂණය භාවිත කළ හැකියි. ඒ අනුව වර්තමානයේ ගෝලීය ව සමාජ, ආර්ථික, සංස්කෘතික සන්දර්භය මගහැර යා නොහැකි මෙවැනි ක්ෂේත්‍ර පිළිබඳ සාක්ෂරතාව වැඩිදියුණු කිරීමට කෘත්‍රිම බුද්ධිය ආශ්‍රිත ශිෂ්‍ය සමාජවලින් සාධනීය දායකත්වයක් ලැබෙනු ඇත.

වත්මන් හා අනාගත ගෝලීය ප්‍රවණතා සඳහා සාර්ථක ව මුහුණදිය හැකි පුරවැසියන් බිහි කිරීමටත් ඔවුන්ගේ දායකත්වය ආර්ථික සංවර්ධනයට ඵලදායී ලෙස ලබාගැනීමටත් මෙහිදී අවස්ථාව සැලසෙනු ඇත. මෙම නියමු ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය අනුව ඉදිරි වර්ෂවලදී වැඩසටහන දිවයිනේ අනෙකුත් පාසල් සඳහා ද ව්‍යාප්ත කිරීමට අපේක්ෂිත ය.

අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) වාසනා එදිරිසූරිය පවසන්නේ තෝරාගත් පාසල් 100 අතුරින් පාසල් 30ක පමණ දැනටමත් මෙම ව්‍යාපෘතියෙහි මූලික අදියර ආරම්භ කර ඇති බවයි. එහිදී එක් පාසැලකින් ගුරුවරු දෙදෙනකු බැගින් ගුරුවරු 100ක් තෝරාගෙන ඔවුන්ට පුහුණු වැඩමුළු පවත්වා තිබේ. පරිගණක පහසුකම් හා අන්තර්ජාල පහසුකම් සහිත වැඩි සිසුන් සංඛ්‍යාවක් ඉගෙනුම ලබන පාසල් මෙම ව්‍යාපෘතියට තෝරාගෙන ඇත. ඒ, සිංහල හා දෙමළ මාධ්‍ය පාසල්, ජන විවිධත්වය නියෝජනය කරන පාසල් මෙන් ම වතු පාසල් ද නියෝජනය වන පරිදි ය. දැනටමත් පරිගණක සංගමයක් (computer club) ක්‍රියාත්මක වන පාසල්වල ඊට සමගාමී ව්‍යාපෘතියක් ලෙසින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ.

ශ්‍රී ලංකාවේ පාසල් සිසුන්ගේ හා පාසල් ප්‍රජාවගේ කෘත්‍රිම බුද්ධිය පිළිබඳ පවතින සාක්ෂරතාව වැඩිදියුණු කිරීම, කෘත්‍රිම බුද්ධිය ආශ්‍රිත අධ්‍යාපනය සඳහා නව

සම්මත හඳුන්වා දීම යනාදිය මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ අරමුණු ය. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය උපදෙස් සංග්‍රහයක් ද පාසල් වෙත නිකුත් කර තිබේ. පාසල් කාලයෙන් පසු පැයක පමණ කාලයක් දරුවන් දැනුවත් කිරීමත් කෘත්‍රිම බුද්ධිය ආශ්‍රිත ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල යෙදවීමත් සිදු වේ. මෙම වැඩසටහන සඳහා එක් පාසලකට රුපියල් ලක්ෂය බැගින් පාසල් සංවර්ධන සමිතිය වෙත ලබාදීමට නියමිත ය. පාසල්වල පරිගණක හා උපාංග අලුත්වැඩියා කිරීම, අන්තර්ජාල පහසුකම් ලබා ගැනීම හා මාසික බිල්පත් පියවීම, තාක්ෂණික ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීම හා ව්‍යාපෘතියට අවශ්‍ය වන ලිපිද්‍රව්‍ය හා මුද්‍රිත පිටපත් ලබා ගැනීම වෙනුවෙන් මෙම මුදල් වෙන් කෙරේ.

මාධ්‍ය විශ්ලේෂක නාලක ගුණවර්ධන පවසන්නේ කෘත්‍රිම බුද්ධි තාක්ෂණය අනිවාර්යයෙන් ම අභියෝගයක් වනු ඇති බව ය. ඔහුට අනුව එය ජයගත හැකි වන්නේ දැනුවත්බවින් සහ නැණවත් පරිශීලනයෙනි. කෘත්‍රිම බුද්ධිය යන සංකල්පය මෑත කාලයේ විශාල වශයෙන් ජනප්‍රිය වුවත් එය නවතම සංකල්පයක් නොවන බව නාලක ගුණවර්ධන පවසයි. එනම් මෙම පසුබිමෙහිලා හඳුනාගත හැකි විවිධාකාර භාවිත පසුගිය වසර 15ක පමණ කාලයේ අප භාවිතයට ගෙන ඇත. අන්තර්ජාල සෙවුම් යන්ත්‍ර (Internet search engine - google, yahoo වැනි) සහ ඩිජිටල් සිතියම් (Google map වැනි), විද්‍යුත් බැංකුකරණය යනාදී සේවා ඊට නිදසුන් ය. ඩිජිටල් සිතියම්වලින් යම් ස්ථානයක් (Location) සෙවීමේදී ඒ පිළිබඳ තොරතුරු ක්ෂණික ව අප වෙත ලබා දෙන්නේ මෙම තාක්ෂණයෙනි. විද්‍යුත් බැංකුකරණයේදී ද ගනුදෙනුකරුවන්ට වඩාත් ආරක්ෂාකාරී ලෙස සහ පහසු ලෙස ගනුදෙනු කිරීමට කෘත්‍රිම බුද්ධිය යොදා ගැනේ.

මෑතකදී කෘත්‍රිම බුද්ධි තාක්ෂණය පිළිබඳ වැඩි උනන්දුවක් ඇති ව තිබෙන්නේ Large Language Models (LLM) ඔස්සේ වන අතර එය කෘත්‍රිම බුද්ධියේ එක් භාවිතාවක් පමණි. LLM භාවිතාවේ බොහෝ මානව භාෂාවලින් සජීවී ව සංවාදශීලී ලෙස ගනුදෙනු කරමින් අවශ්‍ය දැනුම, තොරතුරු යනාදිය පහසුවෙන් ලබාගත හැකි වීම නිසා මානව සමාජයෙහි ඒ පිළිබඳ වැඩි උනන්දුවක් නිර්මාණය වී තිබේ.

අන්තර්ජාලය හා කෘත්‍රිම බුද්ධිය තාක්ෂණය යනු භයානක රකුසකු නොවේ. ඒවායෙන් නිසි ප්‍රයෝජන ගැනීමට නම් මෙම තාක්ෂණය පිළිබඳ නිවැරදි දැනුම හා අවබෝධය වැදගත් ය. මෙම දැනුවත්භාවයෙන් යුක්ත ව පරිගණක තාක්ෂණය පරිශීලනය කිරීමේ අභියෝගය ජය ගැනීම සඳහා පාසල් මට්ටමින් පිහිටුවන කෘත්‍රිම බුද්ධිය ආශ්‍රිත ශිෂ්‍ය සමාජ මනා පිටුවහලක් වනු ඇති බව නාලක ගුණවර්ධනගේ අදහසයි. මේ ඔස්සේ වැඩිහිටියන්ගේ මෙන් ම පාසල් දරුවන්ගේ කෘත්‍රිම බුද්ධිය පිළිබඳ භීතිකාව තුරන්කොට ඒ සම්බන්ධයෙන් නිරවුල් අවබෝධයක් ලබා දීමට හැකියාව ලැබේ. ඉදිරියේදී රැකියා අවස්ථා ගොඩනැගෙන ආකාරය පිළිබඳ පාසල් වියේ පසුවන දරුවන්ට අවබෝධයක් ලබාගත හැකිවීම සාධනීය කරුණකි. මෙම දැනුම මත පදනම් ව දරුවන්ට තමන් අනාගතයේදී හදාරන විෂය පිළිබඳ යම් යම් තීරණයක් ගැනීමට හැකිවනු ඇත. දරුවන් දැනුවත් වී ඔවුන් මාර්ගයෙන් නිවෙස්වල වැඩිහිටියන්ට ද ඒ සම්බන්ධයෙන් දැනුම් සම්භාරයක් ලබාදීමට අවස්ථාව ලැබීම තවත් වැදගත් කරුණකි.

කෘත්‍රිම බුද්ධිය යනු රොබෝවරු පමණක් යැයි යම් අයකු සිතා සිටිනවානම් එය දුර්මතයකි. රොබෝවරු යනු AI තාක්ෂණයෙහි එක් මුහුණුවරක් පමණි. රොබෝවරු නොවන කිසිම ආකාරයේ භෞතික ශරීරයක් නොමැති, අපට නොපෙනෙන කෘත්‍රිම බුද්ධිය භාවිත වන තාක්ෂණික පද්ධති බහුල වශයෙන් එදිනෙදා භාවිතයට ගැනේ. ඇතැම් රටවල ගුවන් ගමන් සේවා සම්බන්ධීකරණය සඳහා ද AI තාක්ෂණය භාවිත කෙරේ.

**බටහිර රටවල් මෙන් ම ජපානය, චීනය, කොරියාව වැනි රටවල් ද මානව ගුරුවරුන්ට සමාන්තර ව AI ගුරු සේවා එම රටවල අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දී ඇත. ඒ අනුව පන්ති කාමරවල සිටින තනි තනි දරුවන් කෙරෙහි අවධානය යොමු කළ හැකි පරිදි වන AI තාක්ෂණික පද්ධති අධ්‍යාපනයට හඳුන්වා දී තිබේ.**

වර්තමානයේ AI තාක්ෂණ භාවිතාව සම්බන්ධයෙන් බටහිර රටවල් සමග චීනය වැනි රටවල් සම සම ව පර්යේෂණවල නියැළෙයි. කොරියාව, ජපානය, සිංගප්පූරුව වැනි පෙරදිග රටවල් ද මෙම තාක්ෂණය තමන්ගේ රටවල ආර්ථිකයට, ජන ජීවිතයට ඉතා සුහුරු (Smart) ලෙස භාවිත කරයි. ශ්‍රී ලංකාවේ මේ සම්බන්ධයෙන් බහුල ලෙස පර්යේෂණ සිදු කරන්නේ කොළඹ සහ මොරටුව විශ්වවිද්‍යාලවල ය. ඒ අනුව මෙම ක්ෂේත්‍රය සම්බන්ධයෙන් පර්යේෂණ පරපුරක් බිහිකිරීමට පාසල් දරුවන් අතර මෙම වැඩසටහන් ප්‍රචලිත කිරීමෙන් සුවිශේෂ දයකත්වයක් ලබාගත හැකි වේ. මෙම තාක්ෂණය සඳහා සිංහල වැනි භාෂා අනුගත කිරීම, ඒ සඳහා මෙවලම් නිපදවා ගැනීම යනාදී අවශ්‍යතා පිළිබඳ දරුවන් දැනුවත් කිරීමටත් මේ ඔස්සේ අවස්ථාව ලැබෙනු ඇත.

බටහිර රටවල් මෙන් ම ජපානය, චීනය, කොරියාව වැනි රටවල් ද මානව ගුරුවරුන්ට සමාන්තර ව AI ගුරු සේවා එම රටවල අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දී ඇත. ඒ අනුව පන්ති කාමරවල සිටින තනි තනි දරුවන් කෙරෙහි අවධානය යොමු කළ හැකි පරිදි වන AI තාක්ෂණික පද්ධති අධ්‍යාපනයට හඳුන්වා දී තිබේ. මෙහිදී විශේෂ කරුණක් වන්නේ දරුවන්ගේ මට්ටම හා වෙනස් අවශ්‍යතා හඳුනාගෙන (customize) මෙම පද්ධතිවලින් ඔවුන් වෙත මග පෙන්වීමයි. මේ ඔස්සේ එක් දරුවකුට එක් ගුරුවරයකු බැගින් සිටින යථාර්ථයක් පන්ති කාමරවල නිර්මාණය කර තිබේ. මානව ගුරුවරු මෙම කාර්ය සම්පූර්ණයෙන් ම අධීක්ෂණය කරමින් ඒවා මෙහෙයවයි.

අධ්‍යක්ෂ චානකී මල්ලිකාරච්චි අවසන පරිදි මෙම ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමෙන් අනතුරු ව දරුවන් AI තාක්ෂණය භාවිත කරමින් කේවල ව්‍යාපෘතියක් නිර්මාණය කළ යුතු වේ. එමගින් මෙම ව්‍යාපෘතියෙන් ඔවුන් ලබාගත් දැනුම පිළිබඳ ඇගයීමක් සිදුකිරීමට ද අවස්ථාව ලැබේ. ඉදිරියේදී කෘත්‍රිම බුද්ධි තාක්ෂණය පාසල් විෂය ධාරාවට ඇතුළත් කිරීමට සැලසුමක් ද පවතින බව අධ්‍යක්ෂවරිය පවසයි.

රටක් සංවර්ධන මාවතෙහි ඉදිරියට යන විට විවිධ ක්ෂේත්‍රවල නව දැනුම පිළිබඳ යාවත්කාලීන වීම අත්‍යවශ්‍ය කරුණකි. එම දැනුම සොයා යාම සඳහා කෘත්‍රිම බුද්ධි තාක්ෂණය භාවිත කළ හැකියි. ඒ අනුව වර්තමානයේ ගෝලීය ව සමාජ, ආර්ථික, සංස්කෘතික සන්දර්භය මගහැර යා නොහැකි මෙවැනි ක්ෂේත්‍ර පිළිබඳ සාක්ෂරතාව වැඩිදියුණු කිරීමට කෘත්‍රිම බුද්ධිය ආශ්‍රිත ශිෂ්‍ය සමාජවලින් සාධනීය දායකත්වයක් ලැබෙනු ඇත.

# සංචාරය සහ සාමය




දීප්ත කුමාර බටගොඩ

ලෝක සංචාරක දිනය සැප්තැම්බර් 27 දිනට යෙදී තිබේ. එය වාර්ෂික ව සමරන්නේ සංචාරක ව්‍යාපාරයේ වැදගත්කම සහ එහි සමාජ, සංස්කෘතික, දේශපාලනික සහ ආර්ථික වටිනාකම පිළිබඳ ජාත්‍යන්තර ප්‍රජාව දැනුවත් කිරීමේ අරමුණෙනි. මෙවර සංචාරක දින තේමා පාඨය වන්නේ "සංචාරය සහ සාමය" (Tourism and Peace) යන්න ය. සංක්‍රමණය හා සංචාරය හේතුවෙන් සමාජ සාධාරණත්වය (Social equity), දේශගුණික සාධාරණත්වය (Climate justice), රාජ්‍ය තාන්ත්‍රිකත්වය (Diplomacy), සංස්කෘතික සබැඳියාවේ සුරක්ෂිත බව (Cultural preservation) ඇති කිරීමට අවකාශය සැලසීමත් ඒ ඔස්සේ ජාතීන් අතර යුක්තිය හා සාමය ස්ථාපිත කිරීමත් දෙසට මෙවර සංචාරක දිනයේ අරමුණු දිශානුගත වී ඇත.

කොවිඩ් 19 වසංගයත් සමග ලෝක සංචාරක කර්මාන්තයේ විශාල කඩා වැටීමක් සිදු විය. 2020 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා ම ලෝකයේ සංචාරක කර්මාන්තයේ යම් පසුබෑමක් ඇති ව තිබුණ ද 2023 වර්ෂයේදී එය වසංගත සමයට පෙර තිබූ සාමාන්‍ය තත්ත්වයට පත් වූ බව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ වෙබ් අඩවිය 2024 ජනවාරි මාසයේදී ප්‍රකාශ කර තිබුණි. එයට අනුව ජාත්‍යන්තර සංචාරක පැමිණීම් 2024 පළමු කාර්තුවේදී පූර්ව වසංගත මට්ටම්වලින් 97%කට ළඟා වී තිබේ. සංචාරකයන් මිලියන 285කට වඩා වැඩි සංඛ්‍යාවක් ජනවාරි-මාර්තු මාසවල සංචාරය කර ඇති අතර එය 2023 පළමු කාර්තුවට වඩා 20%ක පමණ වර්ධනයකි.

බොහෝ සංවර්ධනය වෙමින් පවතින ආසියාතික රටවල මෙන් ම ශ්‍රී ලංකාවේ ද විදේශ විනිමය ඉපයුම් මාර්ග අතර සංචාරක කර්මාන්තයට විශේෂ ස්ථානයක් හිමි වේ. පාස්කු ඉරු දින බෝම්බ ප්‍රහාරයත් කොවිඩ් වසංගයත් හේතුවෙන් කඩා වැටුණු ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ කැපී පෙනෙන වර්ධනයක් 2024 වර්ෂයේදී වාර්තා කරන බව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය පෙන්වා දෙයි. ඒ අනුව 2024 ජූලි මාසය වන විට මුළු සංචාරක පැමිණීම 1,198,059 දක්වා ඉහළ ගොස් තිබේ. එය 2023 වර්ෂයේ මෙම කාලවකවානුව වන විට සංචාරක පැමිණීම් හා සසඳන විට සියයට 56ක වර්ධනයකි. කෙසේ වුවත් 2018 වර්ෂයේ ජූලි මාසය තෙක් සංචාරකයන්ගේ පැමිණීම සමග සසඳන විට 2024 වර්ෂයේ එම කාලවකවානුවේ සංචාරක පැමිණීම ඍණ වර්ධනයක් පෙන්නුම් කරන අතර එය සියයට 13ක් පමණ වේ.

පාස්කු ප්‍රහාරය සහ කොවිඩ් වසංගතයට පෙර වර්ෂවල මුල් භාගයේ සංචාරකයන්ගේ පැමිණීම හා සසඳන විට 2024 වර්ෂයේ සංචාරකයන්ගේ පැමිණීම තවමත් අඩු මට්ටමක පවතින බව පෙනී යයි. එමෙන් ම ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2024 වර්ෂයේ ජනවාරි සිට ජූලි මාසය තෙක් ඇස්තමේන්තු කරන ලද අපේක්ෂිත මාසික සංචාරක පැමිණීමේ අවම අගය සමග සැබෑ සංචාරක පැමිණීම තවමත් අඩු අගයක් ගැනීම ද විශේෂත්වයකි. එමෙන් ම කලාපයේ බොහෝ රටවල මෙම කාලයේ සංචාරක පැමිණීම ඔවුන් අපේක්ෂා කරන ලද අවම මට්ටම ඉක්මවා තිබුණු බව ද කොළඹ විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා අධ්‍යයනාංශයේ මහාචාර්ය සුරංග සිල්වා පවසයි.

### සංචාරක පැමිණීම ඉහළ ගියේ ඇයි?

විදේශ විනිමය හිඟ වීම නිසා අර්බුදකාරී තත්ත්වයක් ආර්ථිකයේ ඇති වූ නිසා ම ශ්‍රී ලංකා රජයට ක්ෂණික ව විදේශ විනිමය ඉහළ නංවා ගැනීමට තිබූ ප්‍රධානතම මාර්ගය වූයේ සංචාරක කර්මාන්තයයි. ඒ අනුව රජය ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය සඳහා විශේෂ අවධානයක් යොමු කළ අතර 2024 වර්ෂයේ සංචාරකයන්ගේ පැමිණීම වර්ධනය වීමට එය ප්‍රධාන සාධකයක් විය.

මේ සම්බන්ධයෙන් අදහස් දක්වන මහාචාර්ය සුරංග සිල්වා පවසන්නේ 2024 වර්ෂයේ ශ්‍රී ලංකාවේ සංචාරක පැමිණීමේ වර්ධනයක් පෙන්නුම් කිරීමට


රජයේ ක්‍රියාමාර්ගවලට අමතර ව තවත් හේතු ද්විත්වයක් බලපා ඇති බවයි. පළමුවැන්න සංචාරක ව්‍යාපාරයේ ඇති වූ ගෝලීය ප්‍රවණතා ය. කොවිඩ් වසංගතය හේතුවෙන් සංචාරක කර්මාන්තය සඳහා දැඩි ලෙස සීමා පැනවුණු නිසා සංචාරය කිරීමට නොහැකි වූ සංචාරකයන්ට කොවිඩ් වසංගතයේ බලපෑම ඉවත් වූ පසුව සංචාරය කිරීමට ඉහළ පෙළඹවීමක් (Arrears Tourism) ඇති විය. එය ශ්‍රී ලංකාවේ සංචාරක පැමිණීම ඉහළ යාම සඳහා ද ධනාත්මක ව බලපා ඇත. දෙවැනි හේතුව වශයෙන් ඔහු දක්වන්නේ රට අභ්‍යන්තරයේ ඇති ව තිබෙන සංචාරක කර්මාන්තයට හිතකර පරිසරයයි. ආර්ථිකයේ ඇති ව තිබූ අර්බුදකාරී වාතාවරණය ක්‍රමක්‍රමයෙන් ඉවත් වීම නිසා සංචාරකයන්ට පැමිණීම සඳහා හිතකර වාතාවරණයක් රටේ ඇති ව තිබේ.

### අපේක්ෂිත මට්ටමට ළඟා වීමට නොහැකි වුයේ ඇයි?

2024 වර්ෂයේ ජූලි මාසය වන විට 2023 වසරට සාපේක්ෂ ව සංචාරකයන්ගේ පැමිණීම ඉහළ ගොස් තිබුණත් ශ්‍රී ලංකා සංචාරක අධිකාරිය අපේක්ෂා කරන ලද අවම මට්ටමට හෝ සංචාරකයන් ගෙන්වා ගැනීමට හැකියාව ලැබී නොමැති බව දත්ත විශ්ලේෂණයේදී පෙනී යන කරුණකි. 2018 වර්ෂයේ මෙම කාලයේදී සංචාරක පැමිණීම හා සසඳන විට 2024 වර්ෂයේ සංචාරක පැමිණීම අවම මට්ටමක පවතී. තායිලන්තය, සිංගප්පූරුව, මැලේසියාව සහ මාලදිවයින වැනි රටවල් අපේක්ෂිත මට්ටමටත් වඩා පසුගිය කාලයේ සංචාරක ආකර්ෂණයක් ලබා ගෙන ඇති බව පෙනී යයි.

මේ පිළිබඳ අදහස් දක්වන මහාචාර්ය සුරංග සිල්වා පවසන්නේ ශ්‍රී ලංකාව මෑතකාලයේ සංචාරක කර්මාන්තයේ වර්ධනයක් අත්පත්කර ගත්තත් එය සත්‍ය වශයෙන් ම ලබා ගත හැකි වර්ධනයට (Potential Growth) වඩා පහළ තත්ත්වයක පවතින බවයි. ශ්‍රී ලංකාව ක්ෂණික වාසි ලබා ගැනීම සඳහා ගත් තීරණ හෝ වර්ධනය සඳහා අවශ්‍ය උපායමාර්ගික සැලසුම්වල පවතින දුර්වලතා මේ සඳහා හේතු වන්නට ඇති බව මහාචාර්යවරයා පෙන්වා දෙයි. එහෙත් ශ්‍රී ලංකාව සංචාරක කර්මාන්තයේ ළඟා විය හැකි උපරිම මට්ටමට ළඟා නොවීම නිසා ම වර්තමානයේ සංචාරක කර්මාන්තය සාධනීය තත්ත්වයක නැතැයි කිසිවෙකුටත් පැවසීමට නොහැකි බව ද මහචාර්යවරයා ප්‍රකාශ කරන්නකි.

සංචාරක ව්‍යාපාරයේ දියුණුව පිළිබඳ අවධානය යොමු කිරීමේදී සංචාරකයන්ගේ පැමිණීමේ සංඛ්‍යාව පිළිබඳ පමණක් අවධානය යොමු කර තක්සේරු කිරීම ප්‍රමාණවත් නොවේ. සංචාරකයකු ශ්‍රී ලංකාවට පැමිණ රටේ ගත කරන කාලය, ඔහු දිනකට වියදම් කරන මුදල් ප්‍රමාණය ආදී කරුණු ද මෙහිදී සලකා බැලිය යුතු වේ. මහාචාර්ය සුරංග සිල්වා පවසන පරිදි සංචාරකයකු ශ්‍රී ලංකාවේ දිනකට වියදම් කරන ප්‍රමාණය ඉහළ යාමක් පෙන්නුම් නොකරන අතර රටේ ගත කරන කාලයේ ද යම් අඩුවීමක් වාර්තා කරයි. මෙයින් සිදුවන්නේ සංචාරක කර්මාන්තයෙන් රටට ලැබෙන විදේශ විනිමය ප්‍රමාණයේ පහළ යාමකි.



මූලාශ්‍රය - ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

### සංචාරක ප්‍රවර්ධන විභවතාව සහ අභියෝග

ශ්‍රී ලංකාව සංචාරය සඳහා ආකර්ෂණීය රටක් ලෙස ලෝකයේ පිළිගැනීමට ලක් ව ඇත. පරිසරය, ජනතාව හා සංස්කෘතිය, ආහාරපාන, ඓතිහාසික තත්ත්වය ආදී වශයෙන් සංචාරක විභවතා රාශියක් පවතී. මෙම විභවතා එලෙසින් ම පවත්වාගෙන යාමෙන් සංචාරක කර්මාන්තයේ අපේක්ෂිත දියුණුවට ළඟා විය නොහැකි බව මහාචාර්ය සුරංග සිල්වා පවසයි. එම විභවතා ක්‍රියාකාරකම් සහ ආකර්ෂණීය මට්ටමක් දක්වා නිර්මාණාත්මක ව පරිවර්තනයකට ලක් කළ යුතු ය.

කලාපයේ අනෙකුත් රටවල් සමග පවතින තරගකාරී පසුබිම පිළිබඳ මනා අවබෝධයකින් යුතු ව අවම පිරිවැයකින් සංචාරක පැමිණීම සඳහා අවශ්‍ය පසුබිම සකස් විය යුතු ය. සංචාරකයන් පැමිණීමෙන් පසුව ඔවුන් සඳහා වියදම් ප්‍රභව ඇති කිරීම සඳහා වන නිර්මාණාත්මක එළඹුමක අවශ්‍යතාව ද ඒ සමග ම ඇති කළ යුතු වේ. ඒ අනුව වැඩි කාලයක් සංචාරකයන් රටේ රඳවා තබා ගැනීමට අවශ්‍ය වටපිටාව සකස් කළ යුතු ය.

මහාචාර්ය සුරංග සිල්වා පවසන පරිදි සංචාරක බදු ප්‍රතිපත්තිය සංශෝධනය කිරීම හා වීසා ලබා දීමේ ක්‍රමවේදය පිළිබඳ නැවත අවධානය යොමු කිරීමෙන් සංචාරකයන්ගේ පැමිණීම සඳහා වන පිරිවැය අවම කිරීම උපක්‍රමයක් ලෙස භාවිත කළ හැකි ය. මේ සඳහා ගුවන්තොටුපොළේ පවතින සනීපාරක්ෂක පහසුකම්වල සිට අවධානය යොමු කළ යුතු බවත් ඔහු අවධාරණය කරයි. පවතින විභවතා අනුව උපරිම පලදායිතාවකින් යුතු ව සංචාරක ක්ෂේත්‍රය දියුණු කළ හැක්කේ ප්‍රජා හිතකාමී වූත් තරගකාරී වූත් තිරසර ව්‍යාපාරයක් බවට සංචාරක ව්‍යාපාරය පත් කිරීමෙන් පමණකි.



# බංග්ලාදේශයෙන් උගතමනා පාඩම්

**මොහාන් සමරනායක**

ශ්‍රී ලංකාවේ 2022 වසරේ හටගත් උග්‍ර ආර්ථික අර්බුදය සමයේ, අපට ආදර්ශයට ගත හැකි, අර්බුදයෙන් තොර රටක් ලෙස ඇතැම් විචාරකයන් විසින් පෙන්වා දෙනු ලැබුවේ දකුණු ආසියානු රාජ්‍යයක් වන බංග්ලාදේශය. එයට සාධාරණ හේතු කිහිපයක් තිබුණා. අතීතයේදී බංග්ලාදේශය බෙහෙවින් දිළිඳු රටක්. කෙතරම් දිළිඳු ද කියනවානම් 1970 දශකයේදී එක්සත් ජාතීන් හඳුන්වා දුන් සංවර්ධන මට්ටම මනින නිර්ණායක අතර, අඩුවෙන් ම සංවර්ධිත රටවල් 'Least Developed Countries' යන කණ්ඩායමට අයත් වූ රටවල් 24න් එක් රටක් බංග්ලාදේශය. එසේ තිබුණු බංග්ලාදේශ රාජ්‍යය 21 වැනි සියවසේ දෙවැනි දශකය අවසන් වන විට 5%-6%ක තරමේ ඉහළ වාර්ෂික ආර්ථික වර්ධනයක් සහිත, ඩොලර් බිලියන 40ක 50ක විදේශ විනිමය සංචිතයක් හිමි රාජ්‍යයක් බවට පත් ව සිටියා. 2022 අර්බුදය සමයේ බංගලාදේශය ශ්‍රී ලංකාවට ණය දුන්නා. එම නිසයි ඇතැම් විචාරකයෝ අප බංග්ලාදේශය ආදර්ශයට ගත යුතු බව පුවත්පත්වලට ලියූ ලිපිවලින්, සාකච්ඡාවලින් පැහැදිලි කළේ. එසේ ඉහළින් සැලකූ බංග්ලාදේශය අද දැවැන්ත පෙර නොවූ විරූ, ශ්‍රී ලංකාව 2022දී ගොදුරු වූ ආර්ථික අර්බුදයටත් එහා ගිය අතිශය බරපතල ව්‍යසනයකට, අර්බුදයකට ගොදුරු ව තිබෙනවා. එහි ප්‍රතිඵලයක් වශයෙන් අප මේ කතා කරන මොහොත වන විට බංග්ලාදේශ රාජ්‍යය අරාජික, පාලනය කිරීමට නොහැකි දරුණු ප්‍රචණ්ඩ ක්‍රියාවලින් සලකුණු වූ, ආර්ථිකය කඩා වැටෙමින් පවතින, විදේශ විනිමය සම්පත් සිඳී ගිය දේශයක් බවට පත් ව තිබෙනවා. වරක් ආදර්ශයක් ලෙස සැලකූ රටක් කෙටි කලක් ඇතුළත මෙවැනි මහා අභාග්‍යයකට ගොදුරු වුණේ කෙසේ ද? මේ ප්‍රශ්නයට තිබෙන උත්තර සංකීර්ණයි. විවිධ පැතිකඩ සහිතයි. විවාදජනකයි. එය පැහැදිලි කරගැනීමට බංග්ලාදේශ රාජ්‍යයේ ඉතිහාසය සංක්ෂිප්ත ව හඳුනා ගැනීම වැදගත්.

බංග්ලාදේශය අලුත් රාජ්‍යයක් ලෙස උපත ලබන්නේ 1971 වසරේදී. ඊට පෙර එය හැඳින්වුණේ නැගෙනහිර පාකිස්තානය නමින්. එය පාකිස්තානය නමින් අප දන්නා රාජ්‍යයේ කොටසක්. 1971 නැගෙනහිර පාකිස්තානයේ පැවති ඡන්ද විමසීමක ප්‍රතිඵලය භාරගැනීමට බටහිර පාකිස්තානය එනම් ඉස්ලාමාබාද් ආණ්ඩුව සූදානම් නොවූ නිසා, ඒ ප්‍රතිඵලය ප්‍රතික්ෂේප කළ නිසා ඇති වූ ප්‍රචණ්ඩ ගැටුමේදී දස දහස් සංඛ්‍යාත මිනිසුන් මිය ගියා. විශාල වශයෙන් නැගෙනහිර පාකිස්තාන ජනයා ඉන්දියාවට පළා ගියා සරණාගතයින් විදිහට. එවිට ඉන්දියාව මේ ප්‍රශ්නයට මිලිටරි වශයෙන් මැදිහත් ව පාකිස්තානය සමග කළ යුද්ධයක් අවසානයේ පාකිස්තානය පරාජය වීමෙන් අනතුරුවයි බංග්ලාදේශ රාජ්‍යය උපත ලබන්නේ. ඒ නිදහස් සටනින් පසු බංග්ලාදේශයේ පාලනය ලබා ගත්තේ මෑතකදී බංග්ලාදේශයෙන් පලා ගිය අගමැතිනි ෂේක් හසීනා වාජේඩ්ගේ පියා වන ෂේක් මුජිබර් රහ්මාන්. ඔහු නායකත්වය දුන් පක්ෂය අවාමී ලීගය. මුජිබර් රහ්මාන් තමන්ගේ පාලන සමයේදී බංග්ලාදේශයේ නිදහස් සටනට නායකත්වය දුන් පවුල්වලින් පැවත එන පිරිස් සඳහා රජයේ රැකියාවලින් කොටසක් වෙන් කළා. සලාකයක් ඇති කළා රාජ්‍ය අංශයේ රැකියා ඉඩ ප්‍රස්ථාවලින් 30%ක් ඔවුන්ට වෙන්කිරීමට. පසු කලෙක මේ රැකියා සලාකය අවභාවිත වුණා. ඊට සාක්ෂි තිබෙනවා. බලයේ සිටි ආණ්ඩුව විශේෂයෙන් ෂේක් හසීනාගේ අවාමි ලීග් ආණ්ඩුව තමන්ගේ හිතවතුන්ට, දේශපාලන ආධාරකරුවන්ගේ පවුල්වල දරුවන්ට රැකියා දීම සඳහා මේ සලාකය ප්‍රයෝජනයට ගත් බවට සාක්ෂි තිබෙනවා. රැකියා සලාකය හඳුන්වා දුන් අවධියේ සිට ම ඊට එරෙහි ව තරුණ කොටස් අතර, ශිෂ්‍යයන් අතර විරෝධයක් තිබුණා. ඒ විරෝධය වරින් වර මතු වුණා. 2018 වසරේදී විරෝධය මතු වූ විට ඒ නිසා ම ප්‍රචණ්ඩ ක්‍රියා හටගත් විට අගමැතිනි ෂේක් හසීනා මුළුමනින් ම සලාක ක්‍රමය අහෝසි කළා. ඊට විරුද්ධ ව තව පිරිසක් අධිකරණයට ගිය විට එරට මහාධිකරණය සලාක ක්‍රමය නැවත ඇති කළා. යළිත් විරෝධතා හටගත්තා. ඒ විරෝධතා තමයි බංග්ලාදේශයේ වත්මන් අර්බුදයට මුල් වෙන්නේ.

2024 ජුනි මාසයේදී පමණ ආරම්භ වන විරෝධතාව සාමකාමී ව පටන් ගත්තත් කෙටි කාලයක් ඇතුළත එය ප්‍රචණ්ඩ ගැටුමක් බවට පත්වුණා. පොලිසිය වෙඩිතැබුවා. ශිෂ්‍යයන් මිය ගියා. සටන්කරුවන්ගේ ප්‍රහාරවලින් පොලිස් භටයන් මියගියා. දේපළවලට හානි වුණා. ඒ අවස්ථාවේදී බංග්ලාදේශ ශ්‍රේෂ්ඨාධිකරණය රැකියා සලාකයේ අනුපාතය වෙනස් කරමින් තීන්දුවක් දුන්නා. ඒ තීන්දුව අනුව මුළු රැකියා ඉඩ ප්‍රස්ථාවෙන් 5%කට අඩු කළා, විමුක්ති සටනේ නායකයන්ගේ පවුල්වල සාමාජිකයන්ට වෙන් කරන කොටස. නමුත් විරෝධතා නතර වුණේ නැහැ. ඉදිරියට තව තවත් ජනයා, විශේෂයෙන් තරුණ තරුණියන් පාරට ආවා. එවිට ඔවුන්ගේ ඉල්ලීම වුණේ තමන්ගේ පළමු අරගලයේදී සිසුන් ඝාතනය කළ ආණ්ඩුවේ නායිකාවට ඉල්ලා අස්වන ලෙසයි. ඒ අරගල උත්සන්න වී 2024 අගෝස්තු මස 05 දින අගමැතිනිය ෂේක් හසීනා අසල්වැසි ඉන්දියාවට පලා ගියා. බංග්ලාදේශ රාජ්‍යය බිඳවැටුණා. ඒ බිඳවැටුණු නායකත්වයට, දේශපාලනයේ ඍජු ව නොසිටි තැනැත්තෙක් වුවත් ප්‍රකට

පුද්ගලයකු වන මහාචාර්ය මහමුද් යූනුස්, අන්තර්කාලීන ආණ්ඩුවේ නායකයා ලෙස ගෙන ආවා. යූනුස් ඇමරිකාවේ සමීප හිතවතෙක්. වරක් එක්සත් ජනපදයේ කොංග්‍රස් මණ්ඩලය ඔහුට කොංග්‍රසයෙන් පිරිනැමෙන ඉහළ ම සම්මානය ප්‍රදානය කළා. ඇමරිකාවේ බලපෑම ඇති ව 2006 වසරේදී යූනුස්ට නොබෙල් සාම ත්‍යාගය පවා ප්‍රදානය කෙරුණා. ඉන් අනතුරුවත් බංග්ලාදේශය ස්ථාවර වුණේ නැහැ. ප්‍රචණ්ඩ ක්‍රියා ඉදිරියට ගියා. ආර්ථිකය පිරිහුණා. අපනයන කඩා වැටුණා. විදේශ විනිමය සංචිත සිඳී ගියා. දැන් බංග්ලාදේශය අන්තර්ජාතික ආයතනවලින්, ප්‍රධාන වශයෙන් අන්තර්ජාතික අරමුදලෙන් ණය ගන්න උත්සාහ කරමින් සිටිනවා.

මේ අර්බුදය පිළිබඳ හේතු දක්වන ප්‍රධාන ආඛ්‍යානය මූලික වශයෙන් සමාජගත වන්නේ බටහිර ආධිපත්‍යය සහිත ජනමාධ්‍ය ඔස්සේ, ඔවුන්ගේ උගතුන්ගේ මාර්ගයෙන්. එම ආඛ්‍යානයෙන් කියන්නේ බංග්ලාදේශයේ අර්බුදයට මුල් වුණේ හුදෙක් රැකියා සලාකය නොවෙයි, දීර්ඝ කාලයක් බලයේ සිටි, එනම් අවුරුදු 15ක් පමණ අඛණ්ඩ ව බලයේ සිටි අගමැතිනි ෂේක් හසීනාගේ සිට එම ආණ්ඩුවේ ප්‍රජාතන්ත්‍ර විරෝධී, මර්දනකාරී, දූෂිත පාලන තන්ත්‍රයට ජනතාව ප්‍රජාතන්ත්‍රවාදී ලෙස විරෝධය පළ කිරීමක් බවයි. ඒ ආඛ්‍යානය බොහෝ දෙනෙක් පිළිගෙන තිබෙනවා. මා දුටුවා අපේ රටේ ප්‍රධාන පෙළේ සතිඅන්ත ඉංග්‍රීසි පුවත්පතක ඒ බංග්ලාදේශ ජයග්‍රහණය හඳුන්වා තිබුණේ 'දෙවැනි විමුක්තිය' (The Second Liberation) ලෙසයි. තවත් විවිධ විචාරකයන් එය ප්‍රජාතන්ත්‍රවාදී ජයග්‍රහණයක් ලෙස හඳුන්වා තිබුණා. නමුත් අද ඒ දෙවන විමුක්තියේ ප්‍රතිඵල බංග්ලාදේශයට දරාගත නොහැකි තරමේ බරපතල ව්‍යසනයක් බවට පත් ව තිබෙනවා. එබැවින් ම මේ ව්‍යසනය පිටුපස තිබූ වෙනත් සාධක මේ වන විට එළියට එන්නට පටන් අරන්. සියලු සාධක අනාවරණය වී නැතත් දැනට තිබෙන සාධක අනුව පැහැදිලියි ෂේක් හසීනාගේ පාලනයේ තිබුණු දූෂණය, විරුද්ධවාදීන් මර්දනය, තමන්ගේ පක්ෂයේ ආධාරකරුවන්ට වැඩිපුර සැලකීම වැනි දුර්ලක්ෂණ ප්‍රයෝජනයට ගනිමින් ෂේක් හසීනාගේ ආණ්ඩුව පළවා හැරීමට ලෝකයේ බලවත් රාජ්‍යවලට, විශේෂයෙන් ම ඇමරිකා එක්සත් ජනපදයට තිබූ වුවමනාව, මේ රාජ්‍ය පෙරළිය, තන්ත්‍ර පෙරළිය පිටුපස තිබෙන බව. ඇයි ඇමරිකා එක්සත් ජනපදයට එය අවශ්‍ය වන්නේ යන බව පැහැදිලියි. මෑත වසරවලත් පලා යෑමෙන් පසුවත් ෂේක් හසීනා කළ ප්‍රකාශවලදී ඇය කිව්වා එක් අවස්ථාවක තමන්ට යෝජනාවක් ඉදිරිපත් වූ බව බංග්ලාදේශයට අයත් සෙන් මාර්ටින්ස් නමැති කුඩා දූපත ඇමරිකාවේ යුද කඳවුරක් ඉදිකිරීම සඳහා ඉල්ලා සිටිමින්. ඇය එය ප්‍රතික්ෂේප කළා. ඉල්ලීම කවරකුගෙන් දැයි ඇසූ විට ඇය කියා සිටියේ සුදු මිනිසකුගෙන් බවයි. ඊට අමතර ව තවත් සාක්ෂි නම් බටහිර රාජ්‍ය, එක්සත් ජනපදය බංග්ලාදේශයට බල කළ බව බංග්ලාදේශයේ හමුදා කඳවුරක් ඉදි කරන්නට. තවත් සාධකයක් නම් බංගලාදේශයෙන් කොටසක්, මියන්මාරයෙන් කොටසක් ඉන්දියාවෙනුත් හැකිනම් කොටසක් අරගෙන නැගෙනහිර තිමෝරය බඳු වූ ක්‍රිස්ත්‍රියානි රාජ්‍යයක් නිර්මාණය කිරීමට ඒ බලවේගවලට අවශ්‍ය


මේ අර්බුදය පිළිබඳ හේතු දක්වන ප්‍රධාන ආඛ්‍යානය මූලික වශයෙන් සමාජගත වන්නේ බටහිර ආධිපත්‍යය සහිත ජනමාධ්‍ය ඔස්සේ, ඔවුන්ගේ උගතුන්ගේ මාර්ග යෙන්. එම ආඛ්‍යානයෙන් කියන්නේ බංග්ලාදේශයේ අර්බුදයට මුල් වුණේ හුදෙක් රැකියා සලාකය නොවෙයි, දීර්ඝ කාලයක් බලයේ සිටි, එනම් අවුරුදු 15ක් පමණ අඛණ්ඩ ව බලයේ සිටි අගමැතිනි ෂේක් හසීනාගේ සිට එම ආණ්ඩුවේ ප්‍රජාතන්ත්‍ර විරෝධී, මර්දනකාරී, දූෂිත පාලන තන්ත්‍රයට ජනතාව ප්‍රජාතන්ත්‍රවාදී ලෙස විරෝධය පළ කිරීමක් බවයි.

වී තිබුණා. ඒවාට එකඟ නොවූ නිසයි බංග්ලාදේශ රාජ්‍යය බිඳ දැමීමට මේ බලවේග ක්‍රියා කළේ කියන කාරණයට අද සාක්ෂි වශයෙන් පිළිගත හැකි සාධක රැසක් මතු වී තිබෙනවා.

අද ඉතා ප්‍රකට කරුණක් වන්නේ ලෝකයේ බලවත් රාජ්‍ය අතර උත්සන්න වන අරගලයක් තිබෙනවා ලෝක ආධිපත්‍යය සඳහා. එක්සත් ජනපදය, චීනය, යුරෝපා සංගමය සහ රුසියාව යන බලවතුන් අතර. ආසියානු කලාපයේදී චීනය පාලනය කිරීම, ඉන්දියාවේ ආර්ථික වර්ධනය අඩාල කිරීම, බලවත් ජාතීන්ගේ අභිලාශයක්. මේ අභිලාශය යුද්ධයක් බවට පත්වීමේ අන්තරාය තිබෙනවා. බලවත් රටවල් යුද්ධයකට සූදානම් වෙමින් සිටිනවා චීනය සමග. එවැනි යුද්ධයකදී බෙංගාල බොක්ක, ඉන්දියන් සාගරය, ශ්‍රී ලංකාව, බංග්ලාදේශය, නේපාලය වැනි රටවල් ඒ බලවත් රාජ්‍යවලට යුදමය වශයෙන්, උපාය මාර්ගික වශයෙන් ඉතා ම වැදගත් භූමි බවට පත් ව තිබෙනවා. ඒ නිසයි දකුණු ආසියාවේ එවැනි උපායමාර්ගික වැදගත්කම් සහිත රාජ්‍ය බිඳ දැමීම අඛණ්ඩ ව සිදුවෙමින් තිබෙන්නේ. මෑත කාලයේදී පාකිස්තානයේ ඉම්රාන් ඛාන් අගමැතිවරයාගේ ආණ්ඩුව දැමුවා. ශ්‍රී ලංකාවේ ද එවැන්නක් සිදු වුණා. ඊළඟට නේපාලයේ ආණ්ඩු වෙනසක් ඇති කළා. දැන් මාලදිවයිනත් එවැනි අන්තරායකට මුහුණ පා සිටිනවා. මේ ව්‍යසනය පිටුපස තිබෙන්නේ බල දේශපාලනය. බෙංගාල බොක්ක ප්‍රදේශයේ මලක්කා සමුද්‍ර සන්ධිය ඔස්සේ දිනකට ප්‍රවාහනය කෙරෙන ඛනිජ තෙල් බැරල් ගණන මිලියන 15.2ක්. මුහුදු මාර්ග යෙන් ප්‍රවාහනය කෙරෙන තෙල් ප්‍රමාණය එය 30%කට වැඩි බව සංඛ්‍යාලේඛනවලින් පෙනෙනවා. මේ නිසයි බලවත් රාජ්‍යවලට, මේ කලාපය තමන්ගේ අණසකට ගැනීම අවශ්‍ය වන්නේ. මේ අර්බුදය අප සියලු දෙනාට ම පාඩමක්, ශ්‍රී ලංකාවේ ඇති වූ අර්බුදය සේ ම. කුමක්ද පාඩම?

අප දකින විදිහට සෑම රටක් ම උත්සාහ කළ යුතුයි තමන්ගේ ආර්ථික විභවතා නිවැරදි ව හඳුනාගෙන, ඊට සරිලන ආකාරයේ ශක්තිමත් ආර්ථිකයක් ගොඩනගා ගන්න. එසේ ම ඒ ආර්ථිකයේ ඵලය ජනතාව අතර සාධාරණ ලෙස බෙදී යන සමාජ ක්‍රමයක් ගොඩනගන්න උත්සාහ කළ යුතුයි. තව පාඩමක් තිබෙනවා. සමාජ අසාධාරණයක් ඇති වූ විට දූෂණය වැනි චෝදනා පමණක් සැලකිල්ලට ගෙන කරන අසංවිධානාත්මක, සැලසුමකින් තොර, දේශපාලන දෘෂ්ටියකින් සහ වැඩපිළිවෙළකින් තොර, ප්‍රචණ්ඩ අරගලවලින් වන්නේ අර්බුදයකට ගොදුරු වී තිබූ රටක් තවත් වට කිහිපයකින් දරුණු වූ අර්බුදයකට ගොදුරු වීම මිස විමුක්තිය උදාවීමක් නොවෙයි. අද බංග්ලාදේශ රාජ්‍යය වැටී තිබෙන තැනින් ගොඩ එන්න තව කොපමණ කලක් ගනී ද? යන්න පවා නිශ්චය වශයෙන් කිව නොහැකි තරම් අවාසනාවන්ත පරිසරයකුයි නිර්මාණය වී තිබෙන්නේ.

**කාංචනා සිරිවර්ධන**



InSight යානය

# අඟහරු මත ජලාශයක්

නිහාල් පීරිස්

අඟහරු ග්‍රහයා සූර්ය ග්‍රහ මණ්ඩලයේ ඇති ග්‍රහලෝක අතරින් විද්‍යාඥයන්ගේ වැඩි ම අවධානයක් යොමුවන ග්‍රහලෝකයකි. එම ග්‍රහලෝකය මත ඈත අතීතයේ ජීවීන් සිටියා ද වැනි ප්‍රශ්න ද නිතර සංවාදයට ලක් වන බව රහසක් නොවේ. බොහෝ විද්‍යා ප්‍රබන්ධවලට පවා අඟහරු ග්‍රහයා පසුබිම් වී ඇත. එච්. ජී. වෙල්ස් නැමැති සුප්‍රකට ඇමරිකානු ලේඛකයා විසින් 1895-1897 අතර කාලයේ ලියන ලද The War of the Worlds නැමැති ප්‍රබන්ධය ඒ අතරින් ජනප්‍රිය ම විද්‍යා ප්‍රබන්ධයකි. අඟහරු සිට පැමිණි දියුණු ජීවීන් පිරිසක් පෘථිවිය ආක්‍රමණය කිරීම පිළිබඳ කතාවක් ඊට පසුබිම් වේ. මෙම කෘතිය ඇසුරෙන් ස්ටීවන් ස්පිල්බර්ග් විසින් නිර්මාණය කරන ලද සිනමාපටයක් ද 2005 වසරේ ප්‍රේක්ෂකයන් හමුවට පැමිණියේ ය.

අඟහරු පිළිබඳ මෙම පූර්විකාව සටහන් කළේ පසුගිය දිනවල ද එම ග්‍රහලෝකය ගැන විද්‍යා ක්ෂේත්‍රයේ විශේෂ අවධානයක් යොමු වූ බැවිනි. එයට හේතු වූයේ මෙයට වසර කිහිපයකට පෙර ඇමරිකාවේ නාසා ආයතනය එහි යැවූ යානයක් විසින් එවන ලද තොරතුරු ඇසුරෙන් විද්‍යාඥයන් කළ සොයා ගැනීමකි.

මෙම තොරතුරු ඇසුරෙන් විද්‍යාඥයන් පවසන්නේ අඟහරු ග්‍රහයාගේ පෘෂ්ඨයට යටින් විශාල ජලාශයක් පවතින අයුරු පෙනී යන බවයි. අඟහරු යනු මතුපිටින් බැලූ විට එක ම කාන්තාරයක් ලෙස පෙනී යන ග්‍රහලෝකයකි. එහි ද්‍රව ජලය ඇති බවට සාක්ෂි හමු වූ පළමු අවස්ථාව මෙයයි. එම නිසා මෙම සොයා ගැනීම අඟහරු සම්බන්ධයෙන් මෑත කාලයේ කළ විශේෂතම සොයා ගැනීමක් ලෙස සැලකේ.

විද්‍යාඥයන් විශ්වාස කරන ආකාරයට මෙයට වසර බිලියන ගණනකට කලින්නම් අඟහරු පෘෂ්ඨය මත ඇති තරම් ජලය තිබී ඇත. එහි ගංගා, විල් සහ සුවිසල් සාගර වැනි දේ පැවැති බවට සලකුණු ඔවුහු සොයාගෙන තිබුණහ. මේ බව පෙන්වන අපූරු ඡායාරූප ආදිය ද විද්‍යාඥයන් සතු ව තිබේ. එහෙත් කිසියම් හේතුවක් නිසා එක්තරා අවධියක මෙම ජල සම්පත් සියල්ල සිඳී ගොස් තිබිණි. විද්‍යාඥයන් සඳහන් කරන ආකාරයට අඟහරු කාන්තාරයක් බවට පත් ව තිබුණේ වසර බිලියන 3කට පමණ පෙර ය.

ඈත අතීතයේ අඟහරු සතු වූ ජල සම්පත් මේ ආකාරයෙන් අතුරුදන් ව ගියේ මන්ද යන්න සම්බන්ධයෙන් විවිධ මත පවතී. එක් ප්‍රධාන මතයක් වන්නේ අඟහරුගේ අභ්‍යන්තරයේ ඇති වූ වෙනස්කම් හේතුවෙන් එහි චුම්භක ක්ෂේත්‍රය දුර්වල වීම මෙයට හේතුවන්නට ඇති බවයි. චුම්භක ක්ෂේත්‍රය දුර්වල වීම නිසා එයට එකල අඟහරු වටා පැවැති වායුගෝලය රඳවා තබා ගන්නට නොහැකි විය. වායුගෝලය ක්‍රමෙන් අභ්‍යවකාශයට කාන්දු වන්නට පටන් ගත් අතර ඒ සමග ම සාගර, ගංගා, ඇළදොළවල තිබූ ජලය ද වාෂ්ප වෙමින් අභ්‍යවකාශයෙහි විසිර ගියේ ය. මෙය අඟහරු මත තිබූ ජලය අතුරුදන් වූයේ කෙසේද යන්න පිළිබඳ ඇති ප්‍රධාන මතය ලෙස සැලකේ.



අඟහරු ග්‍රහයා

අඟහරු පෘෂ්ඨය මත මේ වනවිට ද්‍රව ජලය දක්නට නැතත් පෘෂ්ඨයට යටින් ජලාශ වැනි දෑ පවතින බවට සාක්ෂි පසුගිය ද නාසා විද්‍යාඥයන් සොයා ගත්තේ මෙයට වසර කිහිපයකට පෙර

අඟහරු වෙත යවන ලද InSight (Interior Exploration using Seismic Investigations, Geodesy and Heat Transport) නැමැති යානය ලබා දුන් තොරතුරු විශ්ලේෂණයෙනි. මෙම යානය පෘථිවියෙන් අඟහරු බලා පිටත් වූයේ 2018 වසරේ මැයි 18 දිනයි. එම වසරේ ම නොවැම්බර් 26 දින එය අඟහරුහි එලයිසියම් ප්ලැනිෂියා (Elysium Planitia) නැමැති ප්‍රදේශයට ගොඩ බැස්සේ ය. එයින් පසු 2022 දෙසැම්බර් මාසය දක්වා ම එය අඟහරු මත රැඳී සිටිමින් විවිධ තොරතුරු විද්‍යාඥයන් වෙත ලබා දුන්නේ ය.

InSight යානය ප්‍රධාන වශයෙන් ම රැස් කළේ අඟහරු පෘෂ්ඨයට යටින් සිදුවන දේ හා සම්බන්ධ තොරතුරුයි. භූමිකම්පා පිළිබඳ තොරතුරු ද ඒ අතර විය. මේ ආකාරයෙන් InSight යානය භූමිකම්පා 1,300කට පමණ අදාළ දත්ත ගබඩා කරගෙන තිබිණි. අඟහරු පෘෂ්ඨයට යටින් විශාල ජලාශයක් පවතින බවට සාක්ෂි ඇතැයි දුන් විද්‍යාඥයන් පවසන්නේ මෙම භූමිකම්පා පිළිබඳ දත්ත විශ්ලේෂණයෙනි. භූමිකම්පාවලින් නැගෙන ශබ්ද තරංග අධ්‍යයනය කිරීමෙන් භූමිය අභ්‍යන්තරයේ පවතින බොහෝ දේ පිළිබඳ සොයා ගැනීමට විද්‍යාඥයන්ට හැකියාව තිබේ. එම තරංග ගමන් කරන වේගය අනුව ඒවා ගමන් කරන්නේ කුමන මාධ්‍යයක් හරහා ද යන්න නිගමනය කිරීමට හැකි ය.

"පෘථිවිය මතත් අප මේ ක්‍රමය භාවිතයට ගන්නවා. පෘථිවිය මත ජලය, තෙල් සහ ගෑස් ආදිය තිබෙන තැන් සොයා ගැනීමටත් මෙම ක්‍රමයයි භාවිත කරන්නේ' කැලිෆෝනියා විශ්වවිද්‍යාලයේ මහාචාර්ය මයිකල් මන්ගා සඳහන් කරයි. ඔහු ද අඟහරු පිළිබඳ පර්යේෂණ කරන කණ්ඩායමට අයත් විද්‍යාඥයෙකි.

InSight යානය ලබා දුන් තොරතුරු විශ්ලේෂණය කළ විද්‍යාඥයන්ගේ අදහසට අනුව සොයා ගත් ජලාශය තිබෙන්නේ අඟහරු පෘෂ්ඨයේ සිට කි.මී. 10-20ක් අතර ගැඹුරකිනි. යානය ගබඩා කරගෙන තිබුණේ එය ගොඩබට ස්ථානයට හරියට ම යටින් නැගුණු ශබ්ද තරංග පිළිබඳ දත්ත පමණි. විද්‍යාඥයන් පවසන්නේ අඟහරු මත වෙනත් ස්ථානවල ද එහි පෘෂ්ඨයට යටින් මේ ආකාරයෙන් ම ජලාශ පවතින්නට ඉඩ ඇති බවයි.

මෙම සොයා ගැනීම අඟහරු පිළිබඳ පර්යේෂණ කරන විද්‍යාඥයන්ට බොහෝ අලුත් බලාපොරොත්තු දල්වන්නක් බවට පත් ව තිබේ. අඟහරු මත ජීවීන් සිටින්නේ ද යන්න සම්බන්ධයෙන් සොයා බලන විද්‍යාඥයන්ගේ ද මෙවැනි විශාල උනන්දුවක් ඇති ව තිබෙන බව පෙනේ. ජලය යනු ජීවීන්ගේ පැවැත්මට අත්‍යවශ්‍ය සහ ඒ සඳහා උදව් දෙන මාධ්‍යයකි. අඟහරු පෘෂ්ඨයට යටින් ඇති බව විශ්වාස කෙරෙන ජලාශවල ද ජීවීන් සිටින්නට බොහෝදුරට ඉඩ ඇති බව විද්‍යාඥයන්ගේ අදහසයි. ඉදිරියේදී මේ පිළිබඳ අලුත් පර්යේෂණ දියත් කිරීමට ඔවුන් පියවර ගනු නොඅනුමාන ය.


අනාගතයේ අඟහරු වෙත මිනිසුන් යැවීමට ද විද්‍යාඥයන් සැලසුම් කරමින් සිටින බව රහසක් නොවේ. යම් දිනෙක ඒ මත විද්‍යාගාර, ජනාවාස ආදිය ද ඉදි කෙරෙනු ඇත. අඟහරු ග්‍රහයා මත ද්‍රව ජලය සොයා ගතහොත් මෙවැනි කටයුතුවලට එයින් ලැබෙනු ඇත්තේ විශාල ප්‍රයෝජනයකි. මෙම ජලය යොදාගෙන ඉන්ධන නිෂ්පාදනය කිරීමට ද විද්‍යාඥයන්ට හැකියාව ලැබෙන අතර පෘථිවිය සහ අඟහරු අතර ගමන් කරන අභ්‍යවකාශ යානා සඳහා ද මෙම ඉන්ධන යොදා ගැනීමට හැකි වේ.

අඟහරු මත ඇති බවට සාක්ෂි ලැබී ඇති ජලාශය පිහිටා තිබෙන්නේ එහි මතුපිට සිට කි.මී. 10-20ක් පමණ ගැඹුරින් නිසා මෙම ජලය මතුපිටට ගැනීම අභියෝගාත්මක කාර්යයක් වනු ඇති බව විශ්වාස කෙරේ. එහෙත් ඒ සඳහා ද තාක්ෂණයක් නිපදවා ගැනීමට ඉදිරියේදී විද්‍යාඥයන් පියවර ගනු ඇති බව අමුතුවෙන් කිව යුතු නොවේ.



අතීතයේ පැවැති ගංගා සහ සාගර පිළිබඳ සලකුණු

InSight යානය ලබා දුන් තොරතුරු විශ්ලේෂණය කළ විද්‍යාඥයන්ගේ අදහසට අනුව සොයා ගත් ජලාශය තිබෙන්නේ අඟහරු පෘෂ්ඨයේ සිට කි.මී. 10-20ක් අතර ගැඹුරකිනි. යානය ගබඩා කරගෙන තිබුණේ එය ගොඩබට ස්ථානයට හරියට ම යටින් නැගුණු ශබ්ද තරංග පිළිබඳ දත්ත පමණි. විද්‍යාඥයන් පවසන්නේ අඟහරු මත වෙනත් ස්ථානවල ද එහි පෘෂ්ඨයට යටින් මේ ආකාරයෙන් ම ජලාශ පවතින්නට ඉඩ ඇති බවයි.



# විසෙන් විස නැසීම

**සුගත්ප්‍රිය කුලතුංග ආරච්චි**

වසරක් පාසා ලෝකයේ මිලියන ගණනකගේ පණ නසන රෝගයකට එරෙහි ව ප්‍රතිකාර කරන්නට ලොව පළමු වරට 'පණ ගැහෙන ඖෂධයක්' යොදා ගැනිමට ඇමරිකාවේ සෞඛ්‍ය බලධාරීන් අවසර ලබා දුන්නේ ය. 2022 වසරේදී පමණක් ලොව මිලියන 20කට ආසන්න ජනතාවක් ගොදුරු කරගත් බව වාර්තා වන මෙම භයානක රෝගය පිළිකාවයි. මෙම අභ්‍යවකාශතරණ යුගයේත් මිනිසා දැඩි ව අසරණ කර ඇති පිළිකාව නසන්නට තැනූ මෙම අපූරු ඖෂධය පිළිබඳ ආරංචිය අපට මතක් කර දෙන්නේ "විසෙන් විස නැසීම"යන ඉපැරැණි කියමන ය.


2024 වසර මුලදී, එක්සත් ජනපද ආහාර හා ඖෂධ පරිපාලනය විසින් Amtagvi නමැති ඖෂධය සන පිළිකාමය වර්ධනයට ප්‍රතිකාර කිරීම සඳහා සුදුසු බවට අවසර දීමත් සමග මෙම සුවිශේෂ ප්‍රතිකාර ක්‍රමය පිළිබඳ කතාබහ පැතිර ගියේ ය. මෙය හැඳින්වෙන්නේ පිළිකා සඳහා වූ පළමු T සෛල චිකිත්සාව හැටියට ය.

T සෛල යනු පුද්ගලයකුගේ ප්‍රතිශක්තිකරණ පද්ධතියේ ම කොටසකි. ඒවා සුදුරුධිරානු වර්ගයක් වන අතර අස්ථි ඇටමිදුළුවල ඇති ප්‍රාථමික සෛලවලින් වර්ධනය වේ. T ලිම්ෆොසයිට් සහ තයිමොසයිට් ලෙස ද මේවා හැඳින්වේ. විවිධ ආසාදනවලින් ශරීරය ආරක්ෂා කිරීමට සහ පිළිකාවලට එරෙහි ව සටන් කිරීමට ද මෙම සෛල උපකාරී වේ.

වර්ධනය වූ සමේ පිළිකාවලට හෙවත් මෙලනෝමා තත්ත්වයට ප්‍රතිකාර කිරීම සඳහා දැන් T සෛලවලින් සාදා ගත් ඖෂධය ප්‍රත්‍යක්ෂ වන බව පිළිගෙන තිබේ. මෙම ප්‍රතිකාර ක්‍රමය අපූරු ය. මෙයට යොදා ගන්නේ රෝගියාගේ පිළිකා සෛල වෙතින් ම පෙරාගත් ප්‍රතිශක්ති සෛලවලින් තනා ගන්නා ඖෂධයකි. එහෙයින් ම විසෙන් විස නැසීමකි. මේ සඳහා වෛද්‍යවරු, පිළිකාවලට ඇතුළු වී තිබූ ලිම්ෆොසයිට් සුදුරුධිරානු වර්ගයක් වන TIL (Tumor Infiltrating lymphocytes) ලෙස හඳුන්වන T සෛල වර්ගයක් රෝගියකුගේ පිළිකාමය වර්ධනයකින් ඉවත් කර ගැනිම මුලින් සිදුකර තිබේ. පසුව මෙම ස්වාභාවික පිළිකා ඝාතකයන් රසායනාගාර තත්ත්ව මත බිලියන ගණනින් වර්ධනය කර ගැනිණි. එලෙස සාදා ගත් 'පණ ගැහෙන ටී සෛල' බලඇණිය ඔවුන් රෝගීන්ට එන්නත් කරනු ලැබුවේ පණ නසන පිළිකාව පරාජය කිරීමට ශරීරයේ ඇති හැකියාව වැඩිදියුණු කිරීම සඳහා ය. පසුව මෙබඳු පරීක්ෂා දහස් ගණනක් තහවුරු කර තිබුණේ මේ සජීවි ප්‍රතිකාර ක්‍රමය වඩාත් ඵලදායක වන බව ය.

සෑම අඳුරු වළාවක ම රිදී රේඛාවක් ද සැඟ ව ඇතැයි පැරැණි කියමනකි. ලෝකයේ නවතම විද්‍යාත්මක සොයාගැනීම් ගැන හඹා යන්නකුට මෙවැනි රිදී රේඛා බඳු විස්මිත සොයාගැනිම් ගැන අසන්නට ලැබේ. මෙම නව ප්‍රතිකාර ක්‍රමය ද එවැනි හමුවිමකට නිදසුනකි.

මෙම විස්මිත ප්‍රතිකාරය සොයා ගැනිම ද අහම්බකාරක අපූරුවකි. එයට මඟ පෑදුණේ එක්සත් ජනපදයේ ජාතික පිළිකා ආයතනයේ පිළිකා රෝග විශේෂඥ ස්ටීවන් රොසෙන්බර්ග්ට 1968 වසරේදී පිළිකාව ස්වයංසිද්ධ ව අතුරුදහන් වූ රෝගියකු හමුවීමෙන් පසුව ය. වෙනත් හේතුවක් නිසා ප්‍රතිශක්තිකරණ පද්ධතිය කැළඹීම හේතුවෙන් පිළිකාවට එරෙහි ව සටන් කිරීමට ශරීරයට ඇති හැකියාව වර්ධනය වන බව මෙහිදී ඔහුට ප්‍රත්‍යක්ෂ වූ අතර ඒ ගැන උනන්දු වී සටහන් තබා තිබුණි. එම මූලික නිරීක්ෂණයේ සිට නව TIL චිකිත්සාව වෙත එන්නට දශක ගණනාවක් ගත විය.



වාර්තා වන පරිදි රෝගීන් 1,000කට වඩා වැඩි සංඛ්‍යාවකගේ පිළිකා, ප්‍රතිශක්ති පද්ධතියේ මෙම කෘත්‍රිම කැළඹීම් හේතුවෙන් හැකිළීම හෝ අතුරුදහන් වීම සිදුවන බව නිරීක්ෂණය කර තිබුණි. මෙහිදී බොහෝ වෛද්‍යවරු අනතුරුදායක බැක්ටීරියාවලින් මිනිසුන් ආසාදනය වීම ගැන කනස්සලු වූහ. විරෝධය පළ කළහ.

Rosenberg ගේ TIL චිකිත්සාව ද එයට බොහෝ කාලයට පෙර ඉදිරිපත් ව තිබූ අදහසකි. වෙනත් ආසාදනයකින් පසු කැළඹීමට ලක්වන ප්‍රතිශක්ති පද්ධතිය හේතුවෙන් හදිසියේ ම සමනය වන පිළිකා පිළිබඳ මුල් වාර්තා පුරාණ ඊජිප්තුව දක්වා පවා දිව යයි. 19 වැනි ශතවර්ෂය වන විට මෙම අදහස දරන විද්‍යාඥයන් රැසක් ම එක් ව තිබුණි. 1891 වසරේදී නිව්යෝර්ක් නගරයේ අස්ථි ශල්‍ය වෛද්‍ය විලියම් බ්‍රැඩ්ලි කෝලි විසින් ස්ට්‍රෙප්ටොකොකස් සහ සෙරේටියා නමැති බැක්ටීරියා යොදා රෝගීන්ගේ පිළිකා ආසාදනය කිරීමෙන් එම අදහස ප්‍රායෝගික ව ම පරීක්ෂාවට ලක් කළ අතර එය සාර්ථක ව ක්‍රියාත්මක වන බව පෙනී ගියේ ය. වාර්තා වන පරිදි රෝගීන් 1,000කට වඩා වැඩි සංඛ්‍යාවකගේ පිළිකා, ප්‍රතිශක්ති පද්ධතියේ මෙම කෘත්‍රිම කැළඹීම් හේතුවෙන් හැකිළීම හෝ අතුරුදහන් වීම සිදුවන බව නිරීක්ෂණය කර තිබුණි. මෙහිදී බොහෝ වෛද්‍යවරු අනතුරුදායක බැක්ටීරියාවලින් මිනිසුන් ආසාදනය වීම ගැන කනස්සලු වූහ. විරෝධය පළ කළහ. තවත් බාධාවක් වූයේ කෝලිගේ ප්‍රතිකාරය එලෙස ක්‍රියාත්මක වූයේ කෙසේද යන්න හෝ ඇයිදැයි යන්න හෝ කිසිවකු විද්‍යාත්මක ව දැන නොසිටීම ය. එබැවින් පිළිකා සඳහා වූ ප්‍රතිශක්තිකරණ ප්‍රතිකාරය එදා ඒතැනින් නතර විය.

එහෙත් 20 වැනි සියවසේ විද්‍යාඥයෝ ප්‍රතිශක්තිකරණ පද්ධතිය සහ එහි ක්‍රියාකාරිත්වය ගැන එතෙක් පැතිර තිබූ අවිදු අඳුර දුරලන්නට උනන්දු වූහ. ඒ ගැන දැඩි අධ්‍යයන ඇරැඹිණි. නිදසුනක් වශයෙන්, 1967 වසරේදී රොසෙන්බර්ග්ගේ නිරීක්ෂණයට වසරකට පෙර, ප්‍රතිශක්තිකරණ විද්‍යාඥයෝ T සෛලවල පැවැත්ම සහ ප්‍රතිශක්තිකරණයේදී මෙම සෛල සතු භූමිකාව සොයා ගන්නට සමත් වූහ. පසුගිය දශකයේ හෝ ඊට ආසන්න කාලයේ මෙම ක්ෂේත්‍රයේ ඇති වූ දියුණුව අද පිළිකා රෝගීන්ගේ ජයග්‍රහණයක් බවට පරිවර්තනය වී ඇත. 2011 වසරේදී පිළිකා මර්දන ප්‍රතිශක්තිකරණ සෛලවල ප්‍රහාරක මාදිලියේ තබා ගන්නා ආරක්ෂක නිෂේධක ලෙස හඳුන්වන ඖෂධ කාණ්ඩයක් ප්‍රථම වරට ලබා ගත හැකි විය. 2017 වසරේදී, ඇමරිකාවේ අහාර සහ ඖෂධ පාලක මණ්ඩලය වන FDA විසින් CAR T සෛලවල චිකිත්සාව ලෙස හඳුන්වන රෝගීන්ගෙන් ජානමය වශයෙන් නිර්මාණය කරන ලද T සෛල භාවිත කරන පළමු පිළිකා ප්‍රතිකාරය අනුමත කෙරිණි. මෙම ප්‍රතිකාර ක්‍රමය ලියුකේමියාව වැනි රුධිර පිළිකාවලට සාර්ථක ව ප්‍රතිකාරයක් විය. දැන් TIL චිකිත්සාව සමග ඝන පිළිකා නැසීමට ද අවස්ථාව උදාවී තිබේ.

මේ වන විට නව ඖෂධය චර්මීය මෙලනෝමා සඳහා පමණක් අනුමත කර ඇත. එහෙත් අධ්‍යයනවලින් පෙනී යන්නේ TIL චිකිත්සාව වෙනත් ආකාරයේ ඝන පිළිකාවලට ද එරෙහි ව සාර්ථක ව ක්‍රියා කළ හැකි බවයි.

වර්තමානයේ පිළිකාව සැලකිය යුතු ගෝලීය සෞඛ්‍ය අභියෝගයකි. 2022 වසරේ සංඛ්‍යාලේඛන අනුව ලොව මිලියන 20කට ආසන්න ජනතාවක් පිළිකා ආසාදිත වූ බව හඳුනාගෙන තිබුණි. එය ගෝලීය වශයෙන් මරණ සඳහා බලපෑ දෙවැනි ප්‍රධාන හේතුව බවට පත් විය. එම වසරේ පිළිකා හේතුවෙන් මිලියන 9.7ක් මිය ගිය බව ගණන් බලා ඇත.

එහි බලපෑම ශ්‍රී ලංකාව වැනි රටවලට ද වැඩි වැඩියෙන් දැනේ. පියයුරු, ගැබ්ගෙල, මුඛ, පෙනහලු සහ මහා බඩවැලේ පිළිකා ඇතුළු පිළිකා වර්ග රැසක් මෙරට රෝගාබාධ හා මරණ අනුපාතිකයට සැලකිය යුතු ලෙස දායක ව ඇත. 2022 වසරේදී 33,243ක් නව පිළිකා රෝගීන් ලෙස වාර්තා වී තිබුණි. වාර්තා අනතුරු අඟවන්නේ පසුගිය වසර 25 ඇතුළත පිළිකා ආශ්‍රිත මරණ සංඛ්‍යාවේ සමාන්තර වැඩිවීමක් සමග ශ්‍රී ලංකාවේ සමස්ත පිළිකා සිදුවීම් දෙගුණ වී ඇති බවට ය. මේ නිසා ම විසෙන් විස නැසීමේ නව ප්‍රතිකාරය මෙම රෝගයේ ගොදුරු බවට පත් ව සිටින සුවහසක් පිරිසකට සුබ ආරංචියක් වනු නියත ය.



# කතිරයේ බලය

**චන්දන මාරසිංහ**

ශ්‍රී ලංකාවේ මැතිවරණ ඉතිහාසයට එක් වන නව වැනි ජනාධිපතිවරණය 2024 සැප්තැම්බර් මස 21 දින පැවැත්වීමට නියමිත ව ඇත්තේ ලෝක දේශපාලනයේ මැතිවරණ වසරක් ලෙස 2024 වසර නම් කර තිබෙන පසුබිමක ය. මෙතෙක් ජනාධිපතිවරණයකට ඉදිරිපත් වූ වැඩි ම ඡන්ද අපේක්ෂකයන් සංඛ්‍යාව එනම් ඡන්ද අපේක්ෂකයන් 39ක් තරග කරන ජනාධිපතිවරණය ලෙස මෙය ඉතිහාසයට එක්වනු ඇත. මෙවර කවරයේ කතාවෙන් කතාබහට ලක් වන්නේ ජනාධිපතිවරණයක වැදගත්කම, එහි සුවිශේෂ සන්ධිස්ථාන සහ නව වැනි ජනාධිපතිවරණය පිළිබඳ ව ය.

ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් පවතින රටක පාලකයන් තෝරා ගැනීම සඳහා කිසිදු භේදයකින් තොර ව ඡන්දය භාවිත කිරීමට ජනතාවට හැකි වී තිබෙන්නේ සර්වජන ඡන්ද බලය හේතුවෙනි. එයින් රටේ පාලනයට සුදුසු බවට සැලකෙන පුද්ගලයා හෝ කණ්ඩායම තෝරාගැනීමට ජනතාවට හැකියාව තිබේ. මහජනතාව රටක අයිතිකරුවන් ය. ඔවුන්ගේ ඡන්දයෙන් පත් වන ජනතා නියෝජිතයන් වරින් වර පාලනයට පැමිණෙන්නේ භාරකරුවන්ගේ භූමිකාව ඉටුකිරීමට ය. මහජන කැමැත්ත හෝ අකැමැත්ත මත පාලකයන් පත්කර ගැනීමටත් ඉවත් කිරීමටත් ඡන්ද අයිතිය උපයෝගි කර ගත හැකි ය. 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ජනරජයේ පරමාධිපත්‍යය බලය ජනතාව සතු ය. ජනතාව සතු ඡන්ද බලය ද පරමාධිපත්‍යයේ කොටසකි. ඒ අනුව ඡන්ද බලය ක්‍රියාත්මක වීමේ යාන්ත්‍රණය වන්නේ මැතිවරණයයි.

## ජනාධිපතිවරණ ඉතිහාසය

සෝල්බරි ආණ්ඩුක්‍රමය අනුව ක්‍රියාත්මක වූ අග්‍රාණ්ඩුකාර ධුරය වෙනුවට 1972 ජනරජ ව්‍යවස්ථාව යටතේ ජනාධිපති ධුරයක් හඳුන්වා දුන්නේ ය. අග්‍රාණ්ඩුකාරවරයා පෙනී සිටියේ බ්‍රිතාන්‍ය රැජිණගේ නියෝජිතවරයා ලෙස ය. 1972 ජනරජ ව්‍යවස්ථාව යටතේ පත් වූ ජනාධිපතිවරයා මෙරට ජනතාවගේ නායකයෙකි. අගමැතිවරයා විසින් පත් කළ යුතු එම ජනාධිපතිවරයා ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතු ය. එතෙක් අග්‍රාණ්ඩුකාරවරයාට හිමි වූ බලතල රැසක් ජනාධිපතිවරයාට ද හිමි වීම විශේෂත්වයකි. එම බලතල ක්‍රියාත්මක කළ යුතු වූයේ අගමැතිගේ උපදෙස් අනුව ය. ජනාධිපතිවරයාගේ නිල කාලය වසර හතරකි. ඒ අනුව එවකට අග්‍රාණ්ඩුකාර ධුරය දැරූ විලියම් ගොපල්ලව මහතා මෙරට පළමු ජනාධිපතිවරයා ලෙස පත්විය. ඒ, 1972 මැයි 22 දින ය. නාමමාත්‍රික ජනාධිපතිවරයකු වූ ඔහුගේ සේවා කාලය 1976 මැයි 22 දින අවසන් වීමට නියමිත ව තිබුණ ද ඔහුගේ සේවය තවදුරටත් ලබා ගැනීමට කැබිනට් මණ්ඩලය තීරණය කර තිබීම නිසා සේවා කාලය තවත් වසර 4කින් දීර්ඝ කර තිබේ. 1977 මැතිවරණයෙන් බලයට පත් වූ ජේ. ආර්. ජයවර්ධන මහතා ජනාධිපති විලියම් ගොපල්ලව මහතා ඉදිරියේ අගමැතිවරයා ලෙස වැඩ භාර ගත් අතර 1977 මහා මැතිවරණයෙන් ඇති කළ විධායක ජනාධිපති ධුරයෙන් අනතුරු ව විලියම් ගොපල්ලව මහතා එම තනතුරින් ඉවත් විය.



නාමමාත්‍රික ජනාධිපති
විලියම් ගොපල්ලව මහතා

1978 පෙබරවාරි 04 දින සිට බලාත්මක වූ 1972 ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දෙවැනි සංශෝධනයෙන් විධායක ජනාධිපති ධුරය ස්ථාපනය කෙරිණි. ඒ අනුව මෙරට පළමු විධායක ජනාධිපතිවරයා මුලින් ම පත්වූයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයකිනි. ජේ ආර්. ජයවර්ධන මහතා එම තනතුරට පත් වූ අතර 1989 ජනවාරි මාසය තෙක් ඔහු එම තනතුර හොබවා තිබේ. ඒ, මෙරට පැවැත් වූ පළමු

වැනි ජනාධිපතිවරණයෙන් ලබාගත් ජන වරමත් සමගිනි.

1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රධාන ලක්ෂණයක් වූයේ පූර්ණ විධායක බලය සහිත ජනාධිපති ධුරය හඳුන්වා දීම ය. මෙම ව්‍යවස්ථාවට අනුව ජනාධිපතිවරයා යනු රාජ්‍ය නායකයා, ආණ්ඩුවේ නායකයා මෙන් ම සන්නද්ධ සේනාවල සේනාධි නායකයා ද විය. ජනාධිපතිවරයා සෘජු මහජන ඡන්දයෙන් තෝරා ගන්නා අතර ඒ සඳහා වෙන ම ජනාධිපතිවරණයක් පැවැත්වේ. මුලින් ම ජනාධිපතිවරයාගේ නිල කාලය වසර 06ක් වූ අතර 19 වැනි සංශෝධනයෙන් එය වසර 05 දක්වා අඩු කර තිබේ. ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවේ සාමාජිකයකු නොවුව ද පාර්ලිමේන්තුව සම්බන්ධ ව ද බලතල රාශියක් ඔහුට තිබිණි. ඒ අතර පාර්ලිමේන්තුව කැඳවීම, වාර අවසාන කිරීම, විසුරුවා හැරීම සහ මංගල සැසිවල මුලසුන දැරීම ද වේ.

මැතිවරණ කොමිෂන් සභාව ය. මෙම තත්ත්වය පැවතිය ද තුන් වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් අදාළ කාලයට පෙර ජනාධිපතිවරණය කැඳවීමේ බලතල ජනාධිපතිවරයාට හිමි වේ.

පළමු ධුර කාලයේ වසර 04ක් ගතවීමෙන් පසු ජනවරමක් ලබා දෙවැනි ධුර කාලය සඳහා ජනාධිපතිවරණයට මුහුණදීමට නීතිමය ප්‍රතිපාදන පවතින බැවින් ජේ. ආර්. ජයවර්ධන මහතා 1982 අගෝස්තු 27 දින ජනාධිපතිවරණය සඳහා සිය අභිලාෂය ප්‍රකාශ කර තිබේ. කොළඹ මහනගර සභා ශාලාවේදී සැප්තැම්බර් 10 දින ඒ සඳහා නාම යෝජනා භාර ගැනිණි. එහිදී ජනාධිපතිවරණය සඳහා දේශපාලන පක්ෂ නියෝජනය කළ එච්. එස්. ආර්. බී කොබ්බෑකඩුව, ජේ. ආර්. ජයවර්ධන, කොල්වින් ආර් ද සිල්වා, වාසුදේව නානායක්කාර, ජී. ජී. පොන්නම්බලම් සහ රෝහණ විජේවීර යන මහත්වරු නාම යෝජනා බාර දී තිබේ. ඒ අනුව ශ්‍රී

දයකයා පළමුවරට අත්දැකීමක් ලබා ගත්තේ මෙම මැතිවරණයෙනි

1988 දෙසැම්බර් මස 19 දින පැවති මෙරට දෙවැනි ජනාධිපතිවරණය පවත්වා ඇත්තේ රටේ අර්බුදකාරී වාතාවරණයක් පැවති සමයකදී ය. එල්.ටී.ටී.ඊ සංවිධානය යුද වාතාවරණයක් නිර්මාණය කර තිබීමත් ඊට හේතුවකි. ඡන්ද විමසීමට අදාළ නීති සංශෝධනය කිරීමට ද මෙම තත්ත්වය ඉවහල් විය. ඒ අනුව 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා ගැනීමේ පනතට නව වගන්ති ඇතුළත් විය. ඡන්ද විමසීමේදී සිදුවිය හැකි බාධා කිරීම්වලට අදාළ විසඳුම් සෙවීම ඒවායේ අරමුණ විය. ජනාධිපතිවරයකුගේ පූර්ණ ධුර කාලය අවසන් වීමෙන් පසු පැවැත් වූ පළමු ජනාධිපතිවරණය වන්නේ ද මෙම මැතිවරණයයි. අබේසේකර ඔස්ටින් මහතා, සිරිමාවෝ බණ්ඩාරනායක මහත්මිය සහ ආර්. ප්‍රේමදාස මහතා යන නියෝජිතයන් ජනාධිපතිවරණයට ඉදිරිපත් වූහ. එහිදී



ජේ. ආර්. ජයවර්ධන මහතා දිව්රුම් දෙමින්



ආර්. ප්‍රේමදාස මහතා දිව්රුම් දෙමින්

ජනාධිපතිවරණ ඡන්ද විමසීමට අදාළ ව ප්‍රධානතම නීති සංග්‍රහය වන්නේ 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීමේ පනත ය. එම පනතට අනුව බලයේ සිටින ජනාධිපතිවරයාගේ ධුර කාලය ඉකුත් වීමට පෙර මාසයකට අඩු නොවන සහ මාස 02කට වැඩි නොවන කාලයක ඡන්ද විමසීම පැවැත්විය යුතු ය. ඒ සඳහා නාම යෝජනා භාර ගැනීම සහ ඡන්ද විමසීමේ දිනය නියම කරන්නේ

ලංකාවේ පළමු වැනි ජනාධිපතිවරණය පැවැත්වුණේ 1982 ඔක්තෝබර් 20 දින ය. වලංගු ඡන්ද සංඛ්‍යාවෙන් ඡන්ද 3,050,881ක් ලබා ගනිමින් එහිදී ජේ. ආර්. ජයවර්ධන මහතා ජයග්‍රහණය කළ අතර ලැබූ ඡන්ද ප්‍රතිශතය 52.9%කි. 1982 වර්ෂය සඳහා වූ මැතිවරණ කොමසාරිස්වරයාගේ පාලන වාර්තාවේ දැක්වෙන ආකාරයට තනි ඡන්ද පත්‍රිකාවක 01, 02, 03 ලෙස මනාප යෙදීමේ ක්‍රමය පිළිබඳ ඡන්ද

වලංගු ඡන්දවලින් 50.4%ක් ලබාගත් ආර්. ප්‍රේමදාස මහතා ශ්‍රී ලංකාවේ දෙවැනි විධායක ජනාධිපතිවරයා ලෙස තේරී පත් විය. මෙම ජනාධිපතිවරණයේදී පළමු වරට ඡන්ද නිරීක්ෂකයන්ගේ සහභාගිත්වය ලැබී ඇත. ඒ, නිදහස් පක්ෂ අපේක්ෂිකාව වන සිරිමාවෝ බණ්ඩාරනායක මහත්මියගේ ඉල්ලීම අනුව ය. එවකට මැතිවරණ කොමසාරිස්වරයාගේ ආරාධනාව මත ඉන්දියාව, බංග්ලාදේශය, නේපාලය හා

පාකිස්තානය යන රටවල නියෝජිතයන් මැතිවරණ නිරීක්ෂණය සඳහා පැමිණ ඇත. ආර් ප්‍රේමදාස මහතාගේ ජනාධිපති ධුර කාලය 1989 ජනවාරි 02 සිට 1993 මැයි 01 දින දක්වා පැවැති බව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව සඳහන් කරයි. ආචාර්ය එස්. අයි. ගමගේ සිය 'ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරණ ඉතිහාසය' ග්‍රන්ථයේ සඳහන් කර තිබෙන්නේ ජනාධිපතිවරණ ප්‍රතිඵලයට එරෙහි ව සිනමාවෝ බණ්ඩාරනායක මහත්මිය අධිකරණයට පෙත්සමත් ඉදිරිපත් කළ බව ය.

ජනාධිපති ආර්. ප්‍රේමදාස මහතා 1993 මැයි 01 දින බෝම්බ ප්‍රහාරයකින් මිය යාම හේතුවෙන් එවකට අගමැති ධුරය දැරූ ඩී. බී. විජේතුංග මහතා වැඩ බලන ජනාධිපති ලෙස පත් විය. ඒ, 1993 මැයි මස 07 දින තෙක් ය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 40 වැනි වගන්තිය යටතේ අනුප්‍රාප්තික ජනාධිපතිවරයා තෝරා ගැනීම සඳහා වැඩ බලන ජනාධිපතිවරයාගේ නම යෝජනා කිරීමෙන් අනතුරු ව ඒකමතික ව ඩී. බී විජේතුංග මහතා එම ධුරයට පත් විය. ඒ අනුව 1993 මැයි 07 දින සිට 1994 නොවැම්බර් 12 දින දක්වා ඔහු තෙවැනි විධායක ජනාධිපතිවරයා ලෙස සිය ධුරයේ ක්‍රියා කළේ ය.

මෙරට තුන් වැනි ජනාධිපතිවරණය පැවැත්වූයේ 1994 වසරේදී ය එම වසරේ ඔක්තෝබර් 07 දින ඒ සඳහා නාමයෝජනා කැඳවිණි. ඒ අනුව චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරණතුංග මහත්මිය, ගාමිණී දිසානායක මහතා සහ හඩ්සන් සමරසිංහ මහතා ඇතුළු පිරිසක් නාම යෝජනා භාර දී තිබේ. ඡන්ද විමසීම පැවැත්වීමට 1994 නොවැම්බර් මස 09 දින නියම කෙරිණි. එක්සත් ජාතික පක්ෂ අපේක්ෂක ගාමිණී දිසානායක මහතා බෝම්බ ප්‍රහාරයකින් මිය යාම නිසා ඔහු වෙනුවට වෙනත් අපේක්ෂකයකු දින 03ක් ඇතුළත නම් කරන ලෙස මැතිවරණ කොමසාරිස්වරයා දැනුම් දී තිබේ. ඒ අනුව ශ්‍රීමති දිසානායක මහත්මියගේ නම ඊට ආදේශ කෙරුණු අතර මෙම ඡන්ද විමසීමේදී ඡන්ද 4,709,205ක් ලබා ගනිමින් චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය ජයගත් අතර එය ප්‍රතිශතාත්මක ව 62.27%ක් විය. මෙම ජනාධිපතිවරණය පවත්වා තිබෙන්නේ මහ මැතිවරණය අවසන් වී මාස 03ක් වැනි කාලයකදී ය.

යළිත් ජනාධිපතිවරණයක් පැවැත්වීමට නියමිත ව තිබුණේ 2000 වසරේ නොවැම්බර් මස 09 දින ය. එහෙත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ලැබී ඇති බලතල අනුව චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරණතුංග මහත්මිය නියමිත දිනට වසරකට පෙර මැතිවරණය පැවැත්වීමේ අභිලාෂය ප්‍රකාශ කර තිබේ. ඒ අනුව එවකට වැඩ බලන මැතිවරණ කොමසාරිස් වූ එම්. සී. අරුන්තවචෙල්වම් මහතා ඡන්ද විමසීම පැවැත්වීමේ දිනය ලෙස 1999 දෙසැම්බර් 21 දින ප්‍රකාශයට පත් කර තිබෙන අතර එය ශ්‍රී ලංකාවේ සිව් වැනි ජනාධිපතිවරණයයි. අපේක්ෂකයන් 13 දෙනකු ඒ සඳහා නාම යෝජනා භාර දී තිබේ. චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග, රනිල් වික්‍රමසිංහ, නන්දන ගුණතිලක, වාසුදේව නානායක්කාර, හරිශ්චන්ද්‍ර විජයතුංග යන මහත්ම මහත්මීහු ඒ අතර වූහ. එවර ද ඡන්ද 4,312,157ක් හෙවත් 51.1%ක් ලබාගත් චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරණතුංග මහත්මිය සිව් වැනි විධායක ජනාධිපති ලෙස තේරී පත් වූවා ය. ඒ අනුව ඇය 1994 නොවැම්බර් 12 දින සිට 2005 නොවැම්බර් 19 දින දක්වා එම ධුරය දැරූ බව පාර්ලිමේන්තු වාර්තා අනාවරණය කරයි.

මෙම ජනාධිපතිවරණයේ අවසන් රැළි පැවැත්වූයේ 1999 දෙසැම්බර් 18 දින ය. එදින ජනාධිපතිවරියගේ අවසන් රැළිය කොළඹ නගර සභා පිටියේදී පැවැත්විණි. එහිදී ඇය වේදිකාවෙන් බැස නිල රථයට පැමිණීමට සූදානම් වන විට එල්.ටී.ටී.ඊ බෝම්බකරුවකුගේ ප්‍රහාරයක් එල්ල විය. ඒ හේතුවෙන් ඇයගේ ඇසකට තුවාල සිදුවිය. ඇයගේ දෙවැනි ධුර කාලය සඳහා දිවුරුම් දීම 2000 වසරේ නොවැම්බර් 09 දින සිදු කළ හැකි ව තිබුණ ද චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරණතුංග මහත්මිය ජනාධිපති ලෙස 1999 දෙසැම්බර් 22 දින අග විනිසුරුවරයා ඉදිරියේ දිවුරුම් දී තිබේ.

ශ්‍රී ලංකාවේ පස් වැනි ජනාධිපතිවරණය සඳහා ඡන්ද විමසීමේ දිනය ලෙස මැතිවරණ කොමසාරිස්වරයා 2005 නොවැම්බර් 17 දින ප්‍රකාශයට පත් කළේ ය. පිළිගත් දේශපාලන පක්ෂ 14ක් අපේක්ෂකයන් සඳහා ඇප තැන්පත් කළ ද නාම යෝජනා භාර දී ඇත්තේ 13 දෙනකු පමණි. මහින්ද රාජපක්ෂ, රනිල් වික්‍රමසිංහ, වික්ටර් හෙට්ටිගොඩ යන මහත්වරුන් ඇතුළු පිරිසක් ඒ අතර වූහ. මේ ඡන්ද විමසීමෙන් ඡන්ද 4,887,152ක්, එනම් 50.2%ක ඡන්ද ප්‍රතිශතයක් ලබා ගනිමින් මහින්ද රාජපක්ෂ මහතා ජනාධිපති ධුරයට පත් වූයේ ශ්‍රී ලංකාවේ පස් වැනි විධායක ජනාධිපතිවරයා ලෙස ය.

මෙම ජනාධිපතිවරණයේදී මාධ්‍ය උපමාන උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් මතු වූ කරුණු සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවට හා ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවට ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පළමු වැනි පංතියේ නිලධාරියකු වූ අශෝක පීරිස් මහතා පත් කළ බව මැතිවරණ කොමිසමේ ප්‍රකාශනයක් වන



ඩී. බී. විජේතුංග මහතා දිව්රුම් දෙමින්



චන්ද්‍රිකා බණ්ඩාරනායක මහත්මිය දිව්රුම් දෙමින්

'කතිරයේ බලය' ප්‍රකාශනයේ සඳහන් වේ. මෙම ජනාධිපතිවරණයට ඉදිරිපත් වූ අගමැති මහින්ද රාජපක්ෂ මහතා ජනතා විමුක්ති පෙරමුණ හා ජාතික හෙළ උරුමය සමග ගිවිසුම්ගත වූ බව 'ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරණ ඉතිහාසය' ග්‍රන්ථයේ සඳහන් කර තිබේ.

පළමු ධුර කාලය අවසන් වීමට පෙර මීළඟ ජනාධිපතිවරණය පැවැත්වීම සඳහා ජනාධිපතිවරයාගේ අභිලාෂය 2009 නොවැම්බර් මස 23 දින ප්‍රකාශයට පත් කෙරුණු හෙයින් එම ශ්‍රී ලංකාවේ හය වැනි ජනාධිපතිවරණය ලෙස එය පැවැත්වුණේ 2010 ජනවාරි මස 20 දින ය. ඒ සඳහා පිළිගත් දේශපාලන පක්ෂ 66ක් අතුරෙන් පක්ෂ 18කින් හා ස්වාධීන අපේක්ෂකයන් 05 දෙනකු ඇප මුදල් තැන්පත් කර තිබුණි. එක් නාම යෝජනා පත්‍රයක් ප්‍රතික්ෂේප වීම හේතුවෙන් අපේක්ෂකයන් 22ක් ජනාධිපතිවරණයට ඉදිරිපත් වූහ. ඒ අතර මහින්ද රාජපක්ෂ, සරත් ෆොන්සේකා, එම්.කේ ශිවාජිලිංගම් යන මහත්වරු සහ බත්තරමුල්ලේ සීල රතන හිමියෝ ද වූහ. මෙම ඡන්ද විමසීමේදී ඡන්ද 6,015,934ක් ලබා, එනම් ඡන්ද 57.8%ක ප්‍රතිශතයක් ලබාගත් මහින්ද රාජපක්ෂ මහතා දෙවැනි වරටත් විධායක ජනාධිපතිවරයා ලෙස යළි එම ධුරයට පත් විය. මෙම මැතිවරණයේ විශේෂිත ලක්ෂණය වූයේ සේනාධිනායක ජනපති මහින්ද රාජපක්ෂ මහතා සහ හිටපු යුද හමුදාපති සරත් ෆොන්සේකා මහතා ප්‍රධාන ප්‍රතිවාදීන් දෙදෙනා ලෙස මැතිවරණයට ඉදිරිපත් වීම ය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 18 වැනි සංශෝධනයට අනුව ධුර කාලයෙන් වසර 04ක් ගත වූ පසුව යළිත් ජනවරමක් ලබා ගැනීම සඳහා ජනාධිපතිවරයාට අභිලාෂය ප්‍රකාශ කිරීමේ හැකියාව තිබිණ. ඒ අනුව තුන් වැනි වරටත් ජනාධිපති ධුරයට ඉදිරිපත් වීමට මහින්ද රාජපක්ෂ මහතා තීරණය කළේ ය. එම අභිලාෂය ඔහු 2014 නොවැම්බර් මස 20 දින ප්‍රකාශයට පත් කළ අතර මැතිවරණ කොමසාරිස්වරයා විසින් මෙරට හත් වැනි ජනාධිපතිවරණය සඳහා 2015 ජනවාර් 08 දින නියම කරනු ලැබී ය. අපේක්ෂකයන් 19 දෙනකු එම ජනාධිපතිවරණයට ඉදිරිපත් වූ අතර මහින්ද රාජපක්ෂ, මෛත්‍රීපාල සිරිසේන, දුමින්ද නාගමුව, බත්තර මුල්ලේ සීලරතන හිමි ඇතුළු පිරිස ඊට අයත් වූහ. මෙහිදී ඡන්ද 6,217,162ක් ලබාගත් මෛත්‍රීපාල සිරිසේන මහතා ජනාධිපති ධුරයට පත් වුණේ 51.28%ක ඡන්ද ප්‍රතිශතයක් ලබමිනි. ඒ, ශ්‍රී ලංකාවේ හය වැනි විධායක ජනාධිපතිවරයා වශයෙනි. මෙහිදී අපේක්ෂකයන් 17 දෙනකුගේ ඇප මුදල් රාජසන්තක වී තිබේ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපතිවරයා සහ ලේකම්වරයා ප්‍රතිවාදීන් ලෙස තරග කිරීම මෙම ජනාධිපතිවරණයේ විශේෂත්වයකි. ඒ අනුව මෛත්‍රීපාල සිරිසේන මහතාගේ ජනාධිපති ධුර කාලය වූයේ 2015 ජනවාරි 09 සිට 2019 නොවැම්බර් 16 දක්වා ය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වැනි සංශෝධනය අනුව ධුර කාලය වසර පහකට සීමා කර තිබීම එයට හේතුවයි.

ඡන්ද අපේක්ෂකයන් 35 දෙනකු නාමයෝජනා භාර දුන් ශ්‍රී ලංකාවේ අට වැනි ජනාධිපතිවරණය පැවැත්වුණේ 2019 නොවැම්බර් 16 දින ය. ගෝඨාභය රාජපක්ෂ, සජිත් ප්‍රේමදාස සහ අනුර කුමාර දිසානායක යන මහත්වරු ඒ අතර සිටියහ. මෙහිදී ඡන්ද 6,924,225ක් ලබා ගත් ගෝඨාභය රාජපක්ෂ මහතා මෙරට හත් වැනි විධායක ජනාධිපතිවරයා ලෙස පත් විය. ප්‍රතිශතාත්මක ව ඔහුට ඡන්ද 52.25%ක් හිමි විය. එහෙත් රටේ මතු වූ විවිධ අස්ථාවර තත්ත්ව හමුවේ ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයාට සිදු වූයේ සිය ධුර කාලය සම්පූර්ණ කිරීමට පෙර ඉල්ලා අස්වීමට ය. ඔහු සිය ධුරයේ සිටියේ 2019 නොවැම්බර් මස 17 දින සිට 2022 ජූලි මස 14 දින දක්වා පමණි. ගෝඨාභය රාජපක්ෂ මහතා සිය ධුරයෙන් ඉල්ලා අස්වීමත් සමග එවකට අගමැති රනිල් වික්‍රමසිංහ මහතා වැඩ බලන ජනාධිපතිවරයා ලෙස දිවුරුම් දුන්නේ 2022 ජූලි මස 20 දින දක්වා ය.



මහින්ද රාජපක්ෂ මහතා දිවුරුම් දෙමින්



මෛත්‍රීපාල සිරිසේන මහතා දිවුරුම් දෙමින්



ගෝඨාභය රාජපක්ෂ මහතා දිවුරුම් දෙමින්



රනිල් වික්‍රමසිංහ මහතා දිවුරුම් දෙමින්

එදින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පවතින ප්‍රතිපාදන මත පාර්ලිමේන්තුව විසින් ඔහු ජනාධිපති ධුරය සඳහා තෝරාපත් කරගන්නා ලද අතර රනිල් වික්‍රමසිංහ මහතා ජනාධිපති ධුරයට පත් වුණේ මෙරට අට වැනි විධායක ජනාධිපතිවරයා ලෙස ය. මේ සඳහා අපේක්ෂකයන් ලෙස රනිල් වික්‍රමසිංහ මහතා සමග ඩලස් අලහප්පෙරුම සහ අනුර කුමාර දිසානායක යන මහත්වරු ඉදිරිපත් වූහ. මෙහිදී පාර්ලිමේන්තුවේ පැවති ඡන්ද විමසීමේදී රනිල් වික්‍රමසිංහ මහතාට ඡන්ද 134ක් හිමි විය.

### නව වැනි ජනාධිපතිවරණය

මෙරට නව වැනි ජනාධිපතිවරණය 2024 සැප්තැම්බර් 21 දින පැවැත්වෙනු ඇත්තේ ශ්‍රී ලංකාවේ නව වැනි විධායක ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීමට ය. වත්මන් ජනාධිපති රනිල් වික්‍රමසිංහ, සජිත් ප්‍රේමදාස, අනුර කුමාර දිසානායක, නාමල් රාජපක්ෂ ඇතුළු අපේක්ෂකයන් 39 දෙනකු ප්‍රධාන දේශපාලන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම් නියෝජනය කරමින් ඒ සඳහා නාම යෝජනා භාර දී තිබේ. එහෙත් ඡන්ද අපේක්ෂකයකු ලෙස ඉදිරිපත් ව සිටි මොහොඩ් ඉල්ලියාස් මහතා අගෝස්තු 22 දින හෘදයාබාධයකින් මිය යාම හේතුවෙන් ඡන්ද අපේක්ෂක සංඛ්‍යාව 38ක් බවට පත් ව ඇත. ඔහු වෙනුවට වෙනත් ආදේශකයකු ජනාධිපතිවරණයට ඉදිරිපත් කිරීමට හැකි බවත් ඡන්ද පත්‍රිකාවේ මොහොඩ් ඉල්ලියාස් මහතාගේ ඡන්ද සලකුණ සහ නම මුද්‍රණය කර ඇති බැවින් එය වෙනස් නොවන බවත් මැතිවරණ කොමිෂන් සභාවේ සභාපති සමන් ශ්‍රී රත්නායක මහතා ප්‍රකාශ කරයි.

මේ අනුව ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරණ ඉතිහාසය පිරික්සන විට පෙනී යන්නේ ජනතා ඡන්දයෙන් තේරී පත් වන ජනාධිපතිවරු මෙන් ම අනුප්‍රාප්තික ජනාධිපතිවරු ද සිට ඇති බවයි. තම කතිරයේ බලය යොදමින් පවතින සමාජ, ආර්ථික හා දේශපාලන තත්ත්ව මත රට නිවැරදි දිශාවකට යොමු කළ හැකි නායකයකු තොරා ගැනීමට ජනතාව වරින් වර ක්‍රියා කර තිබේ. කෙසේ වෙතත් තව නොබෝ දිනකින් ශ්‍රී ලාංකික ජනතාවට ලැබෙනු ඇත්තේ ද තම කතිරයේ බලයෙන් රටේ අනාගත දැක්ම තීරණය කිරීමට ය.



# මැතිවරණ නීති යාවත්කාලීන වීම අවශ්‍යතාවක්



**සමන් ශ්‍රී රත්නායක**
කොමසාරිස් ජනරාල්
ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාව

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තුන් වැනි ව්‍යවස්ථාවේ තිබෙනවා "ජනරජයේ පරමාධිපත්‍ය බලය ජනතාව සතු විය යුතු ය. අන්සතු කළ නොහැක්කේ ය" යන්න. මෙම පරමාධිපත්‍ය බලය ක්‍රියාවට නංවන්නේ කෙසේද? යන්න එහි හතර වැනි ව්‍යවස්ථාවේ සඳහන්. ඒ අනුව විධායකය ලෙස ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීමට ජනාධිපතිවරණයත් ව්‍යවස්ථාදායකය ලෙස පාර්ලිමේන්තු නියෝජිතයන් තෝරා පත් කර ගැනීමට පාර්ලිමේන්තු මැතිවරණයක් පැවැත්වෙනවා.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් වෙනවා මැතිවරණ කොමිෂන් සභාවට පැවරෙන බලතල. එම බලතල අනුව අදාළ මැතිවරණ පැවැත්වීමේ වගකීම තිබෙන්නේ ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාවට. මැතිවරණ සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව සම්මත කරන ලද පනත් පහ අතුරෙන් 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරාපත් කරගැනීම පිළිබඳ පනත අනුවයි ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාවට ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීමේ මැතිවරණය පැවැත්වීමට බලය ලැබෙන්නේ.

ජනාධිපතිවරයාගේ ධුර කාලය වසර 05ක්. ඊට පෙර එම ධුර කාලය අහෝසි වන්නේ නැහැ. 2022 වර්ෂයේ ජනාධිපතිවරයා ඔහුගේ ධුරයෙන් ඉවත් වුවත් ධුර කාලය ඉවත් නොවීමෙන් එම කාරණය තහවුරු වනවා. එවැනි අවස්ථාවක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් වනවා. එම ධුරයේ කටයුතු කිරීමට අනුප්‍රාප්තික ජනාධිපතිවරයකු පත්කර ගත යුතුයි යන්න. එම අනුප්‍රාප්තික ජනාධිපතිවරයාගේ ධුර කාලය වන්නේ පෙර සිටි ජනාධිපතිවරයාගේ වසර 05ක ධුර කාලය. ඉන් එහාට එම ධුර කාලය ගමන් කරන්නේ නැහැ. ඒ නිසා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ බලතල අනුව ජනාධිපතිවරයාගේ ධුර කාලය ඉකුත් වීමට මසකට කලින් සහ මාස 02කට නොවැඩි කාලයක් තුළ ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීමේ ඡන්දය විමසීම ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාව කළ යුතුයි.

08 වැනි විධායක ජනාධිපතිවරයාගේ ධුර කාලය 2024 නොවැම්බර් 17 අවසන් වන නිසා සැප්තැම්බර් 16 සහ ඔක්තෝබර් 17 (ධුර කාලය ඉකුත් වීමට මසකට කලින් සහ මාස 02කට නොවැඩි කාලයක්) අතරතුර දිනයකදී ජනාධිපතිවරණ ඡන්ද විමසීම පැවැත්විය යුතු වනවා. ඒ අනුවයි සැප්තැම්බර් 21 දින ජනාධිපතිවරණය පැවැත්වීමට තීරණය වන්නේ.

මේ සඳහා නාම යෝජනා භාර ගන්නා දිනයත් මැතිවරණය පවත්වන දිනයත් එක ම ගැසට් නිවේදනයකින් අප ප්‍රකාශයට පත් කළා. එහෙත් අනෙකුත් මැතිවරණ සඳහා නාම යෝජනා භාර ගැනීම එක් ගැසට් පත්‍රයකින් සහ මැතිවරණය පැවැත්වීම තවත් ගැසට් පත්‍රයකින් වශයෙන් ප්‍රකාශයට පත් කිරීමයි සාමාන්‍ය ක්‍රමවේදය.

මැතිවරණය ප්‍රකාශයට පත් කර දින 16-21ත් අතර දිනයකදී උදෑසන 9.00 සිට 11.00 දක්වා නාමයෝජනා භාර ගැනීම ව්‍යවස්ථා ප්‍රකාර ව කළ යුතු නිසා ජූලි 26 දින අප ගැසට් නිවේදනයෙන් ප්‍රකාශයට පත් කළේ අගෝස්තු 15 දින නාම යෝජනා භාර ගැනීමට. ඒ අනුව නාම යෝජනා භාරගෙන අවසන්. නාම යෝජනා භාර ගැනීමෙන් පසු සති 4-6ත් (දින 28-42 අතර) දිනයක මැතිවරණය පැවැත්විය යුතුයි. ඒ අනුව සැප්තැම්බර් 21 දින ජනාධිපතිවරණය පැවැත්වෙනවා.

මෙවර ඡන්දය සලකුණු කිරීමේ ක්‍රමවේදය පිළිබඳ ඡන්ද දයකයන් දැනුවත්වීම ඉතා වැදගත්. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පැහැදිලි ව සඳහන් වෙනවා ඡන්දය සලකුණු කිරීමේ සාමාන්‍ය ක්‍රමවේදය හින්දු අරාබි ඉලක්කම් 1, 2, 3 බව. එනම් ඡන්දය 01 ලෙසත් මනාප 02 සහ 03 ලෙසත් සලකුණු කළ යුතු වෙනවා. එහෙත් ඡන්දය සඳහා ජනතාවගේ භාවිතය වන්නේ කතිරය යෙදීම නිසා 01 වෙනුවකට යම්කිසි පුද්ගලයකු ඡන්දය ප්‍රකාශ කිරීමට කතිරය පමණක් සලකුණු කළ හැකියි. එහෙත් පුද්ගලයකුට මනාපය ප්‍රකාශ කිරීමේ අදහසක් තිබේනම් අනිවාර්යයෙන් ම ඔහු ඡන්දය ලෙස සලකුණු කළ යුත්තේ 01, 02, 03 ආදී වශයෙන් හින්දු අරාබි ඉලක්කම්. කිසිදු අවස්ථාවක ඡන්දය කතිරයෙනුත් 01, සහ 02 මනාප ලෙසත් සලකුණු කරන්නට ඡන්දදායකයාට බැහැ. එවිට එම ඡන්දය අවලංගු වනවා.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් වන්නේ කිසිදු ඡන්ද අපේක්ෂකයකුට 50%ක ඡන්ද සංඛ්‍යාවක් ලබා ගත නොහැකි වුවහොත් වැඩි ම ඡන්ද සංඛ්‍යාවක් ලබා ගත් අපේක්ෂකයන් දෙදෙනා

මෙවර ඡන්දය සලකුණු කිරීමේ ක්‍රමවේදය පිළිබඳ ඡන්ද දායකයන් දැනුවත්වීම ඉතා වැදගත්. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පැහැදිලි ව සඳහන් වෙනවා ඡන්දය සලකුණු කිරීමේ සාමාන්‍ය ක්‍රමවේදය හින්දු අරාබි ඉලක්කම් 1, 2, 3 බව. එනම් ඡන්දය 01 ලෙසත් මනාප 02 සහ 03 ලෙසත් සලකුණු කළ යුතු වෙනවා. එහෙත් ඡන්දය සඳහා ජනතාවගේ භාවිතය වන්නේ කතිරය යෙදීම නිසා 01 වෙනුවකට යම්කිසි පුද්ගලයකු ඡන්දය ප්‍රකාශ කිරීමට කතිරය පමණක් සලකුණු කළ හැකියි.

හැර ඉතිරි සියලු දෙනා ඉවත් කර, ඔවුන් වෙනුවෙන් ඡන්දය සලකුණු කළ ඡන්ද පත්‍රිකාවල තරගයේ සිටින අපේක්ෂකයන් දෙදෙනාට අදාළ ව මනාප සලකුණු කර තිබුණහොත් එම මනාප සලකුණු කළ ඡන්ද පත්‍රිකා ඔවුන් දෙදෙනාගෙන් ජයග්‍රාහී අපේක්ෂකයා තෝරා ගැනීමට යොදා ගත යුතු බව. ඒ අනුව එහිදී අනෙකුත් සියලු ඡන්ද අපේක්ෂකයන්ගේ ඡන්ද පත්‍රිකාවල ඇති තරගයේ සිටින අපේක්ෂකයන් දෙදෙනාගේ මනාප ගණනය කර, ඔවුන් ලබාගෙන ඇති වැඩි ම ඡන්ද සංඛ්‍යාව සලකා බලා ජයග්‍රාහකයා තෝරා ගන්නවා.

මෙවර ජනාධිපතිවරණය සඳහා අපේක්ෂකයන් 39 දෙනකු ඉදිරිපත් ව සිටීම සමාජයේ කතාබහට ලක් වූ කාරණයක් වුවත් එම සංඛ්‍යාව අඩු කිරීමේ නීත්‍යානුකූල හැකියාවක් ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාවට නැහැ. පාර්ලිමේන්තුවයි මේ සම්බන්ධ නීති සකසන්නේ. මැතිවරණ කොමිෂන් සභාව ඇතුළු සිවිල් සංවිධාන මේ සම්බන්ධයෙන් යම් පියවරක් ගත යුතු ය යන අදහසේ සිටිනවා මෙන් ම ඒ පිළිබඳ යෝජනා ද ඉදිරිපත් කර තිබෙනවා. එය නීතියක් බවට පත්කර ගත යුත්තේ පාර්ලිමේන්තුව. මීට පෙර පාර්ලිමේන්තුවේ කාරක සභා ගණනාවක් තිබුණා මැතිවරණ කොමිෂන් සභාවේ හිටපු සභාපතිවරයාගේ ප්‍රධානත්වයෙන්. එහි යම් යම් යෝජනා තිබුණා මේ සම්බන්ධයෙන්. එලෙස නීති සම්මත කර ගන්නාතාක් කල් මැතිවරණ කොමිෂන් සභාවට පැවරෙන්නේ පවතින නීතිය අනුව ක්‍රියා කිරීමට. ඒ නිසා මැතිවරණ නීති යාවත්කාලීන වීම අවශ්‍යතාවක්.

1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරාපත් කරගැනීම පිළිබඳ පනත අනුව දේශපාලන පක්ෂ අපේක්ෂකයකු ඇප මුදල් ලෙස තැන්පත් කළ යුත්තේ රුපියල් 50,000ක්. ස්වාධීන අපේක්ෂකයකුට එය රුපියල් 75,000ක්. මේ මුදල් ප්‍රමාණය දේශපාලන පක්ෂ අපේක්ෂකයකුට රුපියල් ලක්ෂ 25ක් සහ ස්වාධීන අපේක්ෂකයකුට රුපියල් ලක්ෂ 30ක් ලෙස සංශෝධනය කිරීමට අප කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළා. එයට කැබිනට් අනුමැතිය ලැබුණත් නීතියක් ලෙස සම්මත වී නොමැති නිසා එය ක්‍රියාත්මක කරන්නට බැහැ. ඡන්ද අපේක්ෂකයන් සඳහා පවතින ඇප මුදලේ අඩු වටිනාකමත් ඇතැම්

# මැතිවරණ වියදම් පාලනය
# ප්‍රමුඛ අරමුණක්



**නීතිඥ බී. පී. සී. කුලරත්න**
අතිරේක මැතිවරණ කොමසාරිස් (නීති/
විමර්ශන හා සැලසුම්)
ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාව

2023 අංක 03 දරන මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනත හඳුන්වා දුන්නේ ප්‍රධාන පනත් 4ක් ඉලක්ක කරගෙන. පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ පනත, පළාත් සභා ඡන්ද විමසීමේ පනත, පාර්ලිමේන්තු මැතිවරණ පනත සහ ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීමේ පනත ඊට අයත්.

මැතිවරණ අපේක්ෂකයන් මැතිවරණයේදී දරන වියදම් සම්බන්ධයෙන් මෙතෙක් නොතිබූ නෛතික පදනමක් මැතිවරණ වියදමට, වියදම් නියාමනයට මේ පනතෙන් ලැබෙනවා. මෙතෙක් මැතිවරණයට තරග කරන අපේක්ෂකයන් සම්බන්ධයෙන් මුදල් පදනම් කරගෙන තිබුණේ අසමතුලිත තත්ත්වයක්. එය ඉවත් කර මැතිවරණය සඳහා තරග කිරීමට සම බිමක් නිර්මාණය කර දීමට මෙහිදී හැකියාව ලැබෙනවා.

අපේක්ෂකයන්ට වියදම් කිරීම සඳහා ලැබෙන පරිත්‍යාග, දයකත්ව හා ඒවායේ මූලාශ්‍ර පිළිබඳ විනිවිදභාවයක් ඇති කිරීම මේ පනතේ අරමුණක්. එසේ ම මැතිවරණ වියදම් පාලනය හා එහි විනිවිදභාවයක් ඇති කිරීමටත් රාජ්‍ය දේපළ අවභාවිතය වැළැක්වීමටත් මේ පනත ක්‍රියාත්මක කිරීමෙන් හැකි වෙනවා.

මැතිවරණයක් සඳහා තරග වදින අපේක්ෂකයකුට, දේශපාලන පක්ෂයකට හා ස්වාධීන කණ්ඩායමකට සිය ප්‍රවර්ධනය සඳහා කරන ප්‍රචාරණයට වැය කළ හැකි උපරිම වියදම් සීමාවක් තිබෙනවා. එය හැඳින්වෙන්නේ 'අවසර ලත් මුදල' යනුවෙන්. එය සකස් වන්නේ ප්‍රධාන කාරණා 2ක් පදනම් කරගෙන. ඒ, ගණනය කිරීමේ මුදලක් තිබීම සහ එය ඡන්ද හිමියන් සංඛ්‍යාවෙන් වැඩි කිරීම යනුවෙන්. එම අවසරලත් මුදල ශ්‍රී ලංකා රුපියල්වලින් ගණනය කළ යුතු බවයි පනතේ සඳහන් වන්නේ.

අවසරලත් මුදල තීරණය කිරීමේදී සලකා බැලිය යුතු කාරණා තුනක් තිබෙනවා. මෙහිදී මැතිවරණයට තරග කිරීමට නාම යෝජනා භාරදී ඇති අපේක්ෂකයන්, දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම්වලින් මේ මුදල පිළිබඳ විමසීම කළ යුත්තක්. ජනාධිපතිවරණයේදී නම් තරග වදින සියලු ම අපේක්ෂකයන්ගෙන් ඒ පිළිබඳ විමසීම කළ යුතුයි. ශ්‍රී ලංකාවේ පවත්නා උද්ධමන අනුපාතිකය හා පාරිභෝගික මිල දර්ශකය සැලකිල්ලට ගැනීමත් මෙහිදී සලකා බැලිය යුතු කාරණයක්.

මැතිවරණ කොමිෂන් සභාව මේ කාරණා විශ්ලේෂණය කර තීරණය කළා ඒ සඳහා සූත්‍රයක් සැකසීමට. මේ සඳහා එක් ඡන්ද හිමියකුගේ භූගෝලීය ප්‍රමාණය, ජනඝනත්වය සහ ඡන්ද හිමියන් සඳහා මූලික ප්‍රචාරණ වියදම් සැලකිල්ලට ගත්තා. මේ සඳහා ගැළපෙන මුදලක් තීරණය කිරීම වැදගත්.

සාමාන්‍යයෙන් මැතිවරණයකදී වියදම් කිරීමට නීත්‍යානුකූල ව අවසර ලැබෙන ප්‍රවේශ 04ක් තිබෙනවා. ඒ අනුව මාධ්‍ය, රැස්වීම් පැවැත්වීම, කාර්යාල විවෘත කිරීම සහ අත්පත්‍රිකා බෙදීම සඳහා පමණයි වියදම් කිරීමට නීත්‍යානුකූල අවසරය හිමි වන්නේ.

ජනාධිපතිවරණයක් නම් ඡන්ද හිමියකු වෙනුවෙන් වැය කළ හැකි මුදල වන්නේ රුපියල් 109.00ක්. පළාත් පාලන මැතිවරණයකදී මේ මුදල රුපියල් 20.00ක් ලෙස ගණනය කර තිබුණා. ඒ අනුව මෙවර ජනාධිපතිවරණයේදී ඡන්ද හිමියකු වෙනුවෙන් වැය කළ හැකි අවසර ලත් මුදල (රුපියල් 109.00 x 17140354) රුපියල් 1,868,298,586.00ක්. මේ මුදල කොටස් දෙකකට බෙදෙනවා. ඒ, ඡන්ද හිමියකු වෙනුවෙන් අපේක්ෂකයකුට 60%ක් සහ දේශපාලන පක්පක්ෂයකට 40%ක් වශයෙන් වියදම්

මැතිවරණයක් සඳහා තරග වදින අපේක්ෂකයකුට, දේශපාලන පක්ෂයකට හා ස්වාධීන කණ්ඩායමකට සිය ප්‍රවර්ධනය සඳහා කරන ප්‍රචාරණයට වැය කළ හැකි උපරිම වියදම් සීමාවක් තිබෙනවා. එය හැඳින්වෙන්නේ 'අවසර ලත් මුදල' යනුවෙන්. එය සකස් වන්නේ ප්‍රධාන කාරණා 2ක් පදනම් කරගෙන. ඒ, ගණනය කිරීමේ මුදලක් තිබීම සහ එය ඡන්ද හිමියන් සංඛ්‍යාවෙන් වැඩි කිරීම යනුවෙන්. එම අවසරලත් මුදල ශ්‍රී ලංකා රුපියල්වලින් ගණනය කළ යුතු බවයි පනතේ සඳහන් වන්නේ.

දැරීමට. මේ සඳහා පදනම් කරගන්නේ නාම යෝජනා භාර දුන් අගෝස්තු 15 සහ සැප්තැම්බර් 21 දක්වා අතර කාලය.

මෙලෙස දරන සියලු වියදම්, වියදම් වාර්තාවලට ඇතුළත් කළ යුතු වෙනවා. 2023 අංක 03 දරන මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනතේ 6 (1) වගන්තිය අනුව භාරගත් පරිත්‍යාග හෝ දායකත්ව, තහවුරු කිරීමේ ලේඛන සහිත සියලු දෛනික වියදම් ඇතුළත් වාර්තා සහ වියදම් තහවුරු කරන දිවුරුම් ප්‍රකාශ ඉදිරිපත් කළ යුතුයි. මේ තොරතුරු සත්‍ය හා නිවැරදි බවට තහවුරු කර, වියදම් වාර්තාව දින 21ක් ඇතුළත අදාළ තේරීම් භාර නිලධාරියා වෙත (මැතිවරණ කොමිෂන් සභාවට) භාරදීම කළ යුත්තක්. මේ ලැබෙන සියලු වාර්තා මැතිවරණ කොමිෂන් සභාව විසින් සුදුසු ස්ථානයකදී ජනතාවට ප්‍රදර්ශනය කරනු ලබනවා දින 10ක් ඇතුළත. ජනතාවට, නිරීක්ෂණ සංවිධානවලට එම ස්ථාන වෙත පැමිණ තමා සන්තක තොරතුරු සමග වියදම් වාර්තා සසඳා බලා, අදාළ වියදම් තොරතුරු ඇතුළත් ව නැත්නම් මැතිවරණ කොමිෂන් සභාවට හෝ පොලීසියට සාක්ෂි සහිත ව පැමිණිලි කරන්න පුළුවන්.

අපේක්ෂකයකුට තම මැතිවරණ කාර්ය සඳහා පරිත්‍යාගය ලබා ගත නොහැකි අවස්ථා පනතේ සඳහන් කර තිබෙනවා. අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා සංස්ථාවලින් එලෙස පරිත්‍යාග ලබා ගන්නට බැහැ. විදේශ රාජ්‍ය සංවිධානවලින්, විදේශ කොටස් හිමිකාරත්වය 50%ට වැඩි සංවිධානවලින් මෙන් ම අනන්‍යතාව හෙළි නොකරන කිසි ම තැනැත්තකුගෙන් මුදල් ලබා ගන්නට බැහැ. එසේ ම උපරිම වියදම් සීමාව ඉක්මවා තිබීමත් දින 21ක් ඇතුළත වියදම් වාර්තා ලබා නොදීම හා වියදම් වාර්තා නොගැළපීමත් නිසා නීති විරෝධී ක්‍රියාවලට ඔවුන් වැරදිකරුවන් වෙනවා. ඔවුන්ට ලැබෙන දඬුවම් ද පනතේ සඳහන්. ඒ අනුව මහාධිකරණයේ නඩු පැවරීමෙන් රුපියල් ලක්ෂය දක්වා දඩ මුදල් නියම කරන්නට පුළුවන්. වසර 03ක් ඡන්ද හිමියකු ලෙස ලියාපදිංචි වීමට නොහැකිවීමත් ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වීමත් ඒ අතර වෙනවා. යම් ආයතනයකට තේරී පත්වුවකු නම් ඔහුගේ සභික ධුරය හෝ මන්ත්‍රී ධුරය අහෝසි වීමත් එම දඬුවම් අතරට අයත්. —



# මැතිවරණයක ජනතා සහභාගිත්වය ඉතා වැදගත්

**මහාචාර්ය ඔෂාන්ත එන් තල්පාවිල**
අංශ ප්‍රධාන
දේශපාලන විද්‍යා අධ්‍යයනාංශය
කැලණිය විශ්වවිද්‍යාලය

ප්‍රජාතන්ත්‍රවාදය යනු ජනතාවගේ පාලනයක්. ග්‍රීසියෙන් ආරම්භ වී එය ලොව පිළිගත් පාලන තන්ත්‍රයක් බවට පත්වනවා. ග්‍රීසියේ තිබූ ක්‍රමයක් වන්නේ රටේ පාලනය තීන්දු කිරීම සඳහා පුරවැසියන් ඒකරාශී වී පාලන ක්‍රමයට සෘජු ව සහභාගී වීම. එයයි සෘජු ප්‍රජාතන්ත්‍රවාදය. මෙය ක්‍රමයෙන් වෙනස් වනවා ජනගහනය වර්ධනය හා ලෝකයේ ඇතිවන විවිධ තත්ත්ව හේතුවෙන්. පසු ව ජනතාව වෙනුවෙන් නියෝජිතයන් පත් කර අවශ්‍ය තීන්දු ගැනීමේ නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය නැමැති සංකල්පය නිර්මාණය වනවා. අද වන විට එය ලොව ඉහළින් ම පිළිගැනෙන්නක්. පාර්ලිමේන්තුව යනු එම මහජන නියෝජිතයන් රැස්වන ස්ථානය.

ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීම හා පවත්වාගෙන යාම සම්බන්ධයෙන් මහජන නියෝජිතයන් පත් කර ගැනීම හා මහජන කැමැත්ත මත පාලන තන්ත්‍රයක් පවත්වාගෙන යාම ඉතා වැදගත්. එහිදී නියෝජිතයන් හෝ පාලකයන් හෝ පත් කරන ප්‍රධානතම යාන්ත්‍රණය වන්නේ මැතිවරණය. මැතිවරණ පැවැත්වීම වැදගත් වන්නේ ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රධාන මූලධර්ම ආරක්ෂා කිරීමේ යාන්ත්‍රණය බවට එය පත් ව ඇති බැවින්. ආණ්ඩුව නිර්මාණය වන්නේ මැතිවරණයෙන් පත් වන නියෝජනයන්ගෙන්. මැතිවරණවලින් පමණක් එම කාර්යය ඉටු කරන්නට පුළුවන්. වෙනත් උපක්‍රම විවිධ රටවල භාවිත වුවත් එය ප්‍රජාතන්ත්‍රවාදයට පටහැණි වන'නක'. සාධාරණ මැතිවරණයකින් නියෝජිතයන් තෝරා ගැනීම පමණයි ප්‍රජාතන්ත්‍රවාදය අනුමත කරන්නේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ රාජ්‍ය නායකයා හා ආණ්ඩුවේ නායකයා වන ජනාධිපතිවරයා තෝරා පත්තර ගන්නේ වෙන ම පවත්වන මැතිවරණයකින්. මෙය පාර්ලිමේන්තු ක්‍රමයට වඩා වෙනස්. එනම් පාර්ලිමේන්තු ක්‍රමයක ක්‍රියාකාරී විධායකයා වන්නේ අගමැති. එම තනතුරට පත්වන්නේ පාර්ලිමේන්තු මැතිවරණයෙන් බහුතර ප්‍රතිඵලය ලබන පුද්ගලයා. අගමැති මෙන් ම ආණ්ඩුව පත්වන්නේ ද පාර්ලිමේන්තු මැතිවරණයෙන්.

එහෙත් මහජනතාවට හැකි වනවා රාජ්‍ය නායකයා මෙන් ම ආණ්ඩුවේ නායකයා වන ජනාධිපතිවරයා තමන්ගේ අභිමතය පරිදි පත්කර ගැනීමට. ශ්‍රී ලංකාවේ මෙය සිදු වන්නේ සෘජු ව ම මහජන ඡන්දයෙන්. ඇමරිකාව වැනි රටක එය සිදු වන්නේ ඡන්ද විද්‍යාල ක්‍රමයකින්.

ප්‍රජාතන්ත්‍රවාදී රටක මහජන පරමාධිපත්‍යය යනු වැදගත් සංකල්පයක්. රටේ පාලනය සම්බන්ධයෙන් සැබෑ බලය ඇත්තේ ජනතාවට. මහජන පරමාධිපත්‍යය මූලික වශයෙන් ක්‍රියාත්මක කරන ප්‍රධානතම අංගයක් වන්නේ ඡන්දය භාවිත කිරීම. සෘජු ව ම තම පාලකයා පත්කර ගැනීමේ මූලික බලය ඉන් ජනතාවට හිමි වන නිසා ආණ්ඩුවට ක්‍රියා කිරීමට සිදු වන්නේ ඒ අනුව. නීති සම්පාදනය ආදිය සිදු වන්නේ මහජන පරමාධිපත්‍යය මුල්කර ගනිමින්. මේ නිසා ජනතාවට විශාල වගකීමක් තිබෙනවා.

ඡන්දය භාවිත කිරීම එක්තරා ආකාරයක ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය ආරක්ෂා කිරීමට යොදාගත හැකි වැදගත් ක්‍රමවේදයක්. ඇතැම් මැතිවරණවලදී ජනතාව තම යුතුකම නිසි ලෙස ඉටු නොකරන්නේ තමන්ට ලැබී ඇති අවස්ථාවේ වටිනාකම පිළිබඳ අවබෝධය නොතිබීම ද නිසා. ආණ්ඩුව තීරණය කිරීමේ හැකියාව ගැන අවබෝධය ජනතාවට තිබිය යුතුයි. ජනතාව වෙත ලැබී ඇති මහජන පරමාධිපත්‍යය පිළිබඳ හැඟීමක් ඔවුන්ට තිබිය යුතුයි. එම නිසා මැතිවරණයකට

සහභාගි වීම ඉතා වැදගත්.

ඉතිහාසයේ රජවරුන් බලයට පත්වනවා ජනතාව කැමති වුවත් අකමැති වුවත්. රජවරුන්ට ඔවුන්ගේ අවශ්‍යතා ඉටුකර ගැනීමේ හැකියාවක් පැවතුණා. ඊට එරෙහි ව ජනතාවට විරෝධතා දක්වන්නත් බැහැ. එහෙත් ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයක ආණ්ඩුව තම අභිලාෂවලට එරෙහි ව ක්‍රියාත්මක වන්නේ නම් ඒ පිළිබඳ තීරණය කිරීමේ හැකියාව ජනතාව සතු ව තිබෙනවා. එනම් මැතිවරණයකදී ඡන්දය භාවිත කිරීමෙන් එම තීරණය ගන්නට පුළුවන්. එය ප්‍රතන්ත්‍රවාදයේ මූලික ලක්ෂණයක්. මැතිවරණ ක්‍රියාදාමයකින් තොර ව එවැනි දේ සිදුවීම ප්‍රජාතන්ත්‍රවාදය පිළිගන්නේ නැහැ. මෑතකාලීන ව බංග්ලාදේශයේ මෙන් ම ශ්‍රී ලංකාවේත් දක්නට ලැබුණේ මැතිවරණයකින් බලයට පත් වූ පාලකයන් වෙනත් ආකාරයේ විරෝධතා හෝ ක්‍රමවලින් පාලනයෙන් ඉවත් කිරීම. ප්‍රජාතන්ත්‍රවාදී රටක කළ යුතු වන්නේ එවැනි ප්‍රචණ්ඩක්‍රියාවලින් නොව මැතිවරණයේදී මහජන ඡන්දය නිසි ලෙස භාවිත කිරීමෙන් ඊට පිළිතුරු ලබා දීම.

ශ්‍රී ලංකාව මෑතකාලීන ව මුහුණදුන් ආර්ථික හා දේශපාලන අස්ථාවරත්වය පවතින පසුබිමකයි මේ මැතිවරණය පැවැත්වෙන්නේ. කොවිඩ් 19 වසංගතය මෙන් ම 2022 වසරේ ඇති වූ දේශපාලන පෙරළිය ඇතුළු කාරණා හේතුවෙන් යම් දේශපාලන අස්ථාවරත්වයක් ඇතිවුණා. ඒ සඳහා ප්‍රධාන ලෙස බලපෑවේ රටේ ආර්ථිකය දැඩි ලෙස බිඳ වැටීම. මේ තත්ත්වය යම් විදියකින් සමථයකට පත් කිරීමට හැකි වුවත් එය ස්ථිර විසඳුමක් බව තවමත් ප්‍රකාශ කරන්නට බැහැ. එසේ වන්නේ අප යම් ආකාරයක ආර්ථික අවදානමක සිටින නිසා. මේ අවදානම වළක්වා ගැනීම හා රටේ ආර්ථිකය ස්ථාවර කිරීම මැතිවරණයෙන් බලයට පත්වන පාලකයන්ට මුහුණදීමට සිදුවන ප්‍රධාන අභියෝගයක්. එම අභියෝගය බාර ගත හැකි සුදුසු නායකත්වයක් තීරණය කිරීමට ජනතාවට සිදුවනවා. එය මෙවර මැතිවරණයේ වඩා වැදගත් කරුණක්. ශ්‍රී ලංකාවේ විවිධ අවස්ථා යටතේ ජනාධිපතිවරණ පැවැත්වුණත් මෙවර මැතිවරණය සුවිශේෂ වන්නේ ආර්ථිකය ස්ථාපිත කිරීමට එම නායකත්වයට සිදුවන බැවින්.

රටක මැතිවරණයක් පැවැත්වෙන විට එයට දේශීය මෙන් ම විදේශීය මට්ටමෙන් බලපෑම් එල්ල වන්නට පුළුවන්. මැතිවරණ පැවැත්වීම හා ආණ්ඩුව බලයට පත්වීම අභ්‍යන්තර කරුණක් වුවත් වර්තමාන ලෝකයේ විවිධ කාරණා එහිදී ඉස්මතු වනවා. ලිබරල් ධනවාදය ව්‍යාප්ත වීමත් සමග ලොව ප්‍රබල රටවල් හා ප්‍රබල සංවිධාන පිළිගත් කරුණක් වන්නේ 'ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කිරීමට හා පවත්වාගෙන යාමට හැකි ආණ්ඩුවක් රටවල පිහිටුවිය යුතු ය' යන්න. මෙය හොඳින් අවබෝධ වන්නේ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවට වෙනත් මාර්ගවලින් බලයට පත් වූ විට හෝ එවැනි ආකාරයෙන් ක්‍රියා කරන විට හෝ ලොව ප්‍රබල රටවල් ඊට මැදිහත් වීම. එසේ ම ඔවුන් තම අසතුට පළ කරන ආකාරයත් දැක ගන්නට පුළුවන්. ඉරාකය වැනි රටවල ඒකාධිපති පාලන තත්ත්ව පෙරළා දැමීමට ලොව බලවත් රටවල් ක්‍රියාත්මක වුණා. ඇමරිකාව වැනි රටවල් මෙන් ම යුරෝපා ප්‍රජාවත් මේ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවේද පිළිබඳ අවධානය යොමු කර තිබෙනවා. ජගත් සංවිධානය වැනි ආයතනත් ඊට අයත්. කලාපීය මට්ටමෙන් ගතහොත් ඉන්දියාවේ ප්‍රධාන අභිලාෂය වන්නේ අනෙකුත්



රටවල ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වීම. පාකිස්තානය හා බංග්ලාදේශය වැනි රටවල ප්‍රජාතන්ත්‍රවාදී විරෝධී ක්‍රියා සිදුවන විට ඉන්දියාව ඊට දැඩි අප්‍රසාදය පළ කර තිබෙනවා. ශ්‍රී ලංකාව සම්බන්ධයෙනුත් එය පොදු තත්ත්වයක්.


මැතිවරණ ව්‍යාපාරයේදී විවිධ දේශපාලන පක්ෂ හා විවිධ පුද්ගලයන් තරග කරන විට ඔවුන්ට විවිධ මාර්ගවලින් සහාය පළ කරන අභ්‍යන්තර බලවේග තිබෙනවා. විවිධ ව්‍යාපාරිකයන්, මාධ්‍ය ආයතන හා සිවිල් සංවිධාන ඊට අයත්. ඔවුන් විසින් පිළිගන්නා අභිලාෂ බලයට පත්වන නායකයාගෙන් ඉටු කර ගැනීම මෙහි අරමුණක්. මැතිවරණ ව්‍යාපාරයකදී ශ්‍රී ලංකාවේ පවා හිමිකාරිත්වය අනුව මාධ්‍ය විවිධ අපේක්ෂකයන්ට පක්ෂපාතී වන ආකාරය දක්නට පුළුවන්. කිසිදු මාධ්‍යයක් අපක්ෂපාතී නැහැ. මාධ්‍ය ආයතන සතු දේශපාලන න්‍යාය පත්‍රය අනුව ක්‍රියා කරන ආකාරය දක්නට ලැබෙනවා. එය මාධ්‍ය සදාචාරයටත් ගැටලුවක්.

ව්‍යාපාරික ප්‍රජාවත් මුදල් පිරිනැමීමෙන් ඔවුන්ගේ මැදිහත්වීම සිදු කරනවා. දේශපාලන පක්ෂවලට පවා තම අභිමතය ක්‍රියාත්මක කිරීමට නොහැකි වන්නේ මේ බලපෑම් නිසා. එය ඡන්දය විකෘති වීමක් ලෙසත් පෙන්වා දෙන්නට පුළුවන්. ජනතාවට තම මතවාදය නිර්මාණය කර ගැනීමට මාධ්‍ය බලපෑම මූලික ලෙස ඉවහල් විය හැකියි. බහුජාතික සමාගම්වල රහසිගත ක්‍රියාමාර්ගත් මීට හේතුවක්.

ශ්‍රී ලංකාවේ මෙවර ජනාධිපතිවරණයේ දැකිය හැකි ප්‍රවණතාවක් වන්නේ අපේක්ෂකයන් විශාල පිරිසක් ඉදිරිපත් වීම. ඇමරිකාව වැනි ලොව ප්‍රබල රටවල ජනාධිපතිවරණයට ඉදිරිපත් වන්නේ පක්ෂ දෙකක් හෝ තුනක්. නියෝජිතයන් ඉදිරිපත් වන්නේ ජාතික මට්ටමින්. ඔවුන් යම් ආකාරයක ජාතික මට්ටමේ දේශපාලන බලයක් හිමි හා මතවාදයක් නිර්මාණය කළ හැකි පුද්ගලයන්. ශ්‍රී ලංකාවේ මෙවර ජනාධිපතිවරණයට විශාල සංඛ්‍යාවක් ඉදිරිපත් වුවත් එහි පදනම කුමක්ද? යන්න ගැටලුවක්.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ඕනෑ ම පුද්ගලයකුට ඡන්ද අපේක්ෂකයකු ලෙස ඉදිරිපත් වීමේ අවස්ථාව පැවතියත් ජනතාව අවබෝධ කරගත යුතු කරුණ වන්නේ ජාතික මට්ටමේ පිළිගත් දේශපාලන දර්ශනයක් ඇති අපේක්ෂකයන්ට තම ඡන්දය භාවිත කිරීම.

# වත්මන් මාධ්‍ය ක්‍රියාකාරිත්වය පරමාදර්ශී නැහැ






මහාචාර්ය
**ටියුඩර් වීරසිංහ**
ශ්‍රීපාලි මණ්ඩපය
කොළඹ විශ්වවිද්‍යාලය


නූතන සමාජයේ මාධ්‍ය සැලකෙන්නේ සමාජ පාලනයේ වැදගත් සාධකයක් ලෙස. දේශපාලන බලය හා සන්නිවේදනය අතර පවතින්නේ ද ඍජු සම්බන්ධතාවක්. සාමාන්‍ය වාතාවරණයකදී පවා ක්‍රියාකාරිත්වය ඉහළ මට්ටමක පවතින මාධ්‍යවල භූමිකාව ජාතික වශයෙන් වැදගත් අවස්ථාවක, එනම් මැතිවරණ වැනි සමයකදී සුවිශේෂ වනවා. ඒ පිළිබඳ සමාජයේ වැඩි වශයෙන් කතාබහට ලක්වනවා පමණක් නොව සමාජ අවධානය ද වැඩි වෙනවා.

දේශපාලන පක්ෂ කථිකයන්ගේ හා ඡන්ද දායකයන්ගේ ක්‍රියාකාරිත්වය පෙරට වඩා සක්‍රීය වන මැතිවරණ සමයකදී මාධ්‍ය තවදුරටත් තමන්ගේ බලය වර්ධනය කරගන්නවා. 21 වැනි සියවස වන විට සංහතික මාධ්‍යවලට අමතර ව නව මාධ්‍ය හෙවත් සමාජ මාධ්‍ය බිහි වී තිබෙන්නේ සංහතික මාධ්‍යයේ ම නූතන ස්වරූපයක් ලෙස. නව මාධ්‍යවල ක්‍රියාකාරිත්වය හේතුවෙන් මාධ්‍යයේ සමාජ බලය වර්ධනය වීමට හේතු නිර්මාණය වී තිබෙනවා. වර්තමානයේ මේ මාධ්‍ය පද්ධති දෙක එනම් නූතන මාධ්‍ය හා අන්තර්ජාලය ආශ්‍රිත නව මාධ්‍ය ක්‍රියාත්මක වන්නේ ඒකාබද්ධ ව. වර්තමාන, නූතන හා පශ්චාත් නූතන මාධ්‍ය පද්ධතිවල ඒකාබද්ධතාව නිසා දැවැන්ත තොරතුරු අවකාශයක් නිර්මාණය වී තිබෙනවා. ඒ අනුව පෙරට වඩා දක්නට ලැබෙන්නේ මාධ්‍යවල බලය වර්ධනය වීමක්.

මැතිවරණයකදී දේශපාලන බලය පවත්වාගෙන යාමට මෙන් ම බලය හැඩගැස්වීමේ ප්‍රධාන සාධකයක් ලෙසත් මාධ්‍යවල ඍජු සබඳතාවක් පවතිනවා. සෑම අපේක්ෂකයකු ම විශාල අවධානයක් මාධ්‍යයට වෙත යොමු කිරීම සුලබ ව දක්නට ලැබෙන කාරණයක්. සිය ප්‍රතිපත්ති හා අදහස් ඉදිරිපත් කිරීමට 99%ක් ම ඔවුන් භාවිත කරන්නේ මාධ්‍ය. සාම්ප්‍රදායික ලෙස පුද්ගලයන් අතර ඇතිවන සන්නිවේදන සම්බන්ධතාවලින් එය සිදුවන්නේ අඩුවෙන්. මේ නිසා මාධ්‍ය තීරණාත්මක සාධකය වී අවසන්. ජනමතය නිර්මාණය වීමට ඍජු ලෙස ම ජනමාධ්‍ය සම්බන්ධ වෙනවා.

නූතන මාධ්‍යවල සිට වර්තමාන අන්තර්ජාල දක්වා ක්‍රියාත්මක වන මාධ්‍යවල ක්‍රියාකාරිත්වය ජනමාධ්‍යවලින් ඔබ්බට ගිය සංහතික මාධ්‍ය ස්වරූපයකට පත් වී අවසන්. මාධ්‍ය පාලනය කරන්නේ විවිධ ආයතන. ඔවුන්ගේ අරමුණු පාදක කරගෙන ජනතාවගේ බිම් මට්ටමේ ගැටලු ගැන ජනතාව දකින ආකාරය නොව දේශපාලන ප්‍රභූන් මේ ප්‍රශ්න දකින ආකාරය සම්බන්ධයෙන් සමාජයේ මතයක් ඇති කිරීමටයි එම මාධ්‍ය ක්‍රියා කරන්නේ. එය සංහතික මතය (Mass Opinion) ලෙස හැඳින්වෙනවා.

සමාජයේ බිම් මට්ටමේ පොදු ප්‍රශ්න ඔවුන් දකින අයුරිනුයි සංහතික මාධ්‍ය ආයතන අර්ථකථනය කරන්නේ. මේ මතය ප්‍රබල වී තිබෙනවා. ඒ අනුව වර්තමානය වන විට එකිනෙකට වෙනස් ප්‍රවේශ දෙකක් ලෙස සමාජයේ පවතින්නේ ප්‍රධාන මත දෙකක්. එය දේශපාලන, ආර්ථික හෝ රටේ අනාගතය වැනි කරුණු සම්බන්ධයෙන් වන්නට පුළුවන්. ඉන් එක් මතයක් වන්නේ ජනතාව එය දකින ආකාරය හෙවත් ජනමතය. අනෙක් මතය වන්නේ ඉහළ දේශපාලන පන්තිය එය දකින ආකාරය.

පළමු වැනි කරුණින් ජනමතය නිර්මාණය වන අතර දෙවැනි කරුණින් නිර්මාණය වන්නේ සංහතික මතය. ඕනෑ ම සමාජයක මේ මත දෙක අතර සහසම්බන්ධයක් තිබෙනවා. මේ මොහොතේ රටේ ජනතාවගේ සැබෑ අවශ්‍යතා මාධ්‍යවලින් කොතෙක්දුරට නියෝජනය වනවාද යන්න ගැන අවධානය යොමු කළ

යුතු වනවා. මාධ්‍ය සමාජගත කරන ජනාධිපතිවරණය හා රටේ අනාගතය සම්බන්ධ අදහස් කොතෙක්දුරට ජනමතය නියෝජනය කරනවා ද? යන්න ගැටලුවක්. එවිට සංහතික මාධ්‍ය ජනතාවගෙන් දුරස් වන්නට පුළුවන්. ජනතාවගේ සැබෑ ප්‍රශ්න කතා කරනවා වෙනුවට දේශපාලන ප්‍රභූත්වය දෛනික ව ඉදිරිපත් කරන කරුණු දැක්වීමක් දක්නට ලැබෙන්නේ. ඔවුන් තම දේශපාලන මතය ඉදිරිපත් කරනවා. එය ජනතාවගේ සැබෑ ප්‍රශ්නවලට කොතෙක්දුරට අදාළ වෙනවා ද? යන්න සොයා බැලිය යුත්තක්. කෙසේ වෙතත් කිසිදු සමාජයක ජනමතය ඒ ආකාරයෙන් ම නියෝජනය වීමක් සිදු වන්නේ නැහැ.

අද වන විට දේශපාලනය ජනතාවගෙන් ඈත් ව සිටිනවා මෙන් ම මාධ්‍ය ද ජනතාවගෙන් ඈත් ව සිටිනවා. සංහතික මාධ්‍ය හැඩගස්වන තොරතුරු ආධිපත්‍යයට ප්‍රතිචාර දක්වන්න සමස්තයක් ලෙස ජනතාවට ක්‍රමවේදයක් නැහැ. සංහතික මාධ්‍ය අධිකාරිත්වයක් තිබීම ඊට හේතුවයි. වාර්තා කරන සිදුවීමේ තිබෙන්නේ බලය දරන්නකුගේ අදහස්. ජනතාව එය තමන්ගේ මතයක් ලෙස ආරෝපණය කර ගන්නවා. කාල් මාක්ස් පෙන්වා දෙන ආකාරයට ඕනෑ ම යුගයක පාලක පන්තියේ මතය සමස්ත සමාජයේ මතය බවට පත්වනවා. පාලක පන්තියේ ක්‍රියාකාරිත්වය අනුව සමාජ ප්‍රශ්න විසඳිය හැකි ආකාරය ගැන ද ජනතාව තුළ මතවාදයක් නිර්මාණය වන්නට පුළුවන්. එය වර්තමාන සමාජයේ ආධිපත්‍යය දරන මතය බවට පත් ව අවසන්.

මැතිවරණයකදී කුමන අපේක්ෂකයාට තම ඡන්දය භාවිත කරනවා ද යන්න තීරණය කිරීමට ජනතාවට අපක්ෂපාතී තොරතුරු තිබිය යුතු වනවා. එම තොරතුරු සම්පාදනය කිරීමේ වගකීම පැවරී ඇත්තේ මාධ්‍ය පද්ධතියට. මාධ්‍ය ඔස්සේ ජනතාවට නිවැරදි තොරතුරු අවශ්‍ය වනවා. එසේ නොමැති වුවහොත් ජනතාවගේ තීරණය යථාර්ථය සමග සමපාත වන්නේ නැහැ. එවිට දක්නට ලැබෙන්නේ විකෘති සමාජ මතයක්. මතවාදී මෙන් ම දේශපාලන අස්ථාවරත්වයක් ද ඇති වන්නට පුළුවන්.

ඉතිහාසයේ මින් පෙර නොවූ අර්බුදයක් නිර්මාණය වී තිබෙන අවස්ථාවක පැවැත්වෙන ජනාධිපතිවරණයට අපේක්ෂකයන් විශාල පිරිසක් ඉදිරිපත් ව සිටිනවා. පවතින අභියෝග විසඳා ගත හැකි ආකාරය පිළිබඳ ඔවුන්ගේ කතිකාව මාධ්‍ය ඔස්සේ ඉදිරිපත් වීම වැදගත්. ප්‍රමුඛ අපේක්ෂකයන්ගේ ප්‍රතිපත්ති ගැන විවෘත ව තොරතුරු සමාජගත විය යුතු වෙනවා.

වර්තමානයේ මාධ්‍ය ක්‍රියාත්මක වන ආකාරයේ පරමාදර්ශී බවක් දක්නට නැහැ. සර්ව සාධාරණ බවක් නැහැ. මාධ්‍ය කාර්යභාරය නිසි ලෙස ඉටුවේද යන කරුණ ප්‍රශ්නාර්ථයක්. ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාව නියාමන ක්‍රමයක් ලෙස මාධ්‍ය උපමාන සම්ප්‍රදායක් ලෙස ඉදිරිපත් කරනවා. එහෙත් ගැටලුව වන්නේ මැතිවරණ කොමිසම ලබාදෙන උපදෙස් අනුව මාධ්‍ය හැසිරීම සිදු වන්නේ ද යන්න. කෙසේ වෙතත් මැතිවරණ කොමිසම ලබාදෙන උපදෙස් හා මාධ්‍ය ක්‍රියා කරන ආකාරය අතර පවතින්නේ වෙනසක්. එය බොහෝ රටවලට පොදු තත්ත්වයක්. මෙය ප්‍රජාතන්ත්‍රවාදය හෝ ආචාරධර්ම මත කළ නොහැක්කක්. නීතිය හා තාක්ෂණය අනුවයි කළ යුත්තේ. ජනතාවට පවතින තොරතුරු ලබා ගැනීමේ අසමබරතාව අවම කිරීමට ඉන් හැකියාව ලැබෙනවා.

ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්මවලට අනුව ඡන්ද චර්යාව වෙනස් කරන්න සමාජ මාධ්‍යවලට හැකියාවක් නැහැ. ඡන්දය ලබා දිය යුතු අපේක්ෂකයා පිළිබඳ තීරණය ලබාදීමට හැකියාවක් ද ඊට නැහැ. එක්තරා ආකාරයක මානසික බලපෑමක් හෝ සමාජ සහ බුද්ධිමය බලපෑමක් සමාජ මාධ්‍යවලට කළ හැකියි. ඡන්දදායකයාට නිවැරදි තීරණ ගැනීමට එය බාධාවක් වන්නට පුළුවන්. එහිදී යම් දිශාවට යොමු කිරීම නොව කළ යුත්තේ තිබෙන තත්ත්වය ගැන දත්ත ඉදිරිපත් කිරීම. මාධ්‍යවලට තීරණ දෙන්නට බැහැ. එය කළ යුතු වන්නේ ජනතාව. එහෙත් වර්තමානයේ සිදුවන්නේ මාධ්‍ය විසින් තීරණ ගෙන ඒවා ජනතාවට දැනුම් දීම. එය මාධ්‍ය කාර්යයක් වන්නේ නැහැ. ජනතාවට තීන්දු ගැනීමට අවශ්‍ය තොරතුරු ලබාදීම පමණයි කළ යුත්තේ. ඇතැම් විට එය වාරණයක් ද වන්නට පුළුවන්. එනම් එක් අපේක්ෂකයකුගේ තොරතුරු වැඩි වශයෙන් ලබා දී අනෙක් අපේක්ෂකයකුගේ තොරතුරු අඩු වශයෙන් ලබා දෙන්නට පුළුවන්. එහෙත් එය ඡන්දදායකයාට සාධාරණයක් වන ආකාරයෙන් සිදු විය යුතු වෙනවා. එහිදී බලපෑමක් හෝ තීරණයක් ලබා දීම නොව කළ යුත්තේ තොරතුරු ලබා දීම පමණයි. එහෙත් වර්තමානයේ සිදු වන්නේ සමාජ මාධ්‍ය යම් මතවාදාත්මක, දෘෂ්ටිමය හා සංකල්පීය වශයෙන් බලපෑම් ඇති කිරීම. ඡන්ද දායකයාගේ තීරණ ගැනීමේ හැකියාව සීමා කිරීම මෙන් ම ඡන්දදායකයාගේ නිදහස් අදහස්වලට සීමා කිරීමයි ඉන් සිදු වන්නේ. මෙය සූක්ෂ්ම ව සිදුවන්නක්. සමාජ මාධ්‍යවල වර්ධනය සමග ජනතාව තුළ වාරණයක් ඇති කරන්නේ තොරතුරු සම්බන්ධ ව ඌනතාවක් ඇති කිරීමෙන් නොව තොරතුරු අධික ලෙස ලබාදීමෙන්. එවිට ඡන්දදායකයාට නිවැරදි තීන්දුවක් ගැනීමට ඇති හැකියාව සීමා වන්නට පුළුවන්. ඉදිරිපත් වන තොරතුරුවලින් වැඩි ප්‍රමාණයක් අදාළ නොවන විට වැදගත් තොරතුරු තෝරා ගැනීමට බලපෑම් එල්ලවීම මත නිවැරදි තීරණයක් ගැනීමට ඡන්දදායකයට නොහැකි වන්නටත් පුළුවන්.



# සයිබර් තර්ජන හා මැතිවරණ ප්‍රජාතන්ත්‍රවාදය




**ටී. එම්. ජී. චන්ද්‍රසේකර**

ශ්‍රී ලංකාව ඇතුළු ලොව බිලියන 04ක ජනතාවක් මේ වසරේ මැතිවරණවලට මුහුණදීමට නියමිත ව ඇති හෙයින් මැතිවරණ ක්‍රියාවලිය සහ එය වටා ඇති තාක්ෂණ වර්ධන පසුබිමේ සයිබර් අපරාධකරුවන්ගේ බලපෑම වැඩිවෙමින් තිබේ. ගෝලීය දේශපාලන අවශ්‍යතා මෙන් ම ඒ ඒ රටවල බල ව්‍යාපෘතිවල අවශ්‍යතා සඳහා මෙම තාක්ෂණික පෙළහර මහත් රුකුලක් වී ඇත. ඉන් වඩාත් තර්ජනයට ලක්වන්නේ ප්‍රජාතන්ත්‍රීය ක්‍රියාවලිය බව සයිබර් ආරක්ෂණ උපදේශකයකු වන ජේසන් කේඩ් පෙන්වා දෙයි. සයිබර් තර්ජන, ව්‍යාජ පුවත්, වෛරී ප්‍රකාශන හා කෘත්‍රිම බුද්ධිය ඇසුරින් නිර්මිත ප්‍රචාරණ විසින් මැතිවරණ කඩාකප්පල් කිරීමට මෙන් ම නිදහස් තීරණ ගැනීමට ජනතාවට ඇති ඉඩකඩ අහුරනු ලබයි.

රටක මැතිවරණ සමයක් යනු විවිධාකාරයේ ක්‍රියාකාරකම්වලට තෝතැන්නක් වන සමයකි. එවැනි කාලවල සයිබර් අපරාධකරුවන්ට ද සිය අපරාධ සඳහා අවශ්‍ය පසුබිම සකසා ගැනීමට හැකි වේ. මෙම අපරාධකරුවෝ ද නිල සංවිධාන, රාජ්‍ය ආයතන සහ නිල පක්ෂ අපේක්ෂකයන් ලෙස පෙනී සිටිමින් වංචනික ලෙස දත්ත සොරකම් කිරීම්, රහස්‍ය තොරතුරු සොරකම් කිරීම් හා ඒවා අනාවරණය නොකිරීමට කප්පම් ඉල්ලීම් වැනි අපරාධ සිදු කරති. මේ නිසා මැතිවරණ කාලවලදී මැතිවරණ ක්‍රියාවලියේ අඛණ්ඩතාව සහ ආරක්ෂාව අතිශයින් වැදගත් වේ.

මෙහෙයුම් කඩාකප්පල් කිරීම, ප්‍රතිඵලවලට බලපෑම් කිරීම, ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලිය කෙරෙහි මහජන විශ්වාසය පළුදු කිරීම අරමුණු කරගත් විවිධ සයිබර් තර්ජන සඳහා මැතිවරණ වැඩි වැඩියෙන් ඉලක්ක වෙමින් පවතින බවට අතීත පාඩම් බොහෝ ඇත. 2016 වසරේ එක්සත් ජනපද ජනාධිපතිවරණයේදී රුසියානු හැකර්වරු ඡන්දදායකයන් ලියාපදිංචි කිරීමේ පද්ධති ඉලක්ක කර මැතිවරණ ප්‍රතිඵලයට බලපෑම් කිරීම සඳහා සමාජ මාධ්‍ය වේදිකා මත පුළුල් සාවද්‍ය තොරතුරු ප්‍රචාරය කළහ. 2017 ප්‍රංශ ජනාධිපතිවරණයේදී ඡන්දදායකයන්ට බලපෑම් කිරීමට මැතිවරණයට දින කිහිපයකට පෙර එවකට අපේක්ෂක එම්මානුවෙල් මැක්‍රොන්ගේ ප්‍රචාරක ව්‍යාපාරයට දැවැන්ත ඊමේල් සහ ලේඛන සංඛ්‍යාවක් කාන්දු කරමින් හැකර්වරු එය කඩාකප්පල් කිරීමට උත්සාහ කළහ.

ඡන්ද ගණන් කිරීම් වෙනස් කිරීමට හෝ ප්‍රතිඵල හැසිරවීමට විද්‍යුත් ඡන්ද පද්ධතිවලට රිංගා ගැනීමට සයිබර් ප්‍රහාරකයන් උත්සාහ කළ හැකි ය. එහිදී මැතිවරණයක ප්‍රතිඵලය වෙනස් කිරීමට උපයෝගි කර ගනු ඇත්තේ යල් පැන ගිය හෝ දුර්වල ආරක්ෂණ පද්ධති ය. 2020 වසරේදී ආරක්ෂක වාර්තාවක් පෙන්වාදුන් පරිදි එක්සත් ජනපදයේ විවිධ ප්‍රාන්තවල භාවිත කරන විද්‍යුත් ඡන්ද යන්ත්‍රවල දුර්වලතා හඳුනාගෙන ඇත, මෙම දුර්වලතා උපයෝගි කර ගත්තේනම්, ප්‍රහාරකයන්ට ඡන්ද ප්‍රතිපලය වෙනස් කිරීමට හෝ ප්‍රතිඵල හැසිරවීමට ඕනෑතරම් ඉඩ තිබුණු බව ඔවුහු අනාවරණය කළහ.

ඡන්දදායකයන් ලියාපදිංචි කිරීමේ දත්ත සමුදාය ව්‍යාකූල කිරීමේ හැකියාව හැකර්වරුන් සතු වේ. මෙහිදී මැතිවරණ දිනයේදී ව්‍යාකූලත්වයට සහ ඡන්ද අයිතිය අහිමි කිරීමට තුඩුදෙන ඡන්දදායක තොරතුරු මකා දැමීමට හෝ වෙනස් කිරීමට හැකර්වරුන්ට හැකි වේ. ඡන්දහිමියන්ගේ ලියාපදිංචි දත්ත සමුදාය ඉලක්ක කරගනිමින් මෙම ප්‍රහාර එල්ල කළ හැකි බව සයිබර් ආරක්ෂණ ඉංජිනේරුවන්ගේ මතයයි.

2016 වසරේදී ගිනිකොණදිග යුරෝපා රාජ්‍යක් වූ මොන්ටිනිග්‍රෝ පාර්ලිමේන්තු මැතිවරණය පැවති දිනයේදී එයට ප්‍රහාරයකට මුහුණදීමට සිදු විය. එම සයිබර් ප්‍රහාරයෙන් නිශ්චිත වෙබ් අඩවිවලට පිවිසීම බාධාකරමින් විවිධ ව්‍යාකූලතා ඇති කෙරිණි. මෙම ප්‍රහාරය රජයේ වෙබ් අඩවි සහ මැතිවරණ සම්බන්ධ පද්ධති ඉලක්ක කර ගනිමින් සිදු වූ අතර එහි අරමුණ වී තිබුණේ මැතිවරණය පැවැත්වෙන අතරතුර ව්‍යාකූලත්වය ඇතිකිරීම සහ මැතිවරණ ක්‍රියාවලිය කෙරෙහි විශ්වාසය බිඳ දැමීමයි.

2016 වසරේදී එක්සත් ජනපදයේ ඩිමොක්‍රටික් ජාතික කමිටුවේ (DNC) සාමාජිකයන් ඉලක්ක කර ගනිමින් රුසියානු හැකර්වරු spear phishing emails ප්‍රහාරයක් එල්ල කළහ. මෙය විද්‍යුත් තැපැල් ගිණුම් සම්මුති උල්ලංඝනයකට තුඩු දුන් අතර ඉන්පසුව විකිලීක්ස් විසින් ප්‍රකාශයට පත් කරන ලද සංවේදී තොරතුරු කාන්දු වීම මැතිවරණයේ දේශපාලන ගතිකත්වයට බලපෑවේ ය. 2020 වසරේදී ජෝර්ජියාවේ පැවති මැතිවරණයේදී එහි ඡන්දදායකයන්ගේ අත්සන් ඇතුළත් දත්ත පද්ධතියට එල්ල වූ ransomware ප්‍රහාරයක් නිසා එම අත්සන් සහතික කරගැනීමේ ගැටලුවකට මුහුණදීමට සිදු විය.

2016 වසරේදී එක්සත් ජනපද

ජනාධිපතිවරණය අතරතුර රුසියානු ක්‍රියාකාරීහු ඡන්දදායකයන්ගේ මතවලට බලපෑම් කිරීම අරමුණු කරගත් වැරදි තොරතුරු පතුරුවා හැරීම සඳහා ෆේස්බුක් සහ ට්විටර් වැනි සමාජ මාධ්‍ය වේදිකා භාවිත කළහ. එහිදී ව්‍යාජ ගිණුම් නිර්මාණය කිරීම සහ බෙදා හැරීමේ වෙබ් පිටු නිර්මාණය කිරීමෙන් ව්‍යාකූලත්වයට සහ ගැටලුසහගත තත්ත්වයක් නිර්මාණය විය.

2017 වසරේදී එක්සත් ජනපදයේ මැතිවරණ කටයුතු සම්බන්ධ නිලධාරියකු අවසරයකින් තොර ව ඡන්ද ලියාපදිංචි කිරීමේ දත්ත වෙනස් කර ඇති බව සොයා ගැනිණි. එම වෙනස්කම් හඳුනාගෙන නිවැරදි කරන ලද අතර සංවේදී මැතිවරණ දත්ත වෙත ප්‍රවේශය ඇති අභ්‍යන්තරිකයන්ට කළ හැකි බලපෑමේ අවදානම මෙම සිද්ධියෙන් අවධාරණය කෙරේ.

මැතිවරණයක උද්වේගකර අවස්ථාව වන්නේ ප්‍රතිපල ප්‍රකාශයයි. එවැනි මොහොතක ප්‍රහාරකයන්ට ඡන්ද තොරතුරු සැපයීම හෝ ප්‍රතිඵල වාර්තා කිරීම වැනි මැතිවරණ සම්බන්ධ වෙබ් අඩවි සහ සේවාවලට එරෙහි ව DDoS ප්‍රහාර දියත් කිරීමේ හැකියාව තිබේ. ඒ හේතුවෙන් අධික ලෙස තොරතුරු බෙදා හැරීමේ බාධා ඇති විය හැකි අතර එයින් ප්‍රතිපල පමාව මෙන් ම ඡන්දදායකයන් සහ නිලධාරීන් අතර ව්‍යාකූලත්වයක් ඇති කළ හැකි ය. මහජනතාව නොසන්සුන්තාවයට පත්විය හැකි ය. මැතිවරණ නිලධාරීන් රැවටීමට ඔවුන් ඉලක්ක කරගනිමින් Phishing සහ Spear-Phishing ඊමේල් භාවිත කළ හැකි ය,

දේශපාලන ව්‍යාපාර ඉලක්ක කර ගනිමින් ද විවිධ සයිබර් ආරක්ෂණ බලපෑම් ඇතිවීමේ අවදානමක් පවතී. ප්‍රචාරක කාර්ය මණ්ඩලය සහ අපේක්ෂකයන්ගේ රහසිගත තොරතුරු සොරකම් කිරීම සඳහා spear-phishing තතුබෑම් එල්ලවිය හැකි ය. එම ලබාගන්න තොරතුරු පතුරුවා හැරීමෙන් දේශපාලන වාසි ගත හැකි අතර ඒවා ප්‍රචාරය කරන බවට තර්ජනය කරමින් බ්ලැක්මේල් භාවිත කළ හැකි ය. එවැනි ම වූ Ransomware ප්‍රහාරවලින් තීරණාත්මක දත්ත සංකේතනය කිරීම සහ එය මුදා හැරීම සඳහා කප්පම් ඉල්ලා සිටීම ද සිදු වේ. මැතිවරණ යටිතල පහසුකම්වලට එල්ල කරන එවැනි ප්‍රහාර ඡන්ද ක්‍රියාවලිය කඩාකප්පල් කිරීමටත් ප්‍රතිඵල වාර්තා කිරීම ප්‍රමාද කිරීමටත් මැතිවරණ ක්‍රමය කෙරෙහි ඇති විශ්වාසය බිඳ දැමීමටත් හේතු විය හැකි ය.

විශේෂයෙන් විවිධ දේශපාලන පක්ෂවල අනුග්‍රහය ලබන ක්‍රියාකාරීන් හෝ සංවිධානාත්මක කණ්ඩායම් මහජන මතයට සහ ඡන්දදායකයන්ගේ හැසිරීමට බලපෑම් කිරීම සඳහා ව්‍යාජ තොරතුරු, ප්‍රචාරණ හෝ කුමන්ත්‍රණ න්‍යාය පතුරුවා හැරීමට සමාජ මාධ්‍ය වේදිකා භාවිත කළ හැකි ය. කෘත්‍රිම බුද්ධිය භාවිත කරමින් රූප සහ හඬ මාරු කරන ලද වීඩියෝ හෝ ශ්‍රව්‍ය පටිගත කිරීම් (Deepfake) නිර්මාණය කිරීම සහ බෙදා හැරීමෙන් අපේක්ෂකයන් කිසි විටෙක නොකළ දේවල් කීම හෝ කිරීම ව්‍යාජ ලෙස නිරූපණය කළ හැකි අතර එයින් ඔවුන්ගේ පොදු ප්‍රතිරූපයට සහ ඡන්ද ව්‍යාපාරයට බලපෑම් ඇති කළ හැකි ය.

> රටක මැතිවරණ සමයක් යනු විවිධාකාරයේ ක්‍රියාකාරකම්වලට තෝතැන්නක් වන සමයකි. එවැනි කාලවල සයිබර් අපරාධකරුවන්ට ද සිය අපරාධ සඳහා අවශ්‍ය පසුබිම සකසා ගැනීමට හැකි වේ. මෙම අපරාධකරුවෝ ද නිල සංවිධාන, රාජ්‍ය ආයතන සහ නිල පක්ෂ අපේක්ෂකයන් ලෙස පෙනී සිටිමින් වංචනික ලෙස දත්ත සොරකම් කිරීම්, රහස්‍ය තොරතුරු සොරකම් කිරීම් හා ඒවා අනාවරණය නොකිරීමට කප්පම් ඉල්ලීම් වැනි අපරාධ සිදු කරති.

දේශපාලන පක්ෂවල හෝ අපේක්ෂකයන්ගේ දත්ත සමුදායට අනවසරයෙන් ඇතුළුවීම, කීර්තිනාමයට හානි කිරීමට හෝ ඡන්දදායක සංජානනයට බලපෑම් කිරීමට භාවිත කළ හැකි සංවේදී තොරතුරු, උපායමාර්ගික සැලසුම් හෝ පුද්ගලික සන්නිවේදන සොරකම් කිරීම සහ හෙළිදරව් කිරීම සයිබර්ට වංචාවලින් සිදු කළ හැකි බලපෑම් වේ.


මෙම තර්ජන මැඩපැවැත්වීම සඳහා ශක්තිමත් සයිබර් ආරක්ෂණ පියවර ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය වේ. ඒ සඳහා ශ්‍රී ලංකා සර්ට් ආයතනය විසින් රාජ්‍ය ආයතන සඳහා හඳුන්වා දෙනු ලැබ ඇති තොරතුරු හා සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට පියවර ගැනීම මෙන් ම ශක්තිමත් යටිතල පහසුකම් පද්ධතියක් ස්ථාපිත කිරීම ද ඉතා වැදගත් වේ. එහිදී නිත්‍ය ආරක්ෂක තක්සේරු කිරීම සහ මැතිවරණ පද්ධති විනිවිද යාම පරීක්ෂා කිරීම, සයිබර් තර්ජන හඳුනාගෙන ඒවාට ප්‍රතිචාර දැක්වීම පිළිබඳ මැතිවරණ නිලධාරීන්ට සහ ප්‍රචාරක කාර්ය මණ්ඩලයට පුහුණුව ලබාදීම අත්‍යවශ්‍ය වේ. එ අතර ම බහුසාධක සත්‍යාපනය සහ සංවේදී පද්ධති සඳහා ශක්තිමත් ප්‍රවේශ පාලන, තර්ජන නිරීක්ෂණය කිරීම සහ ඒවාට ප්‍රතිචාර දැක්වීම සඳහා රාජ්‍ය ආයතන, සයිබර් ආරක්ෂණ විශේෂඥයන් සහ තාක්ෂණ සමාගම් අතර සහයෝගිතාව වර්ධනය කරගැනීමත් වැදගත් ය. වැරදි තොරතුරු සහ විශ්වසනීය තොරතුරු මූලාශ්‍ර හඳුනා ගන්නේ කෙසේද යන්න පිළිබඳ ඡන්දදායකයන් දැනුවත් කිරීම සඳහා මහජනතාව දැනුවත් කිරීමේ ව්‍යාපාර දියත්කර තිබීම ද සුදුසු වේ.

ව්‍යාජ වෙබ් අඩවි, විවිධාකාරයේ පණිවුඩ, දුරකතන ඇමතුම්, සමාජ මාධ්‍ය ප්‍රචාරණ, ඡන්දදායකයාගේ නිදහස් තීරණ ගැනීමේ හැකියාවට තර්ජනයක් වනු ඇත.

රටක මැතිවරණයක් යනු තීරණාත්මක සාධකයකි. එය මනාව පවත්වාගෙන යාමට පක්ෂ භේදයකින් තොර ව සහාය දැක්වීම පුරවැසි යුතුකමකි. එහිදී නව තාක්ෂණයත් සමග අප හමුවේ ඇති තර්ජන හඳුනා ගැනීම, ඒවා පිළිබඳ අවබෝධය ලබාගැනීම, වංචාවක් දුටුතැන වාර්තා කිරීම වැනි පුරවැසි වගකීම් ඉටු කළ යුතු ව තිබේ.

සයිබර් තර්ජන මැතිවරණවල අඛණ්ඩතාවට සහ විශ්වසනීයත්වයට සැලකිය යුතු අවදානමක් ඇති කරන නිසා නිදහස්, සාධාරණ සහ ආරක්ෂිත මැතිවරණයක් සහතික කිරීම සඳහා මැතිවරණ බලධාරීන්, රජය, මාධ්‍ය සහ මහජනතාව මෙම තර්ජන හඳුනාගෙන ඒවා අවම කිරීම සඳහා සුපරීක්ෂාකාරී ව සහ ක්‍රියාශීලී ව සිටීම ඉතා වැදගත් වේ.

# ජගත් සිනමාවේ පුරාවෘත්තය ALAIN DELON



තුසිත ජයසුන්දර

සිනමාව හා ප්‍රංශය අතර පවතින්නේ නොබිඳෙන හා ගැඹුරු සබඳතාවකි. ලොව පළමු නිල සිනමා දැක්ම පවත්වන්නේ ප්‍රංශයේ පැරිස් නුවරදී ය. මේ නිසා ම ලොව පළමු සිනමා ප්‍රදර්ශකයන් හමුවන්නේ ද ප්‍රංශයෙනි. සිනමාව ජනගත කරනු පිණිස බටහිර ලෝකය දැරූ ප්‍රයත්න විෂයෙහි ප්‍රංශයේ දායකත්වය සුළු පටු නොවී ය. සිනමාවේ අනන්‍යතාව හා ප්‍රමිතිය සම්බන්ධයෙන් ප්‍රංශ සිනමාව දැක්වූ අවධානය ද අතිමහත් වූවකි. ප්‍රමුඛ සිනමා න්‍යායාචාර්යවරුන්ගේ මග පෙන්වීම මේ සඳහා ලැබිණි. Andre Bazin ඉන් එක් අයෙකි. මේ සියල්ල කේන්ද්‍රගත වන වඩාත් ම බලපෑම් සහගත අවස්ථාව වනුයේ දෙවැනි ලෝක සංග්‍රාමයට පසු අවදියේදී බිහිවන සුප්‍රකට ප්‍රංශ නව සිනමා රැල්ලයි. මෙය වත්මන් ජගත් සිනමාවේ හැසිරීම් කෙරෙහි ද සෘජු ව හා වක්‍ර ව බලපාන අයුරු පැහැදිලි ය. මෙහිලා පසුබිම සැකසූ සුප්‍රකට Cahiers du cinema ශාස්ත්‍රීය සිනමා සඟරාව පිළිබඳ ව ද මෙහිදී සඳහන් කළ යුතු වේ.

ප්‍රංශ සිනමාවේ මෙම පෙරට ඒම රූපණ පාර්ශ්වයෙන් පිළිබිඹු කෙරෙන්නේ තරු ගුණය නොමඳ ව ඇති, ප්‍රතිභාව හා ව්‍යුත්පත්තිය උතුරා ගිය කිහිපදෙනකුගේ ප්‍රශස්ත සහභාගි වීම ඔස්සේ ය. ඉන් jean - Paul Belmondo ඉකුත් 2021 වසරේදී වසර 88ක් ආයු විඳ සිය දිවි සැරිය නිමාවට පත් කළේ ය. Brigitte Bardot දැන් 89 හැවිරිදි ය. Jean - Pierre Leaud දැන් 80

> දශක සයක් ඉක්මවා ගිය ඔහුගේ සිනමා රූපණ දිවිය විෂයෙහි දත හැකි සිනමාපට සංඛ්‍යාව 90ක් පමණ වේ. ඔහු නිසැක වශයෙන් ම ප්‍රංශ සිනමාවේ පමණක් නොව ජගත් සිනමාවේ පුරාවෘත්තයක් බවට පත් වන්නේ මෙම සිනමාපට වෙනුවෙන් කළ දෘඪතර පෙනී සිටීම මුල් කොට ගෙන ය.

හැවිරිදි ය. නොබෝද (2024-08-18) දින 88 හැවිරිදි වියේදී දිවියෙන් සමු ගත්තේ එක්තරා ආකාරයකින් ප්‍රංශ සිනමාවේ දීප්තිමත් ම තාරකාව වූ Alain Delon ය. ලොව සිනමා රසිකයන් ද සිනමා ශිල්පීන් ද සිනමා ප්‍රකාශන ආදිය ද ඔහුගේ වියෝවෙන් කම්පා වූයේ ඔහුට උචිත ආදේශකයක් නොමැති ය යන විශ්වාසය ද පෙරදැරි කරගෙන ය. Alain Delon නිසැක වශයෙන් ම ඇමරිකානු හොලිවුඩ් සිනමාවේ හා බටහිර සිනමාවේ සවිමත් යාන්ත්‍රණ ආදිය හමුවේ ප්‍රංශ සිනමා බලය ගෙනහැර පාන්නට රූපණය ප්‍රබලාකාරයෙන්, සියුම් ව හා රසාලිප්ත අන්දමින් උපයෝගි කොට ගත් වග සැඟවිය නොහැකි කාරණයකි. හොලිවුඩ්, බොලිවුඩ් හා කොලිවුඩ් බඳු සිනමා කලාප ජගත් සිනමාවේ හැඩරුව නිශ්චය කෙරෙන පසුබිමක වුව ද ප්‍රංශ සිනමාවේ පැවැත්ම සහතික කරලන්නට Alain Delon දැක්වූ අවධානය ඇගැයීමට කල් ගත කළ යුතු නැත. ඔහුගේ තුරුණු රුව ලොව සිනමා රසිකාවියන්ගේ සරාගී හැඟීම් පොහොසත් කළ බව ද රහසක් නොවේ. ප්‍රංශ සිනමාවේ ජනාදරප්‍රාප්ත ම රූපණවේදියා නිරනුමාන ව ම ඔහුයි.

1935 වසරේ නොවැම්බර් මස 08 දින ප්‍රංශයේදී උපන් Alain Delon සිනමා රූපණයට පිවිසෙන්නේ 14 හැවිරිදි වියේදී Le rapt නැමැති කෙටි සිනමාපටයෙනි. අනතුරු ව මේ හුරුබුහුටි යෞවනයා ගැටවර වියෙන් තරුණ වියට පිවිසෙන්නේ කඩවසම් සිනමා තරුවකට ඇවැසි සියලු ලකුණු සහිත විලාසයකිනි. 1957 වසරේදී ඔහු සිය පළමු වෘත්තාන්ත සිනමාපටයට එක්වෙයි. Send a woman when the devil fails මෙම සිනමාපටයයි. 2019 වසරේදී ඔහු අවසන් වරට රූපණයෙන් එක්වූ සිනමාපටයක් ප්‍රදර්ශනය කෙරිණි. දශක සයක් ඉක්මවා ගිය ඔහුගේ සිනමා රූපණ දිවිය විෂයෙහි දත හැකි සිනමාපට සංඛ්‍යාව 90ක් පමණ වේ. ඔහු නිසැක වශයෙන් ම ප්‍රංශ සිනමාවේ පමණක් නොව ජගත් සිනමාවේ පුරාවෘත්තයක්





බවට පත් වන්නේ මෙම සිනමාපට වෙනුවෙන් කළ දෘඪතර පෙනී සිටීම මුල් කොට ගෙන ය.

Delon මෙසේ ලොවට ම විවෘත වන්නේ අතිශය අමිහිරි බාල කාලයක් ගෙවා දැමීමෙන් පසුවයි. දෙමාපිය සෙනෙහස ඔහු වෙත ලැබුණේ කෙටි කලකට ය. පාසල් සමය ද දුක් ගැහැට ආදියෙන් පිරී පැවතිණි. ළමා වියේ සිතුම් පැතුම් සාධනයට ඔහු වෙත ලැබුණු අවස්ථා කිසිසේත් ම ප්‍රමාණවත් නොවූ බව පෙනේ.

පාසල් සමයෙන් පසු ඉන්දු-චීන යුද්ධය සඳහා ප්‍රංශ නාවුක හමුදාවේ සේවයට එක්වන්නට ඔහුට සිදු විය. යුද සේවය ද ඔහුට ප්‍රිය මනාප නොවන්නට ඇත. මෙය ද අර්බුද සහිත සමයකි.

සමකාලීන ව ජගත් සිනමාවේ නිර්මාණාත්මක විපරිවර්තන සිදු කරමින් සිටි ඉතාලි නව යථාර්ථවාදී සිනමාව සමග අරුත්බර සබඳතා පවත්වා ගන්නට Delon වෙත ලැබුණු අවස්ථා සමුච්චය කැපී පෙනේ. මෙහි වර්ධනීය අවස්ථා වනුයේ ඉතාලි මහා සිනමාකරු Luchino Viscontiගේ Rocco and his brothers (1960) හා The Leopard (1963) යන සිනමාපට ද්විත්වයේ ප්‍රමුඛ චරිත නිරූපණයට ලැබුණු අවස්ථා ය. 1971 වසරේදී මුල්වරට ප්‍රදර්ශිත ටෙරන්ස් යන්ග්ගේ 'ද රෙඩ් සන්' Delon ගේ පරිණත සිනමා රූපණ සමත්කම මැනවින් විදහා පෑ අවස්ථාවක් සේ ගත හැකි ය. මේ වන විට ඔහු සිය තුරුණු බව ද රැගෙන මැදිවියේ සරුසාර දිවියක් සිනමා රූපණය සමග ගත කරමින් සිටි අයුරු පෙනේ.

Purple Noon (1960), L'Eclisse (1962), Le Samourai (1967) යන සිනමාපට ද Delonගේ සිනමා රූපණ සමත්කම විදහා දැක්වූ ප්‍රමුඛ අවස්ථා අතරට එක්කරලීම සහේතුක ය. මෙයින් L'Eclisse අධ්‍යක්ෂණය කරනු ලැබුවේ විශිෂ්ට ඉතාලි සිනමාකරුවකු වන Michelangelo Antonioni විසිනි.



අසූව දශකයේදී Delon සිනමා රූපණය අත නොහැර ම සිනමා අධ්‍යක්ෂණයට පිවිසෙන්නේ ඊට ඇවැසි දැනුම උකහා ගත් පසුබිමක් තිබීම ද නිසා ය. ඔහු ඉදිරියෙන් ඇති සිනමා අධ්‍යක්ෂණ සංඛ්‍යාව තුනකි. කෙසේ වෙතත් සිනමා රූපණයේ ප්‍රභාව නිසා ම ඔහුගේ සිනමා අධ්‍යක්ෂණ පිවිසුම පිළිබඳ වඩා සඵලදායි විමසුම ප්‍රමාණවත් ව සිදුවූයේදැයි යන්න නම් ප්‍රශ්නයකි.

ප්‍රතිභාපූර්ණ සිනමා රූපණවේදියකු සේ ම දිදුලන සිනමා තාරකාවක්ද වූ Alain Delon වේදිකාවේ හා රූපවාහිනියේ දැක්වූ රූපණ සමත්කම් අවලෝකනයට පසුබට විය යුතු නොවේ. වැඩි සිනමාපට සංඛ්‍යාවකට දායක වූ බොහෝ සිනමා රූපණවේදීන්ට මෙන්ම Alain Delonට ද සිදුවූයේ සිය වේදිකා හා රූපවාහිනි රූපණ යටපත් වන අන්දම දකින්නට ය. මෙය නොඅනුමාන ව ම සිනමාවේ ප්‍රබල හා ආධිපත්‍යකාරී බව අවධාරණය කරන්නකි. සිනමාවේ වේදිකා නාට්‍යය සේ ම රූපවාහිනිය පවතින බව ද මෙයින් ඉඟි කෙරේ. වේදිකාව හා රූපවාහිනිය පරයා Alain Delon සිනමාව වෙතින් ම දිස් වන්නේ මේ නිසා ය.

ලොව මුල්පෙළේ සිනමා උලෙළ ගණනාවකදී ම Alain Delon සම්මානයට, ගෞරවයට හා ඇගැයීමට පාත්‍ර වූයේ සෙසු බොහෝ සිනමා රූපණවේදීන් අභිභවා යාමට වුව ද සූදානම් ය යන අදහස අවිඥානික ව පළ කරමිනි. මෙම සම්මාන, ගෞරව දැක්වීම් හා ඇගයීම් තුළ ඔහුගේ රූපණයෙන් යුතු සිනමාපට ද තිබිණි. සමස්ත හඳුනා ගැනීම් ද තිබිණි. මෙහි වටිනාම අවස්ථාව වූයේ 2019 කාන්ස් අන්තර්ජාතික සිනමා උළෙලේදී පිරිනැමුණු Palme d'Or සම්මානයයි. මේ විශිෂ්ට සිනමා දායකවීම සඳහා පිරිනැමෙන තරගකාරී නොවන ගෞරවනීය සම්මානයකි. Delong fmr Woody Allen, Jeanne Moreau, Jane Fonda, Clint Eastwood, Jean - Paul Belmondo වෙත මෙම සම්මානය පිරිනමා තිබිණි. අනතුරු ව මෙම සම්මානය පිරිනැමුණේ ද Jodie Foster,Tom Cruise, Michael Douglas, Harrison Ford, Meryl Streep බඳු ජගත් සිනමාවේ මුල් පෙළේ රූපණවේදීන්ට ය. Alain Delonගේ සිනමා රූපණ සමත්කම පිළිබඳ වඩා පුළුල් විෂයාසක්ත අදහසක් සරි කර ගැනීමට මෙකරුණ පිටිවහලක් කර ගත හැකි ය.

එනම් Alain Delon ප්‍රංශ සිනමාව අතික්‍රමණයෙන් පෙරට ආ විශිෂ්ටයකු වන බවයි. කල් ඉකුත් වීමේ ඉරණමට මුහුණ නොපෑ ජ්වලිත සිනමා තාරකාවක් ම වන බවයි. ජගත් සිනමාවේ පුරාවෘත්තයක් ද වන බවයි.

# සිරිලක සිනමාව හැර නොයන සුගතපාල සෙනරත් යාපා

තුසිත ජයසුන්දර

**සිරිලක වාර්තා සහ වෘත්තාන්ත සිනමාව පෝෂණය කළ සුගතපාල සෙනරත් යාපා සිනමාවේදියා නොබෝදා (අගෝස්තු 25) දිවි රඟමඬලින් සමු ගත්තේ ය. 1973 වසරේ 'චිත්‍රපට අධ්‍යක්ෂ' ලෙස රජයේ චිත්‍රපට අංශයට එක් වන ඔහු නෙළූ සිනමා අස්වැන්න ඉතිහාසගත ය. මේ ඔහු පිළිබඳ මතකාවර්ජනයකි.**

දශක සයකට පෙරාතුව සිරිලක කලාව පළ කළ ප්‍රබෝධය හා නව්‍ය ලකුණු පසුපස වූ පෙළ ගැසීම් නිර්මාණය වූයේ සම්ප්‍රදාය අතික්‍රමණයට වුව ද සූදානම්, විකල්ප පිවිසුම් දෙස වපරැසින් නොබැලූ නා නා විධ සංගම් හා සංවිධාන ද මහෝපකාරී කොට ගනිමිනි. ඔවුන් වෙසෙසින් ම නිර්මාණ සාහිත්‍ය, වේදිකා නාට්‍ය හා සිනමාව කෙරෙහි දැක්වූයේ අපමණ උනන්දුවකි. මෙහිලා කැපී පෙනුණු සංවිධානයක් වූයේ ප්‍රකට කලාකරු ජී. ඩී. එල්. පෙරේරාගේ මූලිකත්වයෙන් ගොඩ නැංවුණු 'කලා පෙළ' යි. 'කලා පෙළ'හි සිනමා හා වේදිකා නාට්‍ය පාඨමාලා සිරිලක කලාව පොහොසත් කළ බොහෝ දෙනකුගේ තිඹිරි ගෙය හා පාසල වන වග නොරහසකි. 1965 වසරේදී 'කලා පෙළ' නිපැයුමක් සේ ජී. ඩී. එල්. පෙරේරා නිර්මාණය කළ 'සාමා' සිනමාපටය සිනමාශාලා කරා පැමිණෙන්නේ නිසැක වශයෙන් ම සිරිලක සිනමාවේ අභිනව නැඹුරුවක් සනිටුහන් කරමිනි. 1960 දශකයේ සිරිලක සිනමාවේ විශිෂ්ටතා පිළිබඳ කෙරෙන කවර විමසුමකදී වුව ද 'සාමා' සිනමාපටය අමතක කළ හැකි නොවේ. මේ නිසා ම 'සාමා' වත්මන් සිනමා හැදෑරීම් විෂයෙහි ද සලකා බැලෙන සිනමාපටයක් ම වෙයි.

ජී. ඩී. එල්. පෙරේරාට 'කලා පෙළ' යටතේ සිනමාපටයක් නිර්මාණය කිරීමේ අවකාශය පාදා දීමේදී මූලික වූ අයකු වන්නේ සුගතපාල සෙනරත් යාපායි. යාපා ඒ වනවිට 'කලා පෙළ'හි ලේකම්වරයා ව සිටියේ ය. 'කලා පෙළ' සත් වැනි සංවත්සරයේදී ඔහු යෝජනා කළේ 'කලා පෙළ' නිපැයුමක් සේ සිනමාවතරණයක් සිදුවිය යුතු බවයි. යෝජනාව ස්ථිර වීමත් සමග ම ජී. ඩී. එල්. හා යාපා ඇතුළු 'කලා පෙළ' කණ්ඩායම රුපියල් 250.00ක් අතැති ව 'සාමා' නිපැයුම ඇරඹුවේ සිනමා ප්‍රේමී සමකාලීන තරුණ ප්‍රජාව වෙත කිසියම් ආස්වාදයක් ද ලබා දෙමිනි.

මෙසේ අභිනව සිනමා මෙහෙයුමකට මූලික වූ සුගතපාල සෙනරත් යාපා 1970 වසරේ මාර්තු මසදී සිය පළමු වෘත්තාන්ත සිනමපටය වන 'හන්තානේ කතාව' සිනමාශාලා ප්‍රදර්ශනයට මුදා හරින්නේ 1970 දශකය මධ්‍යයේදී පමණ කලාත්මක ගුණාංග සහිත ව පෙරට ආ සමාජ හා දේශපාලනික යථා තතු විනිවිද දුටු සිනමා මෙහෙයුමට ඇවැසි පදනම සවිඥානික ව සකසා දෙමිනි. 'හන්තානේ කතාව' 1960 දශකයේ උක්ත සිනමා මෙහෙයුම හා 1970 දශකයේ මෙම නව සිනමා මෙහෙයුම අතර සම්බන්ධීකරණ කාර්යයෙහි නිරත ප්‍රශස්තම අවස්ථාව ද වෙයි. 'හන්තානේ කතාව' නිර්මාණය කරන විට යාපා ආකාර කිහිපයකින් ම සිරිලක සිනමාවට දායක වෙමින්, එහිලා නොමඳ ව සමත්කම් පළ කරමින් සිටි අයකු වූ වග අමතක නොකළ යුතු ය.

2024 අගෝස්තු 25 දින 89 හැවිරිදි වියේදී සුගතපාල සෙනරත් යාපා සිය අභිමානවත් හා කීර්තිමත් දිවි සැරිය




නිමා කරන්නේ වෙසෙසින් ම සිරිලක වෘත්තාන්ත සිනමාවට පමණක් නොව කෙටි හා වාර්තා සිනමාවට ද හරවත් ලකුණු රැසක් එක් කළ විශිෂ්ටයකු ලෙසිනි. නිර්මාණකරණයෙහි සක්‍රිය ව නිරත සමයේදී නිසි ඇගැයුමකට හෝ ගෞරවයකට පාත්‍ර නොවූව ද පසුකාලීන ව ඔහු ලද ඇගැයුම් හා ගෞරවනීය සැලකුම් බොහෝ ය. මේ සැම විටෙකදී ම ඔහුගේ අමිල කාර්යභාරය අරභයා වූ විචාරාත්මක අදහස් විවරණයට අදාළ පාර්ශ්ව පසුබට නොවූ වග පෙනේ. මෙහෙයින් ම ඔහුගේ සිනමානුරූපී දිවි සැරිය ලාභ-අලාභ, යස-අයස හා නින්දා-ප්‍රශංසා සමග ගලා ගිය බව පැහැදිලි ය. සිය දිවි සැරිය ඉක්මවා ජනගත වන්නට සැම කලාකරුවකුට ම හැකියාව නොලැබේ. එහෙත් සුගතපාල සෙනරත් යාපා යනු හෙට දවසේදීත් විද්වත් ඇසුරට කැඳවන කලාකරුවෙකි. ඔහු ලබන ඉහළ ම අගැයුම වන්නේ මෙයයි.

සුගතපාල සෙනරත් යාපා සුපැහැදිලි ව ම හමුවන අවස්ථා කිහිපයකි. පළමුවැන්න පූර්වයෙහි සඳහන් කළ 'සාමා' සිනමාපටයයි. ඔහු 'සාමා'හි පළමු පෙළ චරිතයක් ද නිරූපණය කළ වග සිහි කටයුතු ය. 'සාමා' සඳහා ඔහු ලියූ 'වනන්තරේ ගල් අරණේ' ගීය සිරිලක සිනමා ගීයේ එක් සන්ධිස්ථානයකි.

දෙවැනි අවස්ථාව 1969 වසරේදී ඔහු නිර්මිත 'මිනිසා සහ කපුටා' කෙටි සිනමාපටයයි. 'මිනිසා සහ කපුටා' 1969 සිව් වැනි නවදිල්ලි අන්තර්ජාතික සිනමා උලෙළෙහිදී රජත මයුර සම්මානයෙන් පිදුම් ලැබුවේ සිරිලක තරුණ සිනමා ප්‍රේමීන්ගේ සිනමාකරණ උනන්දුව කුළුගන්වමිනි. මේ වන විටත් සිරිලක සිනමා කලාපයේ තරුණ කෙටි සිනමාපට නිර්මාණ මෙහෙයුම් ඇරඹී තිබිණි. මෙයට ජවයක් සේ ම දැක්මක් ද ලබා දුන් සුවිශේෂ අවස්ථාවක් ලෙසින් ද 'මිනිසා සහ කපුටා' හඳුන්වා දීම යුක්තියුක්ත ය.

'හන්තානේ කතාව' යාපා හමුවන තෙවැනි අවස්ථාවයි. 'හන්තානේ කතාව', සිනමාපටයක අනුෂාංගික අංග නව හා විකල්ප ලකුණු සහිත ව පළ කිරීමේදී සපුරා ගත යුතු නිර්භය බවත් ඉන් ජනිත විය හැකි අවදානම මතකසිටිනසුළු බවත් එක් විට ම ප්‍රකාශ කළ අවස්ථාවකි. නවක ප්‍රතිභාසම්පන්න තරුණ පිරිසකට වෘත්තාන්ත සිනමාවේ දොරගුළු විවර කර දුන් අවස්ථාවක් ලෙසින් ද 'හන්තානේ කතාව' හඳුන්වා දීම සහේතුක ය.



සුගතපාල සෙනරත් යාපාගේ සමුගැනීම සිරිලක සිනමාවේ එක් ස්වර්ණමය යුගයක නිමාව සනිටුහන් කරයි. මේ වන විට ඔහුගේ සමකාලීනයන් බොහෝ දෙනකු දිවියෙන් සමුගෙන ය. එහෙත් යාපා හා ඔවුන් පිළිබඳ කරුණු දැක්වීම් කල් ඉකුත් නොවන සැටියකි. ඉන් කියැවෙන්නේ යාපා හා ඔහුගේ සමකාලීනයන් කිසිසේත් ම සිරිලක සිනමාව හැර නොයන බවයි.

යාපා සිරිලක සිනමාවේ ප්‍රවීණතම හා ජ්‍යෙෂ්ඨතම සිනමාකරුවකු වන්නේ වෘත්තාන්ත සිනමාපටත්‍රයක් පමණක් නිර්මාණය කරමිනි. උක්ත තෙවැනි අවස්ථාවට ඔහුගේ අනෙක් වෘත්තාන්ත සිනමාපට ද්විත්වයත් එක්කරලිම වැදගත් ය. මෙයින් 'පෙම්බර මධු' අතිශය ආන්දෝලනාත්මක සිනමාපටයක් වූ වග කිව යුත්තකි. සිනමාව හසුරුවන ඇතැම් සදාචාර කියැවීම් සතු අගතිගාමී බව නොතැකූ යාපා "සිනමාව සම්මත කලාත්මක ලකුණු සහිත ව ම පැවතිය යුතු ය" යන මිථ්‍යාව නොසලකා හරින්නට ද 'පෙම්බර මධූ' සහයකොට ගත් වග පෙනේ.

සිනමාව මිනිස් මනසේ සියුම් තැන් පිරිමදින්නට සමත් මෙවලමක් බව පවසන අතලොස්සක් වූ සිරිලක සිනමාපට අතරට යාපා අවසන් වරට නිර්මාණය කළ 'ඉන්ද්‍රට මල් මිටක්' ද එක්වෙයි. සිනමාකරුවකු සේ තමා වඩා පරිණත වී ඇති බව ද ඔහු මෙහිදී පවසයි.

යාපා අසීරුවෙන් හමුවන්නට සිදුවන්නේ වාර්තා සිනමාව විෂයෙහි ය. සිරිලක වාර්තා සිනමාවට නව හරවත් අරුත් ගෙනා සිනමාකරුවන් අතර යාපා පළමු වැන්නකු ම වෙයි. මේ සඳහා ඔහුට අවකාශ සැලසුණේ රජයේ චිත්‍රපට අංශයේ සේවය කරන්නට ලැබුණු අවස්ථාව ය. ඔහු රජයේ චිත්‍රපට අංශයේ කාර්ය විෂයාසක්ත ව පුළුල් කළ නිර්මාපකයකු සේ හඳුන්වා දීමට ද පුළුවන. 'ගරුඬගල', 'පස්වැන්න', 'උඩවැඩියා මල් දෙකක්', 'මහ සයුරෙන් දිය දෝතක්', 'අනාගතය උපන් දවස', 'දළදා සිරිත' යාපාගේ විශිෂ්ට වාර්තා සිනමාපට අතරින් කැපී පෙනේ. වාර්තා-වෘත්තාන්ත ස්වරූපයේ නිර්මාණයක් වූ 'පියා සහ දරුවෝ' නොයෙකුත් ප්‍රශ්න කිරීම් ආදියට මුහුණදුන් වග කිව යුතු ය. කෙසේ වෙතත් මේ සැම විටෙකදී ම සිය නිර්මාණශීලීත්වයේ අනන්‍යතාව බැහැර නොකිරීමට යාපා උත්සුක වූ බව නොරහසකි.

යාපා හමුවිය හැකි අනෙක් අවස්ථාව වනුයේ සිනමා ගී රචනා සමුච්චයක් අභියස ය. මෙහි පළමු වැන්න පෙර සඳහන් කළ 'සාමා'හි ආ ගීයයි. දෙවැන්න මහගම සේකර සමග 'හන්තානේ කතාව'ට රචනා කළ 'සරා සොඳුරු මල් පැටලී' ගීයයි. මෙය සිරිලක සිනමාවේ හමුවන අපූර්වතම පෙම් ගීයක් සේ දත හැකි ය. තෙවැන්න 'ඉන්ද්‍රට මල් මිටක්' සිනමාපටය සඳහා රචනා කළ 'ලා හිරු පායලා' ගීයයි. මේ හැරුණු විට එච්. ඩී. ප්‍රේමරත්නගේ 'දෙවැනි ගමන' සිනමාපටය සඳහා ඔහු රචනා කළ ගී ද්විත්වය ද මතකයේ රැඳෙනසුළු ය.

සුගතපාල සෙනරත් යාපාගේ සමුගැනීම සිරිලක සිනමාවේ එක් ස්වර්ණමය යුගයක නිමාව සනිටුහන් කරයි. මේ වන විට ඔහුගේ සමකාලීනයන් බොහෝ දෙනකු දිවියෙන් සමුගෙන ය. එහෙත් යාපා හා ඔවුන් පිළිබඳ කරුණු දැක්වීම් කල් ඉකුත් නොවන සැටියකි. ඉන් කියැවෙන්නේ යාපා හා ඔහුගේ සමකාලීනයන් කිසිසේත් ම සිරිලක සිනමාව හැර නොයන බවයි.



# යා දෙක නොරත රත



**චූලානන්ද සමරනායක**
ප්‍රවීණ සාහිත්‍යධර

**මැතිවරණ කාලසීමාවකි. සාහිත්‍ය මාසයේ දේශපාලනය කරළියට පැමිණීම සාහිත්‍යයට බලපෑමක් ඇතිකරයි ද? යන කසුකුසුව සාහිත්‍ය ක්ෂේත්‍රයේ මතු වෙමින් තිබේ. එබැවින් දේශපාලනය යන පුළුල් අර්ථයත් මැතිවරණය, පක්ෂ දේශපාලනය වැනි සංකල්පත් සාහිත්‍යයත් පිළිබඳ තතු බිඳක් මතු කර ගනු රිසියෙන් ප්‍රවීණ සාහිත්‍යධරයකු සමග මෙම කතාබහ සිදු වේ.**

ප්‍රශ්නය; සාහිත්‍ය සහ දේශපාලනය අතර තිබෙන්නේ සහසම්බන්ධයක් ද? ප්‍රතිවිරෝධතාවක් ද?

පිළිතුර; සෑම දෙයක් ම දේශපාලනිකයි. දේශපාලනයෙන් වියුක්ත කිසිවක් නැහැ. ඒ අනුව සාහිත්‍යයත් මුළුමනින් ම දේශපාලනිකයි. නමුත් අප වරද්දා ගත්තේ සාහිත්‍යය සහ පක්ෂ දේශපාලනය පටලවා ගැනීමෙන්. බොහෝ විට සාහිත්‍යකරුවා කිසියම් දේශපාලන පක්ෂයක සාමාජිකයකු හෝ යම් මතවාදයක් දරන්නකු බවට පත්වී එය තමන්ගේ සාහිත්‍ය භාවිතාව සමග ක්‍රියාත්මක කරන්නට පටන් ගත් තැන් පටන් මේ පටලැවිල්ල නිර්මාණය වනවා. දේශපාලන මතය යනු තමා අනුගත පක්ෂයක හෝ මතවාදයක් දරන කණ්ඩායමක සියල්ල කරබාගෙන පිළිගැනීම නොවෙයි. එහි මනුෂ්‍යයාට නොගැළපෙන වරදකාරී ක්‍රියා පිළිවෙත්වලට එරෙහි වීමත් සාහිත්‍යකරුවාගේ දේශපාලනයමයි. ඒ අර්ථයෙනුයි සාහිත්‍යය දේශපාලනික වන්නේ. එය දේශපාලනයෙන් ගළවා 'තමා දේශපාලනික නෑ' යනුවෙන් කිසියම් සාහිත්‍යකරුවකු ඇඟ බේරා ගැනීමේ ප්‍රකාශ කරයි ද? එම ප්‍රකාශය ද දේශපාලනිකයි. දේශපාලනය යන පුළුල් අර්ථයෙහි තිබෙන්නේ පක්ෂ කිහිපයක ප්‍රතිපත්තිවලට සීමා වූ දෙයක් නොවෙයි. ඊට වඩා පුළුල් දෙයක්. එතැනට ගමන් කිරීමයි අප සාහිත්‍යකරුවන් වශයෙන් කළ යුතු කාර්යය. උදාහරණයක් ලෙස මැක්සිම් ගෝර්කිට බොහෝ අය චෝදනා කරනවා ඔහු ස්ටාර්ලින්වාදියෙක් ය, සමාජවාදයට පක්ෂ වූවෙක් ය, මාක්ස්වාදය ගරු කළ අයෙක් ය, ලෙනින්ගේ මිත්‍රයෙක් ය කියා. නමුත් ඔහුගේ සාහිත්‍ය නිර්මාණ ගැඹුරින් කියෙව්වොත් පැහැදිලි වනවා, ඊට වඩා පුළුල් මානුෂීය සමාජ කාරණා වෙනුවෙන් ඔහු පෙනී සිටි බව. සමාජවාදී සන්දර්භයක වුණත් මිනිස්සුන්ට එරෙහි ව වැරදි සිදු වන විට පාලකයන්ට එරෙහි ව ඔහු සාහිත්‍යය අවියක් ලෙස භාවිත කළා. 'අකාල චින්තා' ලෙස රන්ජන් සේනාසිංහ සිංහලට පරිවර්තනය කළ ගෝර්කිගේ Untimely Thoughts වැනි කෘතිවලින් පැහැදිලි වන්නේ ගෝර්කි, ලෙනින්ට පවා අභියෝගාත්මක ව ලියූ බව. පාක්ෂිකත්වය, දේශපාලන මතවාදය හෝ මිත්‍රත්වය වැනි කාරණා සාහිත්‍යයට අදාළ කර නොගත යුතු බවයි ඉන් කියැවෙන්නේ. සාහිත්‍යකරුවාගේ දේශපාලනය විය යුත්තේ එවැන්නක්.

**රට අඩියක් හෝ ඉදිරියට ගන්න පුළුවන් ආකාරයේ උත්තේජනයක් සපයා දිය හැකි නිර්මාණයක් කිරීමයි මගේ උත්සාහය. තමනුත් වෙනස් වෙලා සමාජයේ වෙනස් විය යුතු තැන් වෙනස් කළ යුතුයි යන පෙළඹවීම ඇති කරන විදෙස් කෘතියක් මට ලැබුණොත් දෙවරක් නොසිතා ම මා එය පරිවර්තනය කරනවා. ස්වතන්ත්‍ර නිර්මාණවලදී මා උත්සාහ කරන්නේ පවත්නා ක්‍රමයේ තිබෙන ජඩ ස්වභාවය එළිදරව් කිරීම සහ ඒ වෙනුවට සුදුසු වෙනත් උසස් ජීවිතයක් යෝජනා කිරීම යන නිර්ණායක මත පදනම් ව නිර්මාණ කරන්නට.**

ප්‍රශ්නය; සාහිත්‍යකරුවා කළ යුත්තේ පාලකයන්ට එරෙහි වීම ද?

පිළිතුර; නැහැ. සාහිත්‍යකරුවාගේ පරම වගකීම විය යුත්තේ මනුෂ්‍යත්වයට පක්ෂග්‍රාහී වීම. මනුෂ්‍යත්වයට පක්ෂ වන විට සමහර දේශපාලනික සහ වෙනත් දේවලට එරෙහි වන්නට සිදු වනවා. එය තීරණය වන්නේ දේශපාලකයා මනුෂ්‍යත්වයට නොගැළපෙන යම් දෙයක් ක්‍රියාවට නංවන විට, ඒ අදාළ කාරණාවට අනුව තමාගේ දේශපාලන ස්ථාවරය සහ පක්ෂය වුව ද විවේචනයට සහ විචාරයට ලක් කරන්නට තරම් සාහිත්‍යකරුවා මානුෂීය වීම මතයි. එරෙහි වීම යනුවෙන් අදහස් කරන්නේ පවත්නා ක්‍රමය මිනිසාට සතුරුනම් පමණක් ඊට එරෙහි වීමයි. මනුෂ්‍ය පැවැත්මට එරෙහි සෑම දෙයකට ම එරෙහි වීම සාහිත්‍යකරුවාගේ වගකීමක්.

ප්‍රශ්නය; පක්ෂ දේශපාලනය සහ සාහිත්‍යය අතර පැවතිය යුත්තේ කවරාකාර ගනුදෙනුවක් ද?

පිළිතුර; සාහිත්‍යකරුවා සෑම විට ම දේශපාලන පක්ෂවලට ඉදිරියෙන් සිටිය යුතුයි. තමා සාමාජිකත්වය දරන පක්ෂයේ වුණත් වැරැද්ද නිවැරැද්ද පැවසිය හැකි අන්දමේ විවේචනාත්මක සහ විචාරාත්මක මැදිහත්කරුවකු ලෙස ඉහළ භූමිකාවකයි සාහිත්‍යකරුවා සිටිය යුත්තේ. ඔහු හෝ ඇය දේශපාලන පක්ෂයක සාමාජිකයකු වීම නොහොබි කියා හෝ තහනම් කියා හෝ ඉන් අදහස් වන්නේ නැහැ. පුරවැසි අයිතියක් වන එය තමන්ගේ සාහිත්‍ය මෙහෙවරට හෝ උත්තරීතර මනුෂ්‍යත්වයට හෝ වඩා ඉහළින් තබා නොගත යුතුයි.

ප්‍රශ්නය; දෙස් විදෙස් සම්මානයට පාත්‍ර වුණු ලේඛකයකු ලෙස ඔබ යම් නිර්මාණයකදී පෞද්ගලික ව දේශපාලනය යන සාධකය අදාළ කරගන්නේ කෙසේ ද?

පිළිතුර; රට අඩියක් හෝ ඉදිරියට ගන්න පුළුවන් ආකාරයේ උත්තේජනයක් සපයා දිය හැකි නිර්මාණයක් කිරීමයි මගේ උත්සාහය. තමනුත් වෙනස් වෙලා සමාජයේ වෙනස් විය යුතු තැන් වෙනස් කළ යුතුයි යන පෙළඹවීම ඇති කරන විදෙස් කෘතියක් මට ලැබුණොත් දෙවරක් නොසිතා ම මා එය පරිවර්තනය කරනවා. ස්වතන්ත්‍ර නිර්මාණවලදී මා උත්සාහ කරන්නේ පවත්නා ක්‍රමයේ තිබෙන ජඩ ස්වභාවය එළිදරව් කිරීම සහ ඒ වෙනුවට සුදුසු වෙනත් උසස් ජීවිතයක් යෝජනා කිරීම යන නිර්ණායක මත පදනම් ව නිර්මාණ කරන්නට. එහි අදහස පවත්නා තතත්වය නිවැරදි ව විග්‍රහයට ලක් කිරීම, ඒවා විචාරය කිරීම සහ මිනිස්සුන්ට එතැනින් ගැළවී පියවරක් ඉදිරියට තැබීමට අවශ්‍ය පාරක් සැකසීම. එයයි, රටක සාහිත්‍යකරුවාගේ වගකීම.

**වෙනත් රටවල ලේඛක, පාඨක, ප්‍රකාශක පාර්ශ්ව එක් ව විදේශීය සම්භාවනීය සාහිත්‍යකරුවන් පවා එම රටවලට ගෙන්වාගෙන සාහිත්‍ය මාසයේ ජාත්‍යන්තර මට්ටමේ විවිධ වැඩසටහන් ක්‍රියාවට නංවනවා. ඇතැම් රටවල ඒවා වසරේ ම අඛණ්ඩ ව පවත්වනවා. අඩු ම තරමේ ශ්‍රී ලංකාවේ ලේඛකයන්ට එවැන්නකට සම්බන්ධ වන්නට ගුවන් ටිකට් පතක් ලබා දීමේ ප්‍රමුඛතාවක්, විශේෂ පහසුකම් සලසා දීමක් හෝ ඒ සඳහා සහය වීමක් කිසිදු පාර්ශ්වයකින් සිදු වන්නේ නැහැ. එතරම් ම කුඩම්මාගේ සැලකිලිවලට අපේ රටේ ලේඛකයා මුහුණදෙනවා.**

ප්‍රශ්නය; සාහිත්‍යය වෙනුවෙන් වෙන් වූ මාසයේ මැතිවරණයක් පැවැත්වෙනවා. ඒ වාතාවරණය සාහිත්‍යයට බලපාන ආකාරය ගැන ඔබට යම් අදහසක් තිබෙනවා ද?

පිළිතුර; සාහිත්‍ය මාසයේ දේශපාලන ක්‍රියාකාරකමක් හෝ මැතිවරණයක් පැවැත්වීම මේ වර්ෂයට පමණක් සීමා වන කාරණයක්. නමුත් සාහිත්‍ය මාසය වෙළෙන්දන්ගේ මාසය බවට පත්වීම ඊට වඩා සැලකිල්ලට ගත යුතු කාරණයක්. ශ්‍රී ලංකාවේ ප්‍රකාශකයන් වාර්ෂික ව සැණකෙළි ස්වරූපයෙන් සංවිධාන කරන පොත් ප්‍රදර්ශනවල වැඩිපුර තිබෙන්නේ කියවීම හුරුකරවීමට තිබෙන පොත්වලට වඩා අභ්‍යාස පොත්, පැන්සල්, පෑන්, ඇඳුම්, පැලඳුම්, ආහාර-පාන, සෙල්ලම් බඩු, විනෝද ක්‍රීඩා, තරග වැනි දේ. පොත්වල මිල අඩුකිරීමට, මුද්‍රණ වියදම් අඩු කර ගැනීමට, අමුද්‍රව්‍ය මිල පහත හෙළා ගැනීමට, ළමයින්ට සහ වැඩිහිටියන්ට කියවීම් පුරුද්ද ඇති කිරීමට මාරාන්තික ව පෙනී සිටිය යුතු වුවත් එසේ පෙනී සිටිනවාද? ඇත්තට ම මැතිවරණයක් තිබෙන මේ සමයේ ප්‍රකාශකයන්ට, ලේඛකයන්ට වගේ ම පාඨකයන්ටත් හැකියාවක් තිබිය යුතුයි මේ කාරණය හුවා දක්වන්නට. පොත් කර්මාන්තයට සහ සාහිත්‍යකරණයට එල්ල වී ඇති මේ තර්ජනවලින් මිදෙන්නට කුමන ජනාධිපති අපේක්ෂකයා ද මතයක් ප්‍රකාශ කරන්නේ?. කුමන මැතිවරණ වේදිකාවේ ද 'සාහිත්‍ය' මාතෘකාවක් කර ගන්නේ?. මේ කතිකාවට ඔවුන් පොළඹවන්නට ලේඛක, ප්‍රකාශක, පාඨක ජනතාවට මැදිහත් වීමට හොඳම අවස්ථාවක් මේ මැතිවරණ සමය. නමුත් ව්‍යාපාරික අවශ්‍යතාව පමණක් තිබෙන ප්‍රකාශකයන්ට ලාභය හැර අන්කිසි දැක්මක් නැති නිසා ඔවුන් මේ සඳහා ක්‍රියාත්මක වන්නේ නැහැ. සාධාරණ මිලකට හොඳ පොතක් කියවන්නට තමාට තිබිය යුතු අයිතිවාසිකම පිළිබඳ දැනුමක් පාඨකයාට නැහැ. ලේඛකයන්ට සාමූහිකත්වයක් නැහැ. නමුත් වෙනත් රටවල ලේඛක, පාඨක, ප්‍රකාශක පාර්ශ්ව එක් ව විදේශීය සම්භාවනීය සාහිත්‍යකරුවන් පවා එම

**සාහිත්‍යකරුවා සෑම විට ම දේශපාලන පක්ෂවලට ඉදිරියෙන් සිටිය යුතුයි. තමා සාමාජිකත්වය දරන පක්ෂයේ වුණත් වැරැද්ද නිවැරැද්ද පැවසිය හැකි අන්දමේ විවේචනාත්මක සහ විචාරාත්මක මැදිහත්කරුවකු ලෙස ඉහළ භූමිකාවකයි සාහිත්‍යකරුවා සිටිය යුත්තේ. ඔහු හෝ ඇය දේශපාලන පක්ෂයක සාමාජිකයකු වීම නොහොබි කියා හෝ තහනම් කියා හෝ ඉන් අදහස් වන්නේ නැහැ.**

රටවලට ගෙන්වාගෙන සාහිත්‍ය මාසයේ ජාත්‍යන්තර මට්ටමේ විවිධ වැඩසටහන් ක්‍රියාවට නංවනවා. ඇතැම් රටවල ඒවා වසරේ ම අඛණ්ඩ ව පවත්වනවා. අඩු ම තරමේ ශ්‍රී ලංකාවේ ලේඛකයන්ට එවැන්නකට සම්බන්ධ වන්නට ගුවන් ටිකට් පතක් ලබා දීමේ ප්‍රමුඛතාවක්, විශේෂ පහසුකම් සලසා දීමක් හෝ ඒ සඳහා සහය වීමක් කිසිදු පාර්ශ්වයකින් සිදු වන්නේ නැහැ. එතරම් ම කුඩම්මාගේ සැලකිලිවලට අපේ රටේ ලේඛකයා මුහුණදෙනවා. මැතිවරණයක් ආසන්නයේ වුණත් පාඨකයාගේ, ලේඛකයාගේ, ප්‍රකාශකයාගේ හෝ සමස්ත සාහිත්‍ය ක්ෂේත්‍රයේ අභිලාෂ නිරූපණය වන බවක් පෙනෙන්නට නොතිබීම කනගාටුවට කරුණක්.

ප්‍රශ්නය; දේශපාලනය හා මනුෂ්‍යත්වය සමග සාහිත්‍යය ගළපාගෙන සාහිත්‍යකරණයේ නියැළීමට පුද්ගලික ව ඔබ දරන උත්සාහයෙන් බලාපොරොත්තු වන ප්‍රතිලාභය කුමක් ද?

පිළිතුර; එක ම ප්‍රතිලාභය ආත්ම තෘප්තිය පමණමයි. සමාජය වෙනස් වෙයි ද? නැද්ද? තිබුණාට වඩා හොඳ වෙයිද? නරක් වෙයි ද? යන කාරණා මට අදාළ නැහැ. මගේ පළමු උත්සාහය හිතට එකඟ ව ජීවත් වීම. එවිට සාහිත්‍ය භාවිතාවේදී මගේ මතය වෙනුවෙන් කිසිදු බලපෑමකට යටත් නොවී මට පෙනී සිටින්නට පුළුවන්. ඒ වෙනුවෙන් වැඩ කරන්නට පුළුවන්. දෙවැනි ව, තිබෙන තත්ත්වයෙන් ඉදිරියට රසික සමාජය තල්ලු කිරීම. මේ කාරණා දෙක ඉෂ්ට වෙනවානම් එයින් ආර්ථික ලාභයක් ලැබෙනවා ද? සමාජ පිළිගැනීමක් ලැබෙනවා ද? වරදාන වරප්‍රසාද ලැබෙනවා ද? යන්න මා මායිම් කරන්නේ නැහැ. කිසි ම බලාපොරොත්තුවක් නැතුව ජනතාව වෙනුවෙන් සාහිත්‍යයෙන් වැඩ කරනවා.

ප්‍රශ්නය; වත්මන් සමාජ ක්‍රමය අනුව ජනතාව වෙනුවෙන් වැඩකරන්න වුණත් පුද්ගලික ව යහපත් ආර්ථික තත්ත්වයක් තිබිය යුතුයි නේද?

පිළිතුර; කලාකරුවකුට ජීවත් වීම සඳහා යම් නිශ්චිත මිලක් තිබිය යුතුයි. ඒ නිසයි ජී. බී. සේනානායක පසුකාලීන ව කියන්නේ "මගෙන් සම්මුඛ සාකච්ඡාවක් ගන්න අවශ්‍යනම් මට ගෙවන්න" කියලා. හැබැයි මා පුද්ගලික ව තේරුම් ගත් කාරණය තමයි, අප සිටින්නේ ජී.බී. සිටි කාලයටත් වඩා බරපතළ පරිහානිගත සමයක බව. අප කොන්දේසි සහ ප්‍රතිලාභ මත පිහිටාගෙන ම ක්‍රියා කළහොත් මේ රටේ කිසිවක් කළ නොහැකියි. ඒ නිසා මගේ සාහිත්‍ය කාර්යය මනුෂ්‍යයා වෙනුවෙන් මෙහෙයවීම නතර වන්නේ නැහැ. බාජින් විටෙක පවසනවා "මම ලිවීමට ජීවත් වනවා මිස ජීවත් වීමට නොලියමි" යනුවෙන්. සාහිත්‍යකරුවන් වන අපේ තේමා පාඨය එය විය යුතුයි. එය මාක්ස්ගේ අදහසක්. ඉටු කිරීම අමාරු කාර්යයක්. එවැනි අපේක්ෂා සාර්ථක වන්නේ කලාකරුවන්ට, කලා කෘතිවලට, සාහිත්‍යයට සලකන දියුණු සමාජ සංස්කෘතික ක්‍රමයක් තිබෙන රටක පමණයි. එම රට බිහි කරන්න සටන් කරනවා හැර වෙනත් විකල්පයක් කලාකරුවාට හෝ සාහිත්‍යකරුවාට හෝ තිබෙන්න බැහැ. දැනට තිබෙන්නේ පවතින ක්‍රමයට අනුගත ව තමන්ට කුමක් හෝ සරි කර ගන්නා ක්‍රමයක්. එසේ නොකරන සැබෑ සාහිත්‍යකරුවන්, කලාකරුවන් සිටිනවානම් කළ යුත්තේ බාජින් පැවසූ ආකාරයට රටේ එවැනි තත්ත්වයකට සුදුසු පසුබිම ගොඩනැගීම. එම ඉලක්කය කිසි ම හේතුවක් නිසා අතහැර ගත යුතු නැහැ. අඛණ්ඩ ව ඒ වෙනුවෙන් පෙනී සිටිය යුතුයි. නැත්නම් අනාගත පරම්පරාව ඉදිරියටත් අත්දකින්නේ මනුෂ්‍යත්වයේ චරිතාදර්ශ නැති රටක්.

ප්‍රශ්නය; ක්‍රියාත්මක වන සමාජ ධාරා සමග මෙවැනි අදහස් සහ හැඟීම්වල නොගැළපීමක් ඇති වී කලකිරීමක් ඇතිවන්නේ නැද්ද?

පිළිතුර; නැහැ. එහෙත් එතැනයි අප වැරදි මංතීරුවට වැටෙන තැන. මුදල, බලය සහ වරප්‍රසාද මත ම අපත් නැහෙන්න ගත්තොත් බලාපොරොත්තු වන උත්තරීතර මනුෂ්‍යත්වය විදාරණය කරන සාහිත්‍යකරුවකු, කලාකරුවකු වන්නේ කෙසේ ද? මෙතැනදීයි සාහිත්‍යකරුවා සිය අරමුණ පිහිටුවා ගැනීමේ වැදගත්කම ඉස්මතු කර ගත යුත්තේ. ලේඛනය ස්වාධීන කරගෙන අනෙක් සියල්ල ද්විතීයික කොට සලකා අතහැර පැත්තකින් තැබිය යුතුයි. සාහිත්‍යකරණයේ යෙදෙන අවස්ථාවල පවුලේ, රැකියාවේ, සමාජයේ වගකීම් සියල්ල බැහැර කිරීමට තරම් උසස් මනසක් ලේඛකයකුට තිබිය යුතුයි.

ප්‍රශ්නය; සාහිත්‍යකරුවා අසාමාන්‍ය මනුෂ්‍යයකු විය යුතු බව ද ඉන් කියැවෙන්නේ?

පිළිතුර; ඔව්. අත්හැරීමේ, පරිකල්පනයේ හෝ චින්තනයේ සීමා නැති සාහිත්‍යකරුවා සාමාන්‍ය මනුෂ්‍යයකුට වඩා එහා දකින්න පුළුවන් මනුෂ්‍යයෙක්. බොහෝ දේ දරා ගත හැකි, භාර ගත හැකි, කැපවීමක් සහ ආත්මපරිත්‍යාගයක් ඇති සාහිත්‍යකරුවා සාමාන්‍ය මහජනයාටත් දේශපාලකයන්ටත් පක්ෂවලටත් වඩා ඉදිරියෙන් සිටිනවා යන්නයි මේ කියමනේ අර්ථය. සාහිත්‍යකරුවා වෙනුවෙන් දේශපාලකයා කිසිවක් කළ යුතු නැහැ. රටේ සාහිත්‍යය නොමරා සිටීමත් සාහිත්‍යකරුවාට අවශ්‍ය පරිසරය රටේ නිර්මාණය කිරීමත් ප්‍රමාණවත්. එවිට සාහිත්‍යකරුවාට තිබෙන්නේ තමන්ගේ වගකීම ඉෂ්ට කරන්න, සාමූහික ජීවිතයක් වෙනුවෙන් පෙනී හිටින්න සහ සමස්තය වෙනුවෙන් සටන් කරන්න. දේශපාලකයා මේ කිසිවක් නොකරන නිසා සාහිත්‍යකරුවා කැප විය යුත්තේ ඒ වෙනුවෙන්. සම්මාන වෙනුවෙන් නොවෙයි.

**නුවන් කුමාර කටුගම්පල**

# e පොත් සහ පොත්

කපිල එම්. ගමගේ

සන්නිවේදන තාක්ෂණයේ දියුණුවත් සමග ලොව පළමුවෙන් ම පහළ වූ මුද්‍රිත සන්නිවේදනය ඇදැහිය නොහැකි ආකාරයට වෙනස් විය. උත්තල මුද්‍රණයේ සිට සමතල මුද්‍රණය දක්වා පැමිණි ගමනේදී ලොව පළමු ව බිහි වූ මුද්‍රිත නිෂ්පාදනය පොත් විය. ඒදා සිට මේ දක්වා ලක්ෂ සංඛ්‍යාත මුද්‍රිත කෘති විවිධ ප්‍රවර්ග ඔස්සේ බිහිවී ඇති අතර අතිමහත් පාඨක ලෝකයක් ද ගොඩ නගාගෙන තිබේ. එහෙත් අද්‍යතන ලෝකයේ මුද්‍රිත මාධ්‍ය මුහුණ පා සිටින බරපතල අභියෝග යකි. එනම් සන්නිවේදන තාක්ෂණය ඩිජිටල්කරණය වීමත් සමග ම මුද්‍රික ප්‍රකාශන වෙනුවට ඩිජිටල් ප්‍රකාශන බිහිවීමත් ඒවා සඳහා පාඨක ලෝකය පුළුල් වීම වේගවත් වීමත් සිදු විය. මෙහිදී මුද්‍රිත සන්නිවේදනය විශාල අභියෝගයකට මුහුණ දී තිබේ ද? යන්න විශේෂයෙන් මුද්‍රිත පොත් ගැන උනන්දුවක් දක්වන වකවානුවක සොයා බැලිය යුතු කාරණයකි.



'ඊ-පොතක්' යනුවෙන් හැඳින්වෙන්නේ ටැබ්ලට්, ස්මාර්ට් ෆෝන් සහ පරිගණක වැනි විවිධ ඉලෙක්ට්‍රොනික උපාංගවල භාවිතයෙන් කියවිය හැකි සාම්ප්‍රදායික මුද්‍රණ පොතක ඩිජිටල් අනුවාදයකි. විද්‍යුත් පොත් EPUB, PDF, සහ MOBI වැනි විවිධ ආකෘතිවලින් ලබා ගත හැකි අතර එම සියල්ල විවිධ විශේෂාංග සහ විවිධ උපාංග සමග කියවිය හැකි ය.

ප්‍රසිද්ධ ස්කොට්ලන්ත ලේඛිකාවක් වන සාරා ෂෙරිඩන් විද්‍යුත් පොත් ගැන දක්වන අදහස වන්නේ "eBook යනු භෞතික පොතේ මරණය නොවේ. එය අලුත් එකතු කිරීමක්, වෙනස් ආකාරයක ප්‍රකාශනයක් සහ කියවීමට තවත් ක්‍රමයක්." ලෙසිනි.

භෞතික පොත් මෙන් නොව eBooks යනු ඉලෙක්ට්‍රොනික උපාංග මත බාගත කිරීමට, ගබඩා කිරීමට සහ කියවිය හැකි ඩිජිටල් ගොනු වේ. මෙම නිසා මෙය පහසුවෙන් ප්‍රවේශ වීමට සහ අතේ ගෙන යාමේ හැකියාවට ඉඩ සලසයි. බොහෝ විද්‍යුත් පොත් පාඨකයන්ට තම අභිමතය පරිදි අන්තර්ගත පෙළ ප්‍රමාණය, අකුරු වර්ගය සහ තිර දීප්තිය සකස් කිරීමට ඉඩ සලසන අතර කියවීම තමන්ට අවශ්‍ය ලෙස වඩාත් සුවපහසු කරයි.

ඇතැම් විද්‍යුත් පොත්වල අධි සබැඳි, බහුමාධ්‍ය අන්තර්ගතය (වීඩියෝ, ශ්‍රව්‍ය) සහ විවරණ වැනි අන්තර්ක්‍රියාකාරී මූලද්‍රව්‍ය ඇතුළත් වේ. එය කියවීමේ අත්දැකීම වැඩිදියුණු කරයි. විද්‍යුත් පොත් බොහෝ විට සෙවුම් කාර්යයක් සමග පැමිණේ. එය පාඨකයන්ට පොතේ නිශ්චිත වචන, වාක්‍ය ඛණ්ඩ හෝ කොටස් ඉක්මනින් සොයා ගැනීමට ඉඩ සලසයි. අන්තර්ගතය වෙත ක්ෂණික ප්‍රවේශයක් ලබා දෙමින් eBooks අන්තර්ජාල පොත් සාප්පුවලින් හෝ පුස්තකාලවලින් ක්ෂණික ව මිල දී ගෙන බාගත කළ හැකියි. මේ නිසා ඇතැම් පාඨකයෝ මුද්‍රිත පොත්වලට වඩා විද්‍යුත් පොත්වලට වැඩි කැමැත්තක් දක්වති. විද්‍යුත් පොත් පරිසර හිතකාමී වේ, ඒවාට කඩදාසි, තීන්ත හෝ භෞතික ප්‍රවාහනයක් අවශ්‍ය නොවන බැවින් පරිසරයට ඒවායේ කාබන් මුසුවීම අඩු කරයි. විද්‍යුත් පොත්වලට මුද්‍රණ හෝ ප්‍රවාහන පිරිවැය ඇතුළත් නොවන නිසා ඒවායේ භෞතික මුද්‍රණයට වඩා බොහෝ විට ලාභදායී වේ.

විද්‍යුත් පොත්වල නැගීම මුද්‍රිත පොත් කෙරෙහි සැලකිය යුතු බලපෑමක් කර ඇති අතර ප්‍රකාශන කර්මාන්තයේ විවිධ අංශ, පාරිභෝගික හැසිරීම් සහ කියවීමේ පුරුදු කෙරෙහි එය බලපෑම් කර තිබේ. මේ නිසා මුද්‍රිත පොත් කෙරෙහි එය ධනාත්මක හෝ සෘණාත්මක හෝ බලපෑමක් ඇති කර තිබේදැයි සොයා බැලිම වැදගත් වේ.

විද්‍යුත් පොත්වල අතේ ගෙන යා හැකි සහ නම්‍යශීලී බව නිසා විශේෂයෙන් සංචාරය කරන හෝ ගමනාගමනයේ යෙදෙන පුද්ගලයන් අතර නිතර කියවීම දිරිමත් කර තිබෙනු දැකිය හැකි ය. ඇතැම් පාඨකයන් තවමත් භෞතික පොත්වල

ස්පර්ශක අත්දැකීම් සහ එහි භෞතික සෞන්දර්යයට කැමති බව ප්‍රකාශ වේ.

මුලදී විශේෂයෙන් ප්‍රබන්ධ වැනි විද්‍යුත් පොත්වලට තිබූ ජනප්‍රියතාව මුද්‍රිත පොත් අලෙවිය අඩුවීමට හේතු විය. එහෙත් මෑත වසරවලදී මුද්‍රිත පොත් අලෙවිය ස්ථාවර වී ඇත. ඇතැම් විට වෙළෙඳපොළේ එය වර්ධනය වී ඇති අතර එම තත්ත්වය ඩිජිටල් සහ මුද්‍රණ ආකෘති අතර සමතුලිතතාවක් ඇති කිරීමට ද හේතු වී තිබේ.

ප්‍රේමකතා, විද්‍යා ප්‍රබන්ධ වැනි ඇතැම් ප්‍රභේදවල ඉහළ විද්‍යුත් පොත් අලෙවියක් තිබෙන අතර චිත්‍ර පොත්, ඉවුම් පිහුම් පොත් සහ ළමා පොත් වැනි අනෙකුත් ඒවා දෘශ්‍ය සහ අන්තර්ක්‍රියාකාරී අංග හේතුවෙන් මුද්‍රණයේ වඩාත් ජනප්‍රිය ව පවතී.



ප්‍රකාශන කර්මාන්තයේ වෙනස්කම් ද මෙහිදී දැකිය හැකි ය. විද්‍යුත් පොත් ස්වයං-ප්‍රකාශනය වෙත පුද්ගලයන් වඩාත් ප්‍රවේශ වී ඇති අතර සාම්ප්‍රදායික ප්‍රකාශකයන් නොමැති ව කතුවරුන්ට ඔවුන්ගේ කෘති ප්‍රකාශයට පත් කිරීමට සහ බෙදා හැරීමට ඉඩ සලසා දී තිබේ. මෙය ප්‍රකාශන ක්‍රියාවලිය ප්‍රජාතන්ත්‍රවාදී කර ඇතත් තරගකාරිත්වය ද වැඩි කර ඇත.

eBooksහි නැඟීම ඉල්ලුම මත මුද්‍රණ සේවා වර්ධනය දිරිමත් කර ඇත. එහිදී පොත් මුද්‍රණය කරන්නේ ඇණවුම් කළ විට පමණි. එයින් නාස්තිය අවම කර තිබේ. එසේ ම බොහෝ ප්‍රකාශකයන් මුද්‍රණ සංස්කරණවලට පෙර හෝ ඊට සමගාමී ව පොත්වල ඩිජිටල් අනුවාද නිකුත් කරයි. ඇතැම් කුඩා ප්‍රකාශකයන්ට සහ ස්වාධීන කතුවරුන්ට ඩිජිටල් ආකෘතිවලින් පමණක් ප්‍රකාශනය කිරීමට තෝරා ගත හැකි ය.

මුද්‍රිත පොත්වලට වඩා විද්‍යුත් පොත් නිෂ්පාදනය සහ බෙදා හැරීම සාමාන්‍යයෙන් ලාභදායී වේ. එවිට පාරිභෝගිකයන්ට අඩු මිලකට ඒවා ලබා ගැනිමට අවස්ථාව ලැබේ. විශේෂයෙන් අඩු ජනප්‍රියතාවකින් යුතු මාතෘකා සඳහා මුද්‍රණ සංස්කරණවල ලාභදායිතාවට මෙය

**විද්‍යුත් පොත්වල නැඟීම මුද්‍රිත පොත් කෙරෙහි සැලකිය යුතු බලපෑමක් කර ඇති අතර ප්‍රකාශන කර්මාන්තයේ විවිධ අංශ, පාරිභෝගික හැසිරීම් සහ කියවීමේ පුරුදු කෙරෙහි එය බලපෑම් කර තිබේ. මේ නිසා මුද්‍රිත පොත් කෙරෙහි එය ධනාත්මක හෝ සෘණාත්මක හෝ බලපෑමක් ඇති කර තිබේදැයි සොයා බැලීම වැදගත් වේ.**

බලපෑ හැකි ය. විද්‍යුත් පොත්වල පහසුව තිබියදීත් බොහෝ පාඨකයන් සහ එකතු කරන්නෝ මුද්‍රිත පොත්වල භෞතික පැවැත්ම, සංස්කෘතික වැදගත්කම සහ දීර්ඝ පැවතිම අගය කරති.

ඊ-පොත් ඒවායේ ප්‍රවේශ්‍යතාව, අන්තර්ක්‍රියාකාරී විශේෂාංග සහ අන්තර්ගතය පහසුවෙන් යාවත්කාලීන කිරීමේ හැකියාව හේතුවෙන් අධ්‍යාපනික සැකසුම්වල වැඩි වැඩියෙන් භාවිත වේ. එහෙත් අධ්‍යයනවලින් පෙන්නුම් කරන්නේ ඇතැම් ඉගෙන ගන්නන් වඩා හොඳ අවබෝධයක් සහ තොරතුරු රඳවා තබා ගැනීම සඳහා මුද්‍රිත පොත්වලට වැඩි කැමැත්තක් දක්වන බවයි.

නොස්ටැල්ජියාව, භෞතික පොත්වල සෞන්දර්යාත්මක ආකර්ෂණය සහ පොත් සාප්පුවල සැරිසැරීමේ අත්දැකීම්වලින් මුද්‍රිත පොත් කෙරෙහි ඇති උනන්දුව නැවත මතු වී ඇත. විශේෂ සංස්කරණ, අලංකාර ලෙස නිර්මාණය කරන ලද දෘඪ කවර සහ එකතු කළ හැකි මුද්‍රණ පාඨක ආකර්ෂණය අඛණ්ඩ ව පවත්වා ගනියි. බොහෝ පාඨකයෝ දැන් දෙමුහුන් ප්‍රවේශයක් අනුගමනය කරති. පහසුව සඳහා විද්‍යුත් පොත් භාවිත කරන අතර විනෝදය සඳහා හෝ තෑගි හෝ ගෘහ පුස්තකාල වැනි විශේෂිත අරමුණු සඳහා මුද්‍රිත පොත් භාවිත කරති.

විද්‍යුත් පොත් සහ මුද්‍රිත පොත්වල සහජීවනය වඩාත් විවිධාංගීකරණය වූ වෙළෙඳපොළකට හේතු වී ඇති අතර ප්‍රකාශකයෝ විවිධ මනාප සහ අවශ්‍යතා සපුරාලීම සඳහා ආකෘති දෙක ම ඉදිරිපත් කරති. අන්තර්ජාල සාප්පු සවාරි සමග ඊ-පොත්වල ජනප්‍රියතාව භෞතික පොත් සාප්පු සඳහා අභියෝග එල්ල කර ඇත.

විශේෂයෙන් වාරික සංස්කරණවල උසස් තත්ත්වයේ කඩදාසි, පිටවැස්ම සහ නිමාව වඩාත් වැදගත් ය. කඩදාසි තෝරාගැනීම පොතේ සෞන්දර්යාත්මක ආකර්ෂණය සහ කල්පැවැත්ම වැඩිදියුණු කළ හැකි ය. විද්‍යුත් පොත්වල නැඟීමත් සමග මුද්‍රිත පොත්වල දෘශ්‍ය සහ සැලසුම් අංග කෙරෙහි වැඩි අවධානයක් යොමු වී ඇත. මෙයට කැපී පෙනෙන ආවරණ සැලසුම්, නිදර්ශන අවසන් කඩදාසි සහ පොත කලා වස්තුවක් බවට පත් කරන නිර්මාණාත්මක පිරිසැලසුම් ඇතුළත් වේ. සීමිත සංස්කරණ, අත්සන් කරන ලද පිටපත් සහ අද්විතීය විශේෂාංග සහිත පොත් (එම්බෝස් කිරීම, රන් ආලේපිත දාර, ස්ලිප්කේස් වැනි) වඩාත් ජනප්‍රිය වී ඇත. පොත් එකතුකරන්නන් සහ පාඨකයන්ට මෙම පොත් සෑදීමේ කලාත්මක බව අගයක් සපයයි. රූපවල ගුණාත්මකභාවය සහ ඉදිරිපත් කිරීම බොහෝ විට තිරයක් මත ලබා ගත හැකි දේ ඉක්මවා යන බැවින් නිදර්ශන, ඡායාරූප හෝ වෙනත් දෘශ්‍ය අන්තර්ගතවලින් පොහොසත් පොත් මුද්‍රිත ආකාරයෙන් විශේෂයෙන් අගය කරනු ලැබේ. මුද්‍රිත පොත්වල භෞතික ව සහ සංස්කෘතික වැදගත්කම අනුව කල් පවත්නා ගුණයක් ඇත. ඒවා පරම්පරාවෙන් පරම්පරාවට ගෙන යා හැකි අතර විද්‍යුත් පොත්වල නොමැති සදාකාලික හැඟීමක් ඇති කරයි.

විද්‍යුත් පොත්වලට ප්‍රතිනිර්මාණය කළ නොහැකි සංවේදී අත්දැකීමක් මුද්‍රිත පොත් ලබා දෙයි. කඩදාසිවලින් ඇති කරන හැඟීම, පොතේ බර සහ පිටුවල සුවඳ පවා බොහෝ පාඨකයන්ට ප්‍රතිස්ථාපනය කළ නොහැකි අද්විතීය කියවීමේ අත්දැකීමකට දායක වේ. මේ නිසා විද්‍යුත් පොත් ප්‍රකාශන කර්මාන්තයට සහ පුද්ගලයන් කියවන ආකාරය කෙරෙහි ප්‍රබල බලපෑමක් ඇති කරන මුද්‍රිත පොත් වෙළෙඳපොළේ සැලකිය යුතු ස්ථානයක් අඛණ්ඩ ව පවත්වා ගෙන යයි.



# අමරණීය පැරිස් මතක

වර්නන් ගුණසේකර

ප්‍රංශයේ පැරිස් නුවර පැවති 33 වැනි ඔලිම්පික් ක්‍රීඩා උලෙළ අද්විතීය සැණකෙළියක් විය. ඔලිම්පික් ක්‍රීඩා උලෙළ පවත්වන ශෛලියේ විප්ලවීය වෙනසක් සිදුකරන බවට 2024 පැරිස් ඔලිම්පික් උලෙළේ සංවිධායකයෝ වසර ගණනාවක් තිස්සේ නිවේදනය කරමින් සිටියහ. 1900 සහ 1924න් පසුව තෙවැනි වතාවට ප්‍රංශ අගනුවරදී මේ වසරේ පැවති ඔලිම්පික් ක්‍රීඩා උලෙළේදී බොහෝ අමරණීය සිදුවීම් වාර්තා විය.

2024 ඔලිම්පික් සංවිධාන කමිටුවේ සභාපති Tony Estanguet ප්‍රකාශ කළ පරිදි ක්‍රීඩා උලෙළක් නගරයක පැවැත්වීම මේ කාලයේදී වුවමනාවටත් වැඩියෙන් තහවුරු විය. දුනු විදීම, 3x3 බාස්කට්බෝල්, කඩු හරඹ, වෙරළ වොලිබෝල් හා අශ්වාරෝහක ක්‍රීඩා සියල්ල පැවතියේ පැරිස් නගරයේ සංකේතාත්මක ස්ථානවලදී ය.

පැරිස් ඔලිම්පික් ක්‍රීඩා උලෙළේ සාර්ථකත්වය අවධාරණය කෙරුණේ සෙන් ගංගාවේ පැවති සමාරම්භ උත්සවයෙනි. ඔලිම්පික් උලෙළ හොඳ ම ආකාරයෙන් ආරම්භ කිරීමේ අපේක්ෂාවෙන් පැවති සමාරම්භක උත්සවය බෝට්ටුවල නැගී සෙන් ගංගාවේ පෙළපාළියේ යමින් සිටි ක්‍රීඩක ක්‍රීඩිකාවන් මත ඇදහැළුණු අධික වර්ෂාව මධ්‍යයේත් සාර්ථක ව පැවැත්විණි.

තවත් විශේෂත්වයක් වූයේ පැරිස් නගරය හෝ ඒ අවට ප්‍රදේශයට පමණක් තරග පැවැත්වීම සීමා නොවුණු බැවිනි. ඔලිම්පික් ක්‍රීඩා ඉතිහාසයේ ප්‍රථම වතාවට රටක් ම තරගවලට සහභාගි විය. ඔරු පැදීමේ තරග පැවතියේ Marseille නගරයේ ය. ඉලක්කයට වෙඩිතැබීමේ තරග Chateauroux නගරයේ පැවති අතර හැන්ඩ්බෝල් හා බාස්කට්බෝල් තරග පැවැත්වුණේ Lille නගරයේදී ය. සර්ෆිං ඉසව් පැවැත්වුණේ Tahiti දූපතේ ය. පාපන්දු තරග Lyon, Nantes, Bordeaux, Saint-Etienne, Nice, Marseille yd Paris යන නගර අතර බෙදාගෙන තිබිණි.

ඔලිම්පික් ක්‍රීඩා උලෙළේ වඩාත් ම කතාබහට ලක්වූයේ කාන්තා බොක්සිං වළල්ල ය. මේ තරග බිමේදී ඇල්ජීරියාවේ Imane khelif හා තායිවානයේ Lin yu-Ting ක්‍රීඩිකාවෝ ඔවුන්ගේ ස්ත්‍රී-පුරුෂභාවය සම්බන්ධයෙන් මහත් මතභේදයකට ලක්වූහ. මේ දෙදෙනාගේ ශරීරවල පිරිමි ජාන තිබෙන බවට තීරණය කරමින් ජාත්‍යන්තර බොක්සිං සංගමය පසුගිය වසරේ ඔවුන්ගේ ලෝක ශූරතාවලියෙන් මේ දෙදෙනා ඉවත් කර තිබිණි. මේ සංගමයේ මුදල් හා පාලනය විනිවිදභාවයකින් පවත්වාගෙන නොයාම හේතුවෙන් ඔවුන්ට තිබෙන ඔලිම්පික් පිළිගැනීම ජගත් ඔලිම්පික් කමිටුව ඉවත් කර ගැනීම නිසා ඔලිම්පික් බොක්සිං තරග මෙහෙයවීම ජගත් ඔලිම්පික් කමිටුව සිදු කළ අතර ඔවුහු කලීෆ් හා යූ-ටිං ක්‍රීඩිකාවන් දෙදෙනාට ඔලිම්පික් වරම් ලබා දීමට තීරණය කළහ. අවසානයේ මේ ක්‍රීඩිකාවන් දෙදෙනා ම ඔවුන්ගේ බර පංතිවල රන් පදක්කම් දිනා ගැනීමට සමත් වූයේ තත්ත්වය තවත් බරපතළ කරමිනි. විශේෂයෙන් ඉමාන් කලීෆ් තරග කරන ශක්තිමත් ආකාරය දුටු සමහරු ඇය කාන්තා තරගාවලියට ඇතුළත් කිරීම සම්බන්ධයෙන් සමාජ මාධ්‍යයෙන් ප්‍රශ්න කිරීමට පටන් ගැනීමත් සමග මහත් ආන්දෝලනයක් හට ගැනිණි. එහෙත් ජගත් ඔලිම්පික් කමිටුව අවධාරණය කළේ කලීෆ් ගැහැනියක ලෙස උපත ලබා, කාන්තාවක ලෙස ලියාපදිංචි වී, කාන්තාවක ලෙස ජීවත් වෙමින්, කාන්තාවක ලෙස බොක්සිං තරගවල නියැළෙමින්, කාන්තා විදෙස් ගමන් බලපත්‍රයක් සතු ව සිටින බව ය. රන් පදක්කම දිනා ගැනීමෙන් පසුව කලීෆ්, තමාට සමාජ මාධ්‍ය ඔස්සේ හිරිහැර අපහාස කිරීම සම්බන්ධයෙන් නඩු මගට පිවිස සිටින්නී ය.

මතභේදයට ලක්වූ තවත් සිදුවීමක් වූයේ සමාරම්භක උත්සවයයි. සෙන් ගංගාවේ පැවති මේ උත්සවය ප්‍රධාන ක්‍රීඩාංගණයට පිටතින් පැවති ප්‍රථම ඔලිම්පික් සමාරම්භක උලෙළ වශයෙන් ඔලිම්පික් ඉතිහාසයට එක්වූව ද එහි තිබූ 'අවසාන රාත්‍රී භෝජනයේ' හාස්‍යමය අනුකරණයක් ලෙසින් ඇතැම් විවේචකයන් විසින් හඳුන්වනු ලැබූ කාන්තාවන් ලෙස සැරසුණු පිරිමින් ඉදිරිපත් කළ දර්ශනයක් නිසා එම උත්සවය ලොව මතභේදයක් ඇති කළේ ය.



Katie Ledecky


වයින් සෑදීමේ ග්‍රීක දෙවියා වන Dionysus ලෙස පෙනී සිටිමින් ප්‍රංශ විනෝදය සපයන්නකු වන Philippe Katerine ඉදිරිපත් කළ රංගනය ද ප්‍රශ්න සහගතවූවක් බවට පත්වූයේ එය 'අර්ධ-නිරුවත් නිල් මිනිසා' ලෙසින් වේගයෙන් ප්‍රචලිත වීම හේතුවෙනි. ඒ රංගනයේදී Katerine ඇඳුම් රහිත ව සිටින බවට බැලූ බැල්මට පෙනෙන පරිදි හිසේ සිට පාදය දක්වා දිලිසෙන නිල් සායම්වලින් වසාගෙන

මේසයක් මත වැතිරගෙන ගීතයක් ගායනා කළේ ය.

ඔහුගේ මේ දර්ශනය සමාජ මාධ්‍යවල ජනප්‍රිය වී සීඝ්‍රයෙන් පැතිර ගියේ ලෝකයේ මිලියන ගණන් ජනතාව එය නරඹමින් ය. කතෝලික පල්ලිය හා ක්‍රිස්තියානි කණ්ඩායම් එය විවේචනය කිරීමෙන් පසුව ඔලිම්පික් සංවිධායකයෝ එම දර්ශනය සම්බන්ධයෙන් සමාව අයැද සිටියහ.

එදා මෙදාතුර ජිම්නාස්ටික් ක්‍රීඩාවේ වැඩි ම පදක්කම්ලාභියා ලෙස පැරිස් ඔලිම්පික් ක්‍රීඩා උලෙළට පැමිණි ඇමරිකාවේ 'Simone Bile' ඉන් පිට ව ගියේ තවත් ඔලිම්පික් රන් පදක්කම් 3ක් මෙන් ම රිදී පදක්කමක් ද ලබාගෙන ය.

ඇමරිකානු පිහිනුම් ක්‍රීඩිකා Katie Ledecky ඔලිම්පික් ශ්‍රේෂ්ඨයකු ලෙස ඇයට තිබූ උරුමය තවදුරටත් ගෙන යමින් රන් 2ක්, රිදී හා ලෝකඩ 1ක් බැගින් පදක්කම් 4ක් දිනා ගැනීමට සමත් වූවා ය.





Lin yu-Ting



Imane khelif



Leon Marchand

එම ජයග්‍රහණයත් සමග ඇය පදක්කම් 14ක් සතුකර ගෙන මෙතෙක් බිහිවූ වැඩි ම පදක්කම් හිමිකර ගත් ඇමරිකානු ඔලිම්පික් පිහිනුම් ශූරිය බවට ඉතිහාසගත වූයේ 27 වැනි වියෙහි පසුවෙමින් සිටියදී ය.

ඇමරිකානු කෙටි දුර ධාවක 27 හැවිරිදි Noah Lyles නිතර ම සිරස්තල මවන්නකු වන අතර පැරිස් ඔලිම්පික් ක්‍රීඩා උලෙළේදී ද එහි වෙනසක් සිදු නොවිණි. පළමු ව ඔහු ඔලිම්පික් ඉතිහාසයේ මීටර් 100 ඉසව්වේ වඩාත් ම සියුම් ජයග්‍රහණය වාර්තා කරමින් රන් පදක්කම දිනා ගත්තේ ය. ඔහුගේ මේ ජයග්‍රහණයත් සමග මීටර් 100 ඉසව්වේ විසි වසරක් පුරා පැවති ඇමරිකානු රන් පදක්කම් ඉඩෝරය අවසන් විය.

දින කිහිපයකට පසු පැවති Lylesගේ ප්‍රියතම ඉසව්ව වූ මීටර් 200 තරගයේදී ඔහු තෙවැනියා වූයේ විස්මිත අයුරිනි. එහෙත් පසුව දැන ගන්නට ලැබුණේ ඔහු තරග වැදී තිබෙන්නේ කොවිඩ් රෝගය ශරීරගත ව තිබියදී බවයි. තරගයේ අවසන් රේඛාව පසු කිරීමත් සමග ඔහු ධාවන පථයේ බිම දිගා වූයේ අපහසුවෙන් හුස්ම ගනිමිනි. ඔහු ධාවන පථයෙන් ඉවතට ගෙන ගියේ රෝද පුටුවෙනි.

සෙන් ගංගාවේ පිහිනීම එහි ජලයේ අපවිත්‍රකම හේතුවෙන් තහනම් කර දැන් වසර සියයකට වැඩි ය. එම ජලය ඔලිම්පික් පිහිනුම්වලට සුදුසු තත්ත්වයට ගෙන ඒම පිණිස බලධාරීහු අවම වශයෙන් යුරෝ බිලියන 1.4ක් වැය කළහ. එහෙත් සෙන් ජලයේ අපිරිසිදුකම හේතුවෙන් පිරිමි කේවල තුන්ප්‍රයාම තරගයේ පිහිනුම් අදියර දිනකින් කල් දැමීමට සිදුවූ අතර මැරතන් පිහිනුම් හා තුන්ප්‍රයාම ඉසව් සඳහා වූ පුහුණු තරග අහෝසි කිරීමට සිදුවිය.


ඔලිම්පික් සංවිධායකයන් සෙන් ගංගා ජලයේ තත්ත්වය ඉතා හොඳ මට්ටමක තිබෙන බවට කේවල තුන්ප්‍රයාම තරග දින උදේ අවධාරණය කර සිටිය ද මිශ්‍ර සහාය තුන්ප්‍රයාම තරගයෙන් බෙල්ජියම ඉවත් විය. මුලින් පැවැත් වූ තුන්ප්‍රයාම තරගවලින් පසුව බෙල්ජියම හා ස්විට්සර්ලන්තය යන රටවල් දෙකේ ම ක්‍රීඩයන් රෝගාතුර වීම ද විශේෂ සිදුවීමක් විය.

මෙවර ඔලිම්පික් ක්‍රීඩා උලෙළේ වැඩියෙන් ම කැපී පෙනුණු ප්‍රංශ ක්‍රීඩකයකු සිටියා නම් ඒ Leon Marchand ය. පිහිනුම් තටාකයේ තරුවක් බවට පත් වූ මේ 22 හැවිරිදි ක්‍රීඩකයා මීටර් 200 ළය ආර සහ මීටර් 200 සමනල ආර ඉසව් එක ම රාත්‍රියකදී ඔලිම්පික් වාර්තා ද පිහිටුවමින් ජයග්‍රහණය කළේ දශක ගණනාවකට පසුව තනි පිහිනුම් රන් පදක්කම් ද්විත්වයක් දිනා ගත් ප්‍රථම ප්‍රංශ ජාතිකයා බවට ඉතිහාසගත වෙමින් ය. Marchand ඔහුගේ රටේ පැවති ඔලිම්පික් උලෙළේදී රන් පදක්කම් 4ක් දිනා ගැනීමට සමත් විය.

ඇමරිකාව මෙවරත් සමස්ත පදක්කම් සටහනේ මුදුනට පිවිසියේ රන් 40ක්, රිදී 44ක් හා ලෝකඩ 41ක් ඇතුළු ව පදක්කම් 125ක් ලබා ගනිමිනි. චීනය රන් 40ක්, රිදී 27ක් හා ලෝකඩ 24ක් සමග පදක්කම් 91ක් රැස්කර දෙවැනි ස්ථානයට ද ජපානය රන් 20ක්, රිදී 12ක් හා ලෝකඩ 13ක් සමග පදක්කම් 45ක් ලබා තෙවැනි ස්ථානයට ද පත් විය.

# පෙරහැරේ මුද්දරේ

## ලොව දිග ම මුද්දරේ



රංගිකා අබේසේකර




මහනුවර ශ්‍රී දළදා මාලිගාවේ පැවැත්වුණු 1714 වැනි ඓතිහාසික ඇසළ මහා පෙරහැර සංකේතවත් කරමින් ලොව දිග ම සමරු මුද්දරය 2024 අගෝස්තු මස 20 දින නිකුත් කිරීමට ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුව පියවර ගත්තේ ය. මෙම මුද්දරයේ වාණිජ වටිනාකම ශ්‍රී ලංකා රුපියල් 500.00කි. මෙතෙක් ලොව දිග ම මුද්දරය ලෙස සැලකුණේ පිලිපීන තැපැල් සංස්ථාව විසින් නිකුත් කරන ලද මිලිමීටර් 200ක දිගින් සහ පළල මිලිමීටර 35ක් වන මුද්දරයයි. එම වාර්තා බිඳ දමමින් දිගින් මිලිමීටර් 205ක් සහ පළල මිලිමීටර 30ක් වන වර්තමානයේ ලොව දිග ම මුද්දරය දේශීය අනන්‍යතා සහිත සංස්කෘතිකාංග, අලි ඇතුන් ඇතුළත් අභිමානවත් දළදා පෙරහැර අන්තර්ගත වන ලෙස ශ්‍රී ලාංකික ප්‍රෞඪත්වය විදහා දක්වමින් නිර්මාණය කර තිබීම විශේෂත්වයකි.

ලොව පළමු ඇලවුම් තැපැල් මුද්දරය වික්ටෝරියා රැජිණගේ පැතිකඩක් සහිත ව 1840 වසරේදී එක්සත් රාජධානියෙන් නිකුත් කර ඇත. ඊට පසුකලෙක 1857 වසරේදී ශ්‍රී ලංකාවේ ප්‍රථම තැපැල් මුද්දරය පැන්ස 6ක වටිනාකමකින් යුතු ව නිකුත් කෙරිණි.

දෙසතිය පුවත් සඟරාව
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයක්
www.dgi.gov.lk www.news.lk
පුවත් සඟරාවක් ලෙස ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර ඇත
Department of Government Information
news.lk
GFU Sri Lanka
Rs. 100/-